දේශපාලන හයිය අරගෙන වැව් රක්ෂිතයේ හෝටල් හදන මුදාලාලා 26 පිටුව
නැදුන්ගමුවේ රාජාගේ ඇත්ගොව්වා 'කාළුමාමා' කියන කතාව 06 පිටුව

අඛණ්ඩව 15 වසරක් ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම සම්මානය දිනූ ජාතික පුවත්පත ★★★

ඉරිදා ලංකාදීප


55 වැනි කාණ්ඩය | 38 වැනි පත්‍රය | 2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා | විජය ප්‍රකාශනයක් | මිල රුපියල් 100 යි | www.lankadeepa.lk | අද පත්‍රය : කොටස් 07 යි පිටු 176 යි

ලංකාදීපයටම
INSEE සංස්ථා සිමෙන්ති
சங்ஸ்தா சீமெந்து
ගාල්ල | පුත්තලම | කොළඹ



# ඩොලරය රටම ගිනි තියයි

## තෙල්මිල වැඩි කිරීමේ ඉල්ලීම සාකච්ඡා මට්ටමේ



පෙට්‍රල් ලීටරයක් රුපියල් 52.00 කින් හා ඩීසල් ලීටරය රුපියල් 67.00කින් වැඩිකරන ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රජයෙන් ඉල්ලා ඇත.

මෙම ඉල්ලීම සම්බන්ධයෙන් රජය සාකච්ඡා මට්ටමින් සිටින බව දැන ගන්නට ඇත.

## මහ බැංකුවෙන් රජයට නිර්දේශ
# අලුත් සංවර්ධන ව්‍යාපෘති වසරකට නවත්වන්න

(සුජිත් හේවාජුලිගේ)

රටේ අලුතින් ආරම්භ කෙරුණු සංවර්ධන ව්‍යාපෘති වසරක පමණ කාලයකට තාවකාලිකව නවත්වන්නැයි ශ්‍රී ලංකා මහ බැංකුව රජයට නිර්දේශ කර ඇත. එසේම වැඩ ලක්ෂයේ ව්‍යාපෘතියද තාවකාලිකව නවත්වන ලෙස රජයට නිර්දේශ කර තිබේ.

10 පිටුවට

# ඖෂධ මිලත් සියයට 30කින් වැඩිවෙයි


(දයාසිලි ලියනගේ)

ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමත් සමග සියලු ඖෂධ මිල සියයට 30 කින් වැඩිවනු ඇති බවත් බරපතළ ඖෂධ හිඟයකට මුහුණ දීමට සිදුවන බවත් වාර්තා වේ.

10 පිටුවට



## ගෑස් මිල 750කින් නංවන යෝජනා?



(දයාසිලි ලියනගේ)

ජාත්‍යන්තර ගෑස් මිල, නැව් ගාස්තු, රක්ෂණ ගාස්තු, ඩොලරයේ මිල ඉහළ යාම ආදී හේතු මත මෙරට කිලෝ 12.5ක ගෑස් සිලින්ඩරයක මිල අවම වශයෙන් රුපියල් 750කින් වත් වැඩි කිරීමට සිදුවනු ඇතැයි දැනගන්නට ඇත.

මේ වන විට ගෑස් මෙ.ටොන් එකක් ඩොලර් 300 සිට 900 දක්වා ඉහළ ගොස් ඇති අතර නැව් ගාස්තු සියයට 31 කින්ද ඉන්ධන බැරලයක මිල ඇමරිකන් ඩොලර් 112 කින් ද වැඩිවී ඇති නිසා මෙම මිල වැඩිවීම සිදුවිය හැකි බව රජයේ ආරංචි මාර්ග සඳහන් කරයි.

10 පිටුවට



## ගෑස් හිඟයෙන් බෝඩිං කාරයන්ට රෑ බත නෑ

(දයාසිලි ලියනගේ)

ගෑස් හිඟය නිසා නවාතැන්වල රැඳී සිටින බහුතරයක් පිරිසකට රාත්‍රී ආහාර ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත.

මෙතෙක් රාත්‍රියට විවෘතව තිබූ කෑම කඩ සියල්ලක්ම පාහේ මේ දිනවල රාත්‍රියට වසා දැමීම නිසා මේ තත්ත්වය උදාවී තිබේ.

10 පිටුවට



## විමල්-උදය සමග හවුල් පක්ෂ ජන රැලියක

(අජන්ත කුමාර අගලකඩ)

ඇමැතිධුරවලින් ඉවත් කරනු ලැබූ විමල් වීරවංශ, උදය ගම්මන්පිල යන මහත්වරුන්ගේ පක්ෂ ඇතුළුව, ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ එකතුව කොළඹ දී ජනරැලියක් පැවැත්වීමට එම පක්ෂ සැලසුම් කරමින් සිටින බව වාර්තා වේ .

10 පිටුවට

## ශ්‍රීලනිපයට ගහන්න එපා

### ශ්‍රීලනිපය ජනපතිගෙන් ඉල්ලයි

(අජන්ත කුමාර අගලකඩ)

ආණ්ඩුවේ මැති ඇමැතිවරුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමැතිවරුන්ට පහරදීම නතර කරන්නැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලීමක් කර ඇත.

10 පිටුවට

## පාඩුපිට පාඩු ලබන තෙල් සංස්ථා සේවකයන්ට බෝනස් ලබන මාසේ

(දයාසිලි ලියනගේ)

රුපියල් මිලියන 18,845 ක මෙහෙයුම් අලාභයක් ලබන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ලබන මාසයේදී බෝනස් දීමනාව ලබාදීමට තීරණය කර ඇත.

පසුගිය සතියේ රැස්වූ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම තීරණය ගෙන ඇති බව වාර්තාවේ.

10 පිටුවට


## බාල බඩු 112ක් වෙළෙඳ පොළේ තහනමට බලයක් නැතිලු

(සුජිත් හේවාජුලිගේ)

ප්‍රමිතියෙන් තොර බවට තහවුරු වූ ආහාර ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ 112ක් මිනිස් පරිභෝජනය සඳහා වෙළෙඳ පොළට නිකුත් වී තිබිණැයි ජාතික විගණන කාර්යාලයේ විශේෂ වාර්තාවක සඳහන් වේ.

10 පිටුවට

පියල් සමරවීර ගේ ලංකෝනිස්



" ඔය පාර සෑර්ල පිටරට ගියොත් ආපහු මේ රටට එන්න නං බැරිවෙයි "

" ඈ? මොකෝ බං ඒ ? "

" ඇයි, මිනිසුන්ට අත්‍යාවශ්‍ය නොවන දේවල් පිටරට ඉඳලා මේ රටට ගේන්න තහනම් කෙරුවයි කියනවනෙ "

ඔබේ වෙහෙස මහන්සි වී උපයාගත් මුදල් ආයෝජනය කරන්න ස්මාර්ට් ක්‍රමයක්
ASIA SECURITIES MONEY MARKET FUND
7.80%

MOBILE
විඩිත්න රිසිසේ Viber විජ්
ලිමිට් නැතුව නොමිලේ අත්විඳින්න
Viber එකේ chatting, scrolling සමග stickers create කරන්න,
SLT මොබිටෙල් පෙරගෙවුම් - රු.399 සහ පසුගෙවුම් - රු.1,290 සිට ඉහළට ඇති anytime ඩේටා පැකේජ් වෙත පිවිසෙන්න.
වැඩි විස්තර සඳහා, www.mobitel.lk/freeviber වෙත හෝ SLT මොබිටෙල් SelfCare app එකට පිවිසෙන්න. නැත්නම් #170# ඩයල් කරන්න.
TRC කේතය: TRC/M/PRO/21/07 I TRC/M/SEA/21/06
Rakuten Viber
SLTMOBITEL

LB රන් උදානය
අතට සල්ලි, කරට මාල
දෙවන අදියරේ රන් මාල දිනාගත් ජයග්‍රාහකයෝ
මුනිදන් තයාගු - මාතලේ
නයනා දමයන්ති - නෙලුව
රාජා දේවකුමාර් - ග්‍රෑන්ඩ්පාස්
S.A. සමන් පෙරේරා - හොරණ
සලිදීන් නජ්මුල් ෆාවුස් - කල්මුනේ
B.G. චාන්දනී - නාරහේන්පිට
යොහාන් දිනුක ඩයස් - රාගම
ශාලිනි ශියාර්මලන් - වැල්ලවත්ත
අකිලා මධුශානි පෙරේරා - කඳාන
ගෝපාල් පුවනේශ්වරී කමලා - කොටහේන
අලියාර් මොහොමඩ් නසීර් - සමන්තුරේ
මදුශිකා සඳමාලි බස්නායක - මහියංගනය
මහේන්තිරන් මයුදරන් - යාපනය ප්‍රිමියර් ශාඛාව
ලසන්ත නාමල් බණ්ඩාර - මීගමුව නගර ශාඛාව
රොබින්ශාන් සෙරිනිවොන්චියා - යාපනය නගරය ශාඛාව
ඔබත් වැඩි වැඩියෙන් රන් ණය ගනුදෙනු සිදුකර දිනුම් අවස්ථා වැඩි කරගන්න... 0112 200 200
LB FINANCE
WP/GT/5604
www.lbfinance.com



රටේ දැවෙන ප්‍රශ්න අතර ප්‍රධාන වූ ගෑස් ප්‍රශ්නය දැන් තවත් උග්‍ර වී තිබේ. ගෑස් අර්බුදයත් සමඟ බොහෝ ජනතාව දැඩිව පීඩාවට පත්ව සිටිති. මෙම අර්බුදය හමුවේ ඉවුම් පිහුම් කටයුතු ද අඩාළ වී ඇත. ගෑස් අලෙවි කරන වෙළෙඳ සල් බොහෝමයක් වසා දමා ඇති අතර ලියාපදිංචි වූ පිළිවෙළ අනුව ගෑස් බෙදා හැරීම සිදු කෙරේ. ඒත් එය සීමිත ප්‍රමාණයකටය.

දැනට පවතින ගෑස් අර්බුදය පිළිබඳව අපි ගෑස් පෝලිම්වල සිටින ජනතාවගෙන් අදහස් විමසීමක් කළෙමු.

# ආණ්ඩුවේ ගෑස් බල බලා පෝලිමේ කරවෙන ජනතාව කියන කතා

**මම ආපනශාලාවක් පවත්වාගෙන යන්නේ දැන් දවස් 6ක් වෙනවා කඬේ වහලා. ගෑස් නැතිව රුපියල් 5000කට ගෑස් සිලින්ඩරයක් අලෙවි කරන තැන් තිබෙනවා. අපිට 5000ක් දීලා ගෑස් එකක් ගන්න පුළුවන්ද? 5000 ක් ගෑස් එකකට වියදම් කළාම අපි කොහොමද ජීවත් වෙන්නේ**

## කඬේ වහලා දවස් හයයි

**වත්තල පදිංචි නිශාන්ත මහතා**

**අදහස් දක්වමින්**

මම ආපනශාලාවක් පවත්වාගෙන යන්නේ දැන් දවස් 6ක් වෙනවා කඬේ වහලා. ගෑස් නැතිව රුපියල් 5000කට ගෑස් සිලින්ඩරයක් අලෙවි කරන තැන් තිබෙනවා. අපිට 5000ක් දීලා ගෑස් එකක් ගන්න පුළුවන්ද? 5000 ක් ගෑස් එකකට වියදම් කළාම අපි කොහොමද ජීවත් වෙන්නේ. වැඩ කරන සේවකයන්ට වැටුප් ගෙවන්න ඕනෑ. කඩ කුලිය වතුර බිල ලයිට් බිල මේ සියල්ලම ගෙවන්න වෙනවා. ගෑස් නැතිව දවස් 6ක් කඬේ වහලා තිබුණාම කොහොමද අපි ජීවත් වෙන්නේ. දවස ගානේ හම්බ කරන එකෙන් තමයි අපි ජීවත් වෙන්නේ.

දැන් මේ ගෑස් පෝලිමට ඇවිල්ලා පැයකට වැඩියි. තවම ගෑස් දුන්නේ නැහැ. තව තැනක ගෑස් දෙනවා කියලා ආරංචි වුණා. එතනටත් ගියා. ගෑස් ඇණවුම් කරලා තිබෙන්නේ. ඒකට රුපියල් 500ක් වැඩිපුර ගෙවන්න ඕනෑ. ඇනවුම් කරන්න. සිලින්ඩරයක් දීලා රුපියල් 500ක් දීලා තමයි ගෑස් ගන්න ඕනෑ. මීට දවස තුනකට කලින් මෙතනට ආවා. දවස් 6කින් ගෑස් දෙනවා කියලා කීව නිසා මෙතනට ආවේ. ගෑස් ගන්න බොහෝ දෙනෙක් පෝලිමේ ඉන්නවා. බලමු කීයට ද ගෑස් දෙන්නේ කියලා. කීය වෙනකම් හරි ඉඳලා ගෑස් එකක් අරන් යනවා. නැතිනම් කඬේ කරගෙන යන්න බැහැ.

## ජනපතිට ඡන්දේ දුන්නේ මෙහෙම පෝලිමේ ඉන්න නෙවෙයි

**ගෑස් පෝලිමේ දිග වේලාවක්**

**රැඳී සිටි ඩබ්ලිව් ධනුෂ්ක මහතා**

**අදහස් දක්වමින්**

දැන් පෙට්‍රල් ඩීසල් ගෑස් නැතිව සෑම කෙනෙක්ම අසරණ වෙලා ඉන්නේ. අපි ජනාධිපතිරයාගෙන් ඉල්ලන්නේ කඩිනමින් විසඳුමක් දෙන්න කියලා. අපි ජනාධිපතිවරයාට ඡන්දය දීලා ඔය තනතුරට පත් කළේ මෙහෙම පෝලිම්වල ඉන්න නෙවෙයිනේ. මේ පෝලිම්වල ජනතාව රඳවා ගෙන ඉන්නේ නැතිව මේ ප්‍රශ්නවලට කඩිනමින් විසඳුමක් ලබා දෙන්න කියලා තමයි අපි ඉල්ලන්නේ. මේකට හොඳ වැඩ පිළිවෙළක් සකස් කරන්න අවශ්‍යයි. මම ත්‍රීරෝද රථ රියදුරෙක්. දැන් ඒ රැකියාව අද කරගන්න බැහැ. මේ ගෑස් පෝලිමේ ඉන්න නිසා. ගෙදර දවස් 5ක් උයලා නැහැ. කන්න නැහැ. කඩ වහලා. ඒ ප්‍රශ්නවලට කඩිනමින් විසඳුමක් ලබා දෙන්න කියලා තමයි අපි ඉල්ලන්නේ. කියනව නම් කියන්න දේවල් ගොඩක් තිබෙනවා. ඒවා කියන කොට ඇඬෙනවා අපිට. මේ තත්ත්වය උඩ දැන් ජනතාව ගොඩක් අසරණ වෙලා ඉන්නේ. අපි ඉන්ධන පෝලිමේ හිටියා. එක පිරවුම් හලකට ආවා තෙල් ගන්න. විදුලිය කැපුවා පිරවුම් හල් 10ක විතර ගිහින් තමයි තෙල් ගහගත්තේ. අපිත් හයර් දුවලා දවසට 2000ක් සොයා ගන්නේ බොහොම අමාරුවෙන්. දැන් මේ ගෑස් පෝලිමේ අද දවසත් ඉවරයි. දැන් කොහොම ද අපි ජීවත් වෙන්නේ. දැන් මේ යන තත්ත්වයත් එක්ක ජීවත් වෙන්න අමාරුයි. අපි ජනාධිපතිවරයාගෙන් ඉල්ලන්නේ ක්‍රමවත් හොඳ වැඩපිළිවෙළක් හදලා ඉදිරියට යන්න කියලා.

## පැය ගානක් පෝලිම්වල

**කාන්ති මහත්මිය දැක් වූයේ**

**මෙවැනි අදහසකි**

පසුගිය දිනවල ගෑස් පිපිරුවා. දැන් ගෑස් පෝලිම. බොහෝ දෙනෙකු ගෑස් තමා පාවිච්චි කරන්නේ. මෙහෙම පෝලිම්වල ඉන්න කොට කොහොමද අනිත් වැඩ කරගන්නේ. අපි පැය ගණනාවක් පෝලිම්වල. තව කොච්චර වෙලාවක් මේ පෝලිමේ ඉන්න වෙයිද දන්නේ නැහැ.

## අව්වේ කරවෙලා හරි ගෑස් ගන්න එපැයි

**බී. චන්ද්‍රකාන්ති මහත්මිය**

**අදහස් දක්වමින්**

දැන් පැය ගණනාවක් පෝලිමේ ඉඳලා තමයි ගෑස් එකක් ගන්නේ. මොනවා කරන්න ද? පෝලිමේ ඉඳලා ගෑස් එකක් අරගෙන යන්න ඕනෑ. නැතිනම් උයා පිහා ගන්නේ කොහොම ද? දරුවෝ බඩ ගින්නේ දැන් බලන්න මෙතන තිබෙන අව්ව. අව්වේ කරවෙලා හරි ගෑස් එකක් ගන්න ඕනෑ. ගෑස් සිලින්ඩරයක් නියම මිලට අලෙවි කෙරුණා. දැන් නම් නැහැ. මේ පෝලිම්වල ඉඳලා කට්ට කාලා ගෑස් එකක් ගෙනියනවා. ආණ්ඩුව තමයි මේවට වග කියන්න ඕනෑ. ආණ්ඩුවට දෙස් කියලත් බැහැ. නොකියත් බැහැ. මොනව කරන්න ද? එහෙන් විදුලිය නැහැ. වතුර නැහැ. කන්න නැහැ. බඩුමිල ගණන් ඉතින් බලාගෙන ඉන්නවා. මොනවා කරන්න ද? රස්සාවක් කර ගන්න විදිහක් නැහැ. මේ වගේ පෝලිම්වල ඉන්න කොට.

## කෑම ටික හදා ගන්නනේ මේ පෝලිමේ ඉන්නේ

**ගෑස් පෝලිම් පිළිබඳ**

**ගෑස් පෝලිමේ සිට අදහස් පළ කළ**

**චන්ද්‍රිකා මහත්මිය**

මේ ගෑස් ප්‍රශ්නය නිසා අපි අසරණ වෙලා ඉන්නේ. දැන් අපි පෝලිමේ හිටියට පෝලිමෙන් පිට ගෑස් නිකුත් කරනවා. සාධාරණ මිනිහට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ. අපි මේ දුක් විඳලා පෝලිමේ ඉන්නේ කෑම ටිකක් හද ගෙන කාලා ජීවත් වෙන්නනේ.

## පැය දෙකක්ම පෝලිමේ

**සන්ධ්‍යා මහත්මිය**

**අදහස් දක්වමින්**




මම මේ ගෑස් පෝලිමට ඇවිල්ලා දැන් පැය 2කට ආසන්නයි. තවම ගෑස් දෙන්නේ නැහැ.

මට මාස දෙකක බබෙක් ඉන්නවා. එයාව ගෙදර තියලා තමයි මේ පෝලිමට ආවේ. දරුවට වෙලාවට කිරි ටික දී ගන්නත් බැහැ. මේ පෝලිම කීයට ඉවර වෙයිද දන්නේ නැහැ. ගෑස් නැහැ හිඟයි. කන්න බොන්න හද ගන්න විදිහක් නැහැ. අපේ කාලය නිකම්ම මේ පෝලිම්වලට වැය වෙනවා. හැම අතින්ම ප්‍රශ්න. එහෙන් විදුලිය නැහැ. මෙහෙන් ගෑස් නැහැ. මේ හැම ප්‍රශ්නයක්ම අපිට තමයි.

## කවදා විසඳුමක් දෙයි ද?

**මේ පිළිබඳ අදහස් පළ කළ**

**උපතිස්ස මහතා**

මේ ගෑස් අර්බුදය දැන් කාලයක ඉඳලා තිබෙනවා. මේකට කිසිම සහනයක් ලබාදීලා නැහැ. කවද වෙන කොට මේ ප්‍රශ්නයට විසඳුමක් දෙයි ද කියලා සිතා ගන්න බැහැ. දැන් මේ ගෑස් පෝලිමේ කී දෙනෙක් ඉන්නව ද? මේ අයගේ කාලය කොච්චර වටිනව ද? මේක හැමදාම වෙන දෙයක්. අපි ඡන්දය දුන්නා. දැන් අපිම තමයි තැලෙන්නේ. දුප්පත් අපිට තමයි මේ හැම ප්‍රශ්නයක්ම. දැන් අර බලන්න පිට පාරේ ආව සුපිරි වාහනයකට ගෑස් සිලින්ඩර 10ක් හෝ 15ක් පටවා ගත්තා. අපි මේ පෝලිමේ කීදෙනෙක් දුක් විඳිනවාද? දැන් අපි ඡන්දය දීලා ඔවුන්ව පාර්ලිමේන්තුවට යවනවා. පොඩි මිනිහා ගැන ඒ ගොල්ලෝ සිතන්නේ නැහැ. ධනවත් අයට මේ ප්‍රශ්න නැහැ. දුප්පත් අපි වගේ අයට තමයි මේ සියලුම ප්‍රශ්න.

## අපි ණයට ද ගෑස් ගත්තේ? නෑනේ

**ගෑස් අර්බුදය පිළිබඳ**

**අදහස් පළ කළ නිහාල් මහතා**

මේ ගෑස් අර්බුදයට හේතුව ඩොලර් නැහැ කියලනේ ඒ ගොල්ලෝ කියන්නේ. දැන් අපි නිකන් ද මේ ගොල්ලන්ගෙන් කාලයක ඉඳලා ගෑස් ගන්නේ. ණයට ද ගෑස් ගන්නේ ? සල්ලි දීලා ගෑස් ගන්නේ. එතකොට කා ගාව ද සල්ලි නැහැ කියන්නේ. ඒකයි අපි අහන්නේ. ඉන්ධන අපිට ණයට දෙනවද? ඔය මැති ඇමති ගොල්ලෝ ළඟ තිබෙන සල්ලි ටික එළියට දැම්ම නම් හරි. හංගගෙන ඉන්න ටික. ඒ ගොල්ලෝ ගාව හංගගෙන ඉන්න සල්ලි ටික එළියට දන්න. මාධ්‍ය මගින් දැනුම් දෙන්න. මට මතකයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබෙන කොට ඒ ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙක් ප්‍රකාශ කළා ඔහුගේ වත්කම මිලියන 10ක් වගේ කියලා. එතකොට අනිත් අය ළඟ කොපමණ ඇත්ද? ඒවා එළියට දලා මේ රටේ අහිංසක ජනතාවට උදව් කරන්න කියන්න. බොරු බයිලා කියන්නෙ නැතුව.

සටහන
**නිශාන්ත කුමාර බණ්ඩාර,**
ඡායාරූප - හිමත් මතීශ






අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02
කර්තෘ මණ්ඩලය: 2347248, 2479479 ෆැක්ස්: 2314886
දැන්වීම්: 2479540, 5383383, 5330330, ෆැක්ස්: 2314864, 2304144
බෙදාහැරීම්: 2435454, 2448322, 2479625 ෆැක්ස්: 2459725
පොදු: 2314714 - 2479479


# මැති ඇමැති සැප අඩුකර සැබෑ ආදර්ශයක් දෙන්න

පසුගිය බ්‍රහස්පතින්දත් තවත් රාජ්‍ය ඇමැතිවරයෙක් දිවුරුම් දුන්නේය. ඊට පෙරදත් කිහිප දෙනෙක්ම රාජ්‍ය ඇමැතිවරු ලෙස දිවුරුම් දුන්හ. ආණ්ඩුව බලයට පත්වී වසර දෙකකි. එහෙත් තවමත් දිවුරුම් දීම් අවසන් නැත. මේ දිවුරුම් දීම් කරන්නේ රටේ ප්‍රශ්න විසඳීමට ඇති ඒකාන්ත විසඳුම ලෙස නම්, එසේ දිවුරුම් දීම ප්‍රශ්නයක් නැත. එහෙත් මේ දිවුරුම් දීම් සිදුවන්නේ අභ්‍යන්තර ප්‍රශ්නවලට විසඳුමක් වශයෙනි. ගමේ ගොඩේ මිනිස්සු කියන විදියට ''මණ්ඩලේ කචල්'' විසඳ ගැනීමටයි.

රටේ ජනයා වැටී ඇත්තේ හද්ද අමාරුවකය. දැන් යළිත් ගෑස් පෝලිම්ය. වරු ගණන් පෝලිමේ සිටියත් ගෑස් නොමැතිව හිස් අතින් යෑමට ජනතාවට සිදුවී තිබේ. නගරයකට ගෑස් රැගෙන ලොරියක් පැමිණිවිට රතිඤ්ඤා දල්වා එය පිළිගත් වීඩියෝවක් මේ දිනවල සමාජ මාධ්‍ය ජාලාවල සැරිසරයි. දුක් විඳින ජනයා තම වේදනාව ප්‍රකාශයට පත් කරන්නේ එසේය. 5 වැනිදයින් පසුව විදුලිය විසන්ධි නොකරන බව කීවද මෙම සටහන තබන 11 වැනිදත් විදුලිය විසන්ධි කර ඇත. ජාතික ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර සිටියේ ''මේක රීලෝඩ් ආණ්ඩුවක්'' බවය. ප්‍රශ්නයෙන් ප්‍රශ්නයට දවසෙන් දවස උත්තර හොයන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත්වී තිබේ. රාජ්‍ය පාලනය යනු මෙය නොවන බව නම් ඒකාන්ත සත්‍යයකි.

එක අතකින් රුපියල පා කර තිබේ. ජනයානම් කියන්නේ රුපියල ''පා'' කර නොව ''එපා'' කර ඇති බවයි. බඩු මිල ටැක්සි මීටරය මෙනි. මිනිසුන්ට දුෂ්කර ක්‍රියා කිරීමට සිදු වී තිබේ. ඔවුන් විඳින්නේ අපා දුකකි. එක අතකින් මෙසේ අපා දුක් විඳ විඳ ජීවත් වී තේරුමක් නැත. අනෙක් අතට අපා දුක් විඳීමේ ඉරණම බාරගත යුතු ද නැත.

ජනයා කෙතරම් අපා දුක් විඳිමින් නිරයක පැසවුවද පෙර දැක්වූ පැටව් ගසන හා පැටව් ගැසූ මැති ඇමැතිවරුන්ට ඒ කිසිදු දුකක් නැත. ඔවුන්ට මන්ත්‍රී වරප්‍රසාද තිබේ. මිදුල අතුගෑම, වළං පිඟන් සේදීමේ සිට ආරක්ෂාව සැපයීම දක්වා රාජකාරී කිරීමට නිල ආරක්ෂකයෝ සිටිති. මෙරට නොමැති දෙයක් පරසක්වලින් හෝ ගෙන්වා ගැනීමට මහජන මුදල් තිබේ. සාමාන්‍ය ජනයාට මෙන් මෙම මැති ඇමැතිවරුන්ට විදුලිය බිල, ජල බිල ගෙවීමට ද අවශ්‍ය නැත. හිඟ මුදල් රුපියල් කෝටි ගණනක් වුවද විදුලිය විසන්ධි වන්නේ ද නැත. මැති ඇමැතිවරුන්ට ඉන්ධන දීමනා මෙන්ම දුරකතන දීමනාද ගෙවනු ලබයි. තවත් වරප්‍රසාද බොහෝය. කෙටියෙන්ම ලියන්නේනම් සාමාන්‍ය ජනයාට ගෙවීමට සිදුවන කිසිදු බිලක් මේ මැති ඇමැතිවරුන්ට නැත. බඩකට පුරා කා බී සතුටෙන් ප්‍රීතියෙන් කල් ගෙවීමේ පරම සුන්දර භාග්‍යය ඔවුන් සතුය.

මෙරට ජනයාට අත්විඳීමට සිදුවී තිබෙන්නේ අරුම පුදුම අත්දැකීම්ය. මහ රෑ නිදාගෙන පසුදා අලුයම අවදි වී බලනවිට ඉන්ධන මිල ඉහළ ගොස්ය. එතැන් පටන් කැරකෙන විෂම චක්‍රය ඉතා පැහැදිලිය. ලූණු බිකේ සිට සියල්ලම ගණන් යයි. බස් ගාස්තුවේ සිට සියල්ලම ඉහළ යයි. ඊයේ කෑවේ දෙවේලක් නම් හෙට සිට කෑමට වන්නේ එක වේලකි. ඇතැම් පවුල්වලට එය ද ප්‍රශ්නයකි. මෙරට ජනයාට ''ජීවිතය'' ලෙස බාර ගැනීමට සිදුවී තිබෙන්නේ මෙම ඉරණමය.

මේ මොහොතේ සුරසැප විඳින දේශපාලකයන් කළ යුත්තේ කුමක්ද? මේ සම්බන්ධයෙන් මසුරන් කතාවක් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන කර තිබිණි. ඔහු කියා තිබුණේ ''මේ මොහොතේ කැබිනට්ටුව අඩු කළ යුතු බවය. වරප්‍රසාද හා අනෙකුත් දීමනා නතර කළ යුතු'' බවය. එසේ කර මේ මොහොතේ ජනතාවට ආදර්ශයක් සැපයිය යුතු බවය. හිටපු ජනාධිපතිවරයාගේ ප්‍රකාශ සම්බන්ධයෙන් විවිධ මත තිබුණ ද මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් විවාදයක් නැත.

සැබැවින්ම මේ මොහොතේ රටට අවශ්‍යවන්නේ බලගතු ආදර්ශයන්ය. පළමුව නාස්තිය දූෂණය හා හොරකම නතර කළ යුතුය. දෙවැනුව අනවශ්‍ය වියදම් කපාහැරිය යුතුය. තෙවැනුව වියදම් සීමා කළ යුතුය. ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කළ යුතුය. මේතරම් විශාල කැබිනෙට්ටුවක් හෝ රාජ්‍ය ඇමැති රොත්තක් අවශ්‍ය නැත. භාරකාර ආණ්ඩුවක අමාත්‍ය ධුර සංඛ්‍යාවට සමාන අමාත්‍ය මණ්ඩලයක් පත් කළ යුතුය. රාජ්‍ය ඇමැති රොත්තම ගෙදර යැවිය යුතුය.

මේවා අප ලියන්නේ ද්වේෂයෙන් නොවේ. ජනාධිපතිවරයා සර්ව පාක්ෂික සමුළුවක් කැඳවා තිබේ. දැනට වාර්තා වන අන්දමට එය ලබන 23 වැනිදට යොදාගෙන තිබේ. එබඳු සමුළුවක වැදගත්කමත් අවශ්‍යතාවත් කෙතරම් ගැඹුරින් තේරුම් ගෙන තිබෙන්නේද යන්න එතරම් ඈත දිනයක් යොදා ගැනීමෙන් පැහැදිලි වේ. සැබැවින්ම එය අත්‍යවශ්‍ය සමුළුවකි. එමෙන්ම හදිසි කටයුත්තක් සේ සලකා ක්‍රියාත්මක කළ යුත්තකි. එහෙත් අප රට යනු සංහාරයෙන් පසුව සංරක්ෂණය පිළිබඳව කටමැත දෙඩවීම ජාතික සිරිතක් ලෙස ප්‍රගුණ කරන රටකි. ''වළක වැටීම මොළයට ලාභයක්'' යැයි කීවද මෙරටේ සිදුවන්නේ රෑ වැටුණු වළේ මහ දවාලෙත් ඇද වැටීමය. රට මේ විපත්තිදායක නරා වළට වැටී තිබෙන්නේ එහෙයිනි.

ඇතැම් ප්‍රශ්න කාලය විසින් විසඳනු ලබන බව සත්‍යයකි. එහෙත් මේ ප්‍රශ්න කාලයට විසඳිය නොහැක. එමෙන්ම ප්‍රශ්න විසඳීමට කාලය ගැනීම ප්‍රශ්න තව තවත් උග්‍ර කරවන්නකි. රට එබඳු උගුලක සිරකරවීමට කිසිවකුට අයිතියක් නැත.

# පෙරැළි සමග ආණ්ඩුවේ අනාගතය



# මහින්ද ජනාධිපති වෙලා හිටියානම් මේ ගැටුම එළියට එන්නේ නෑ

## වත්මන් දේශපාලන තත්ත්වය ගැන දේශපාලන විචාරක කුසල් පෙරේරා මහතා සමග කළ සාකච්ඡාවකි.

**ප්‍රශ්නය:- අර්බුද නැති ක්ෂේත්‍රයක් සොයා ගත නොහැකි තරමට රටේ ප්‍රශ්න මතු වෙලා. මේ අර්බුද තේරුම් ගෙන ආණ්ඩුව කටයුතු කරන බවක් ඔබ දකිනවද?**


**පිළිතුර:-** ආණ්ඩුවයි විපක්ෂයයි මේ රටේ අර්බුද තේරුම් ගන්න විදියෙ වෙනසක් මට පේන්න නෑ. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල හා ඖෂධවල හිඟයක් වගේම මිල ඉහළ යෑමකුත් වෙලා තියෙනවා. ගත වූ අවුරුද්දක කාලය ඇතුළත පාරිභෝගික භාණ්ඩවල මිල සියයට 24 න් විතර වැඩි වෙලා තියෙනවා. මේක නෙවෙයි ඇත්ත අර්බුදය. ඇත්ත අර්බුදය තියෙන්නෙ අපේ විදේශ විනිමය සංචිත ඩොලර් බිලියන 1.3 ක් තරම් අඩු අගයකට පහත වැටීමත් එක්ක අවශ්‍ය ආනයන සිදු කළ නොහැකි වීම හා විදේශ ණය ගෙවිය නොහැකි වීම ඇතුළෙ. ඒවට අවශ්‍ය ඩොලර් හොයා ගන්න බැරි වෙලා තියෙනවා. මේ සියලු ප්‍රශ්න මතු වෙලා තියෙන්නෙ ඒ ප්‍රධාන අර්බුදයත් එක්ක. ඒකෙ ප්‍රතිඵලයක් හැටියට තමයි විදුලිය කප්පාදු කිරීම ගෑස් හිඟය, ඉන්ධන හිඟය මේ ආදී සියලු ප්‍රශ්න ඇති වෙලා තියෙන්නෙ.

**ප්‍රශ්නය:- රාජ්‍යයන්වල මේ වගේ අර්බුද ඇති වූ විට සාමාන්‍යයෙන් සිදු වෙන දෙය තමයි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවලට යන එක. ඒත් අපි තවම මේ ආණ්ඩුවෙන් එවැනි තත්ත්වයක් දැක්කෙ නෑ. ඒ වෙනුවට මැති ඇමැතිවරුන්ගේ ධුර වෙනස් කරමින් දේශපාලනික ක්‍රියාමාර්ග ගන්න ස්වභාවයක් පෙනෙන්න තියෙනවා. ඔබ මේ තත්ත්වය තේරුම් ගන්නෙ කොහොමද?**

**පිළිතුර:-** ඒක වෙනම කතාවක්. ඒවා ආණ්ඩුව ඇතුළෙ තියෙන දේශපාලන හා පුද්ගල මත ගැටුම්. රටේ අර්බුදය ඒක නෙවෙයි. රටේ මතු වෙලා තියෙන අර්බුදත් එක්ක මිනිස්සුන්ට ප්‍රශ්න ගණනාවකට මූණ දෙන්න වෙලා තියෙනවා. සාමාන්‍ය මිනිස්සුත් එක්ක ගනුදෙනු කරන මන්ත්‍රීවරුන්ට ඇමතිවරුන්ට මේ තත්ත්වය බලපානවා. මේ ආණ්ඩුව තවදුරටත් ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය ජන පදනම දුර්වල වීම සම්බන්ධ ගැටලුවක් තමයි විමල්ලට ගම්මන්පිලලට තිබුණෙ. ජනතාවට බරක් පටවන්නෙ නැති පාලනයකට ආණ්ඩුව තල්ලු කරගන්නයි ඒ අය උත්සාහ කළේ. ඒකෙදි ඒගොල්ලො ප්‍රශ්නය හැටියට දැක්කෙ බැසිල් රාජපක්ෂව. ඒ අය හිතන්නෙ මේ ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නෙ බැසිල් රාජපක්ෂ නිසා කියලයි.

**ප්‍රශ්නය:- ඒක එහෙම නෙවෙයිද?**

**පිළිතුර:-** නෑ. මේ අර්බුදය බැසිල්ගෙයි මුදල් අමාත්‍යාංශයෙයි අර්බුදයක් නෙවෙයි. බැසිල්ව ගෙන්නන්නෙත් මේ අර්බුදයට මුහුණ දෙන්නනෙ. ඒත් මේ අර්බුදය සැලසුම් නොමැතිකමින් අවුරුදු ගණනාවක් තිස්සෙ මෝරමින් ඉදිරියට ආපු එකක්. ඒකෙදි ගම්මන්පිලටයි විමල්ටයි වාසුටයි තිබුණෙ බැසිල් විරෝධී ජනප්‍රිය විරෝධයක්. ඒ අය කියන්නෙ බැසිල් ඇමරිකන්කාරයෙක්. එයාට මේක හදන්න බෑ කියල. විමල්ටයි ගම්මන්පිලටයි කලින් ඉඳන්ම බැසිල් එක්ක ආරවුලක් තිබුණා. බැසිල්ව දලා පොදු ජන පෙරමුණ හදනවටත් ඒ දෙන්න විරුද්ධ වුණා. ඒ නිසාම 2018 දි තිබුණු පළාත් පාලන ආයතන මැතිවරණ ව්‍යාපාරයටවත් ඒ දෙන්නව බැසිල් ගත්තෙ නෑ. මෙතන ඇත්තටම තිබුණෙ පුද්ගල ගැටුමක්. බැසිල් එක්ක ප්‍රශ්නයක් තිබුණා කියලා මේ දෙන්නා කුමාර වෙල්ගම වගේ ආණ්ඩුවෙන් එළියට ගියෙ නෑ. ඇමති ධුරවලින් අයින් කළත් තවමත් ආණ්ඩුව ඇතුළෙ ඉන්නවනෙ. ආණ්ඩුව තවදුරටත් මහජන විරෝධයට ලක් නොවී ඉස්සරහට නඩත්තු කරගෙන යන්නෙ කොහොමද කියන ප්‍රශ්නය තමයි මේ දෙන්නට තියෙන්නෙ. ඒත් ඒක කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. ඒ නිසාම තමයි මේ අය මුල් වෙලා ''හරි මග'' කියලා යෝජනා මාලාවකුත් හැදුවෙ.



ප්‍රවීණ දේශපාලන විචාරක කුසල් පෙරේරාගේ විග්‍රහයක්

**ප්‍රශ්නය:- ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ 11 ක් සහභාගී වූ ඒ සමුළුව වෙනම දේශපාලන ගමනක නිමිත්තක් කියලා ඔබ හිතනවද?**

**පිළිතුර:-** ඒක ඇතුළෙ එහෙම දෙයක් නෑ. හරි මග පූර්විකාවෙ සඳහන් කරලා තියෙන කරුණුවලට මමත් එකඟයි. මොකද ඒකෙ තියෙනවා පහුගිය අවුරුදු 40 ක කාලය ඇතුළත මේ අර්බුද උත්සන්න වූ විදිය ගැන. විවෘත ආර්ථික වෙළෙඳපොළ ගැන ප්‍රවේශමෙන් කරන විවේචනයක් එතන තියෙනවා. විවේචනයක් විතරයි තියෙන්නෙ. අර්බුදය විසඳන්න පුළුවන් විකල්ප වැඩපිළිවෙළකුත් නෑ මේ අයට.

**ප්‍රශ්නය:- විමල් වීරවංශ හා උදය ගම්මන්පිල මහින්ද රාජපක්ෂ යළි බලයට ගෙනාපු මහින්ද සුළඟ ව්‍යාපාරයේ ඉදිරියෙන්ම හිටපු දෙදෙනෙක්. ඔවුන්ව ඇමති ධුරවලින් ඉවත් කිරීම හුදු ඇමතිවරුන් දෙදෙනෙක් ඉවත් කිරීමේ සිදුවීමකට ලඝු කරන්න පුළුවන්ද? නැතිනම් එය රාජපක්ෂ දේශපාලන කඳවුරේ ඇති වූ බිඳවැටීමක්ද?**

**පිළිතුර:-** 2015 ජනාධිපතිවරණයෙන් මහින්ද පැරදුණාට පස්සෙ බැසිල් රට හැර දලා ගියා. නැවතත් දේශපාලන කටයුතු පටන් ගන්නෙ කොහොමද කියන එක ගැන මහින්දටත් නිනව්වක් තිබුණෙ නෑ. මහින්ද සුළඟ කියලා නුගේගොඩ රැස්වීමෙන් ඒකට ආරම්භය දුන්නෙ ගම්මන්පිලයි වීරවංශයි දෙන්නා. ඒ ගැන ගිය අවුරුද්දෙ මහින්ද මතක් කරලත් තිබුණා. පැරදිච්ච කාලේ අපි ළඟ හිටපු අයට සැලකිය යුතුයි කියලා මහින්ද කිව්වා. ඒත් ප්‍රශ්නය තියෙන්නෙ මේ ආණ්ඩුව මහින්දගෙ ආණ්ඩුවක් නෙවෙයි. මේකට රාජපක්ෂලගෙ ආණ්ඩුව කියලා කියන්නෙ මහින්දගෙ ඡන්ද ටික ඕන නිසා. මහින්ද ජනාධිපති වෙලා හිටියා නම් මේ ගැටුම එළියට ගන්නෙ නෑ.

**ප්‍රශ්නය:- ආණ්ඩුව ඇතුළෙ දේශපාලනමය වශයෙන් ප්‍රබල විරසකයන් රාජපක්ෂ සහෝදරයන් තිදෙනා අතර තිබෙන බවක් ඔබ දකිනවද?**

**පිළිතුර:-** මහින්ද රාජපක්ෂට කලින් තිබුණ හයිය දැන් නෑ. ආණ්ඩුවක් ගෙනි යන්න තරම් සක්‍රීය තත්ත්වයක එයා නෑ. වයස හා සෞඛ්‍ය තත්ත්වය එක්ක එවැනි හැකියාවක් දැන් එයාට නෑ. ඒක පැහැදිලියි. එයාට ඡන්ද පදනමක් තියෙනවා කියන විශ්වාසය උඩ තවමත් එයාගෙ නම පාවිච්චි කරනවා.

**ප්‍රශ්නය:- එවැනි තත්ත්වයක රාජපක්ෂ කඳවුරේ ඉදිරි දේශපාලනයට කුමක් විය හැකියි කියා ඔබ හිතනවද?**

**පිළිතුර:-** රාජපක්ෂ යුගය ඉවරයි. ඒ වෙනුවට වෙනත් බල කඳවුරක් හදගන්න ඕන. පේන විදියට හිටපු හමුදා ප්‍රධානීන් සමග ගෝඨාභය රාජපක්ෂ තමයි මීළඟ බල කඳවුර හදන්නෙ.


### මේ ආණ්ඩුව මහින්දගෙ ආණ්ඩුවක් නෙවෙයි

### මේ අර්බුදය බැසිල්ගෙයි මුදල් අමාත්‍යාංශයෙයි අර්බුදයක් නෙවෙයි

### විමල්ටයි ගම්මන්පිලටයි කලින් ඉඳලම බැසිල් එක්ක ආරවුලක් තිබුණා

### රාජපක්ෂ යුගය ඉවරයි

සාකච්ඡා කළේ
**උපුල් වික්‍රමසිංහ**




### ඉරිදා කවිය _ හලලිය

තෙල් නැත බෙහෙත් නැත කන බොන දෙය ද නැත
නැති බැරිකම වෙලාගෙන රට හතර අත
පාලකයෝ සැපෙති ලැබූ ජනවරම මත
ඒ ජනවරම දුන් අය ගැන මතක නැත

# හවුල් පක්ෂ නැතිව ශ්‍රීලනිපය ජනපති ළඟ

**දේශපාලන මෙන්ම, ආර්ථික අර්බුද රැසක් හේතුවෙන් ඉකුත් සතියේ දේශපාලන කරළිය ආන්දෝලනාත්මක විය. විමල් වීරවංශ, උදය ගම්මන්පිල යන මහත්වරුන් ඇමැතිධුරවලින් ඉවත් කිරීමත් සමඟ ඔවුන් ආණ්ඩුව දිගින් දිගටම විවේචනය කරන්නට ද පටන් ගෙන ඇත. ඒ අතර, වසර දෙකක් පමණ තිස්සේ තද කරගෙන සිටි රුපියල ගිය සතියේ පා කරන්නට තීරණය කිරීමත් සමග රුපියල විශාල වශයෙන් බාල්දු වූ අතර, එය ආර්ථිකය දැඩි අර්බුදයකට ලක් කරමින් තිබේ.**

## ජනපති ශ්‍රීලනිප හමුව


දේශපාලන අර්බුදකාරී තත්ත්වය හමුවේ ගිය සතියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හමුවිය. ඒ ජනාධිපතිවරයා විසින් කරන ලද ආරාධනයකට අනුවය. මේ හමුව සඳහා ඇරයුම ලැබුණේද අරුමපුදුම ආකාරයකටය. ආණ්ඩුවෙන් ඉවත් කරනු ලැබූ විමල් වීරවංශ, උදය ගම්මන්පිල ඇතුළු පක්ෂ 11 ක නායකයන් ඉකුත් සතියේ සිකුරාද දහවල් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී මාධ්‍ය හමුවක් කැඳවා තිබිණි. ඊට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් සහභාගී වූයේ පළාත් සභාවේ හිටපු ඇමැතිවරුන් දෙදෙනකුය. ඒ හෙක්ටර් බෙත්මගේ සහ ගාමිණී තිලකසිරි ය. ශ්‍රීලනිපයේ ජොෂ්ඨයන් කිසිවකුත් ඒ සඳහා සහභාගී නොවූ අතර, මාධ්‍ය හමුව යන අතරවාරයේදී ජනාධිපති කාර්යාලයෙන් ශ්‍රීලනිප මහ ලේකම් දයාසිරි ජයසේකර ට දුරකථන ඇමතුමක් ලැබිණි. ඒ ජනාධිපති පෞද්ගලික ලේකම් සුගීෂ්වර බණ්ඩාර ගෙනි. ඔහු සඳහන් කර තිබුණේ ශ්‍රීලනිපය විසින් ඉදිරිපත් කරන ලද කරුණු 15 කින් යුත් යෝජනාවලිය ගැන සාකච්ඡා කරන්නට ජනාධිපතිතුමා දිනයක් ලබා දී ඇති බවය. ඒ අනුව අඟහරුවාද හවස හතරට ජනාධිපති කාර්යාලට එන්නැයි ඔහු ශ්‍රීලනිපයට දැනුම් දුන්නේය.


පණිවිඩය ලැබෙන විට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සිටියේ ගාල්ල ප්‍රදේශයේ මගුල් ගෙදරකට සහභාගී වෙලා ය. සුගීෂ්වර බණ්ඩාර සවස 2ට පමණ මෛත්‍රීට ද කතා කර ජනාධිපතිතුමාගේ පණිවුඩය දැනුම් දුන්නේය. ඔහු කොළඹ පැමිණ මේ පිළිබඳව පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම සමග සාකච්ඡා කළ අතර, ඔවුන් කීවේ සාකච්ඡාවට යාමට පෙර හවුල් පක්ෂ 10 සමඟ ද මේ පිළිබඳව සාකච්ඡා කළ යුතුව ඇති බවය.

ඒ අනුව හවුල් පක්ෂවල නායකයෝ සෙනසුරාද හැන්දෑවේ ටිරාන් අලස් මන්ත්‍රීවරයාගේ කාර්යාලයේ දී හමුවූහ. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, පක්ෂයේ මහ ලේකම් දයාසිරි ජයසේකර, වාසුදේව නානායක්කාර, විමල් වීරවංශ, උදය ගම්මන්පිල, ටිරාන් අලස්, ගෙවිඳු කුමාරතුංග, ඩීව් ගුණසේකර, මහාචාර්ය තිස්ස විතාරණ, විශේෂඥ වෛද්‍ය ජී. වීරසිංහ මෙන්ම අතුරලියේ රතන හිමියෝ ද ඊට සහභාගි වූහ. මේ හමුව කැඳවා තිබුණේ ශ්‍රීලනිපය ජනාධිපතිවරයා හමු වීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමටය. එහිදී සමහරුන් කීවේ ශ්‍රීලනිපය අනෙකුත් පක්ෂ සමග ඇතිව තිබෙන එකතුව කඩන උපක්‍රමයක් බව ය. ජනාධිපතිවරයාගේ කැඳවීමට එකඟතාව පළ කර, ඊට සහභාගි වන්නැයි අනෙක් පක්ෂ නායකයෝ කියා සිටියහ. ශ්‍රීලනිප නායකයින් කීවේ ජනාධිපතිවරයා හමුවී කරන සාකච්ඡාවෙන් අනතුරුව හවුල් පක්ෂ නැවත දැනුවත් කරන බවය.

ජනාධිපතිවරයා හමුවන්නට යාමට පෙර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම සඳුද හැන්දෑවේ දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයාගේ නිල නිවසේ දී රැස්විය. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට රූපවාහිනී සංවාදයකට සහභාගී වීමට යාමට තිබූ නිසා ඔහු එම රැස්වීමට සහභාගී නොවූ අතර, අනෙකුත් මන්ත්‍රීවරු ඊට සහභාගී වූහ. ජනාධිපතිවරයා සමග පැවැත්වෙන සාකච්ඡාවේ ඉදිරිපත් කරන කරුණු සම්බන්ධයෙන් එහිදී සාකච්ඡා වූ අතර, පසුවද හවස එකට හිටපු ජනාධිපතිවරයාගේ නිවසේ දී නැවත හමුවී ඒගැන සාකච්ඡා කරන්නට ද තීරණය විය. ඒ අනුව ශ්‍රී ලනිප මන්ත්‍රී කණ්ඩායම ජනාධිපතිවරයා හමුවීමට යාමට පෙර එදින සවස 1.00ට මහගම සේකර මාවතේ නිවසට ගොස් මෛත්‍රී හමුවිය. ශ්‍රීලනිපයේ ද ඇතැමුන්ගේ අදහස වූයේ හවුල් පක්ෂ සමග ඇතිව තිබෙන එකඟතාව ඇත් කිරීමට මේ හමුව ලබා දී ඇති බවය. එසේ වුවද ඊට සහභාගි විය යුතු බව ඔවුන් සියලු දෙනාගේ අදහස විය.

ඒ අනුව ශ්‍රීලනිප මන්ත්‍රී කණ්ඩායම එදින සවස 4 ට ජනාධිපති කාර්යාලට ගොස් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හමුවිය. ජනාධිපතිවරයාගේ පාර්ශ්වයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතාද, බැසිල් රාජපක්ෂ සහ දිනේෂ් ගුණවර්ධන යන ඇමැතිවරු ද, සාගර කාරියවසම් මන්ත්‍රීවරයාද සහභාගි වූහ. සාකච්ඡාව සවස 4.00 ට යොදගෙන තිබුණත් 03:30 වන විට ජනාධිපති කාර්යාලයට පැමිණෙන්නැයි දැනුම් දී තිබුණේ ඔවුන් සියලු දෙනා ඇන්ටිජන් පරීක්ෂණයකට ලක් කළ යුතුව ඇති බැවිනි. සාකච්ඡාව සවස හතරයි කාලට පමණ ආරම්භ වූ අතර, ජනාධිපතිවරයා විනාඩි හතළිස් දෙකක් තිස්සේ, රටේ වත්මන් තත්ත්වය සහ ආර්ථික අර්බුදය ආදී කරුණු සම්බන්ධයෙන් දිග විස්තරයක් කළේය. පසුගිය කාලයේ පුරා කරන ලද වැඩකොටස් ගැන ද ජනාධිපතිවරයා කීය. අනතුරුව මෛත්‍රීපාල සිරිසේන මහතා ද විනාඩි විස්සක පමණ පැහැදිලි කිරීමක් කළේය. ඔහු කීවේ රටේ ඇති අර්බුදයට රජයේ අවධානය යොමු කිරීමේ දී සීමිත පිරිසකගේ අදහස් අනුව වැඩ කිරීම නිසා ගැටලු පැනනැගුණු බවය. පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ එක් කරමින් සර්වපාක්ෂික සමුළුවක් කැඳවා අදහස් ලබා ගන්නැයි ද මෛත්‍රී ඉල්ලීමක් කළේය. ජනාධිපතිවරයා ඊට එකඟතාව පළ කළ අතර, එය අප්‍රේල් මාසයේ දී පමණ කැඳවිය හැකි බව කීවේය. ශ්‍රීලනිපයේ අදහස වූයේ එය අද හෙටම කළ යුතු බවය. ඒ අනුව ලබන 23 වැනිදා එම සාකච්ඡා පවත්වන්නට තීරණය වූ අතර, රංජිත් සියඹලාපිටිය ඇමතිවරයා ආර්ථිකය සම්බන්ධයෙන් පක්ෂයේ වැඩපිළිවෙළ ගැන පැහැදිලි කිරීමක් කළේය. ඔහු කියා සිටියේ මේ මොහොතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යාම වැදගත් බවය. 2009 වර්ෂයේදී කොන්දේසි විරහිතව මූල්‍ය අරමුදලෙන් ලබාගත් ණය මුදල නිසා ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට හැකි වූ බව ඔහු කියද්දී, ජනපති හා අගමැතිගේ පැසසුමට එම ප්‍රකාශය ලක්විය. මේ කතාබහ යන අතරේ චාමර සම්පත් දසනායක මන්ත්‍රීවරයා අපූරු කතාවක් කීවේය. සර් මේ මොනවා කිව්වත් ආණ්ඩුව අපට ගහනවා. මමත් පහුගිය කාලේ ආණ්ඩුව සමඟ සමීපව වැඩ කළා. ඇමතිවරුන්ගෙන් උදව් එහෙමත් ගත්තා. අපි මාදිවෙල මන්ත්‍රී නිල නිවාසවල සෙට්වෙලා කතා කළා. හැබැයි සර්ගෙන් ළඟදී ඇමැතිකම ගත් එක්කෙනා නම් අපට දිගින් දිගටම ගහනවා. චාමර කීවේය.





විමල් වීරවංශ ,ගම්මන්පිල ඇමතිවරුන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ද ශ්‍රීලනිපය ජනාධිපතිවරයා වෙත කනගාටුව පළ කළේය. එහිදී ජනාධිපතිවරයා කීවේ "ඇත්තටම ගම්මන්පිල අලුත් කෙනෙක් වුණත් මාත් එක්ක දිගු කාලයක් වැඩ කරපු නිසා ඒ දෙන්නට හොඳ ඇමතිකම් දෙකක් දුන්නා. හැබැයි ඒ ගොල්ලෝ ආණ්ඩුවේ ඉඳන්ම ආණ්ඩුවට දිගින් දිගටම ගහන්න ගියාම මට තවදුරටත් බලාගෙන ඉන්න බැරි වුණා" ජනාධිපතිවරයා කීවේය.

ජනාධිපතිවරයා සමග සාකච්ඡාව සාර්ථක වූ බව ශ්‍රීලනිප අදහස විය. ඒ අනුව හිටපු ජනාධිපතිවරයාත් පක්ෂයේ මහලේකම්වරයාත් සාකච්ඡාව අවසන් වී දිගටම ගියේ ටිරාන් අලස්ගේ කාර්යාලයටය. ආණ්ඩුවේ හවුල්කාර පක්ෂවල විමල්, ගම්මන්පිල, වාසු ඇතුළු පිරිස ද ඒ වන විට ටිරාන්ගේ කාර්යාලයට පැමිණ සිටියහ. ජනාධිපතිවරයා සමග පැවති සාකච්ඡාව ගැන මෛත්‍රී පැහැදිලි කරමින්, පක්ෂ නායකයින් දැනුවත් කළ අතර, සර්වපාක්ෂික සමුළුව ගැන ද පැහැදිලි කළේය. විමල් ගම්මන්පිල දෙදෙනා ඉවත් කිරීම ගැන ඔවුන් ජනාධිපතිවරයා හමුවේ කනගාටුව පළ කළ බව දයාසිරි කීවේය.

ඒ අතර හවුල් පක්ෂවල ඉදිරි වැඩපිළිවෙළ ගැන ද සාකච්ඡා වූ අතර දිස්ත්‍රික් මට්ටමේ රැස්වීම් මාලාවක් පැවැත්වීමටත් නුගේගොඩ නගරයේ ජන රැළියක් පැවැත්වීමටත් එහිදී සාකච්ඡා විය.

මේ අතර ඇතිව තිබෙන අර්බුදය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරු ගිය අඟහරුවාද පාර්ලිමේන්තුවේ දී ඇමැති බැසිල් රාජපක්ෂ මහතා හමුවූහ. එය පැවැත්වුණේ ආණ්ඩුවේ පසුපෙළ විසින් කරන ලද ඉල්ලීමකට අනුවය. ඒ සඳහා මූලිකත්වය ගෙන තිබුණේ ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මන්ත්‍රීවරයාය. මේ හමුවට ප්‍රේමනාත් දොලවත්ත මන්ත්‍රීවරයා හැර අනෙකුත් පසුපෙළ මන්ත්‍රීවරු සියලු දෙනාම පාහේ සහභාගි වූහ. ප්‍රමිත කීවේ පසුපෙළ මන්ත්‍රීවරුන්ට ද ගැටලු රැසකට මුහුණ දෙන්නට සිදුව ඇති බව ය. ඒ කෙසේ වුවද ආණ්ඩුව රැක ගැනීමට පසුපෙළ හැම විටම ඉදිරිපත්ව සිටින බව ඔහු කීවේය. මේ අතර, ජගත් කුමාර මන්ත්‍රීවරයාද කතා කළේය. ඔහු කිව්වේ "අපි මේ මොනවා කතා කළත් රටේ තෙල් ප්‍රශ්නය, ගෑස් ප්‍රශ්නය, විදුලිය කැපීමේ අර්බුද ආදී ප්‍රශ්න රැසක් තිබෙන බව ය. එම තත්ත්වය හමුවේ ෂෙඩ් ඉදිරිපිටින් යාමට පවා නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බව ජගත් කීවේය. බැසිල් රාජපක්ෂ ඇමතිවරයා පිළිතුරු දෙමින් විහිළුවට මෙන් කිව්වේ මේ දවස්වල ෂෙඩ් ළඟින් යන එක නතර කරන්න කියාය. කෙසේ වුවද මේ අර්බුදවලට විසඳුම් ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කරගෙන යන බවද ඔහු කීවේය.

## දත්ත ආරක්ෂණ පනත ගැන චරිත ඩලස් වෙනත් අදහසක

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එදින ආණ්ඩු පක්ෂ රැස්වීමේ දීර්ඝ වශයෙන් කතා බහට ලක්විය. ඊට හේතුව වූයේ එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මාධ්‍ය සංවිධානවල ද විරෝධය පළ වීම ය. කෙටුම්පත ගැන මන්ත්‍රී කණ්ඩායම දැනුවත් කළේ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ජයන්ත ද සිල්වා මහතා විසිනි. ජනමාධ්‍ය ඇමැති ඩලස් අලහප්පෙරුම අනතුරුව ඒ ගැන කතා කළේ ය. ඔහු කීවේ පනත් කෙටුම්පත ගැන මාධ්‍ය සමාජයේ ප්‍රශ්න රැසක් මතු වී ඇති බව ය.

ඔවුන් මතු කරන ප්‍රධාන තර්කයක් වන්නේ තොරතුරු දැනගැනීමේ පනතේ වගන්ති මෙම නව කෙටුම්පත නිසා උල්ලංඝනය වන්නේ ද යන්න ගැනය . මාධ්‍ය සංවිධාන වෙනුවෙන් ඩලස් අලහප්පෙරුම ඇමැතිවරයා කරුණු දැක්වීමෙන් අනතුරුව මහාචාර්ය චරිත හේරත් ද ඒ ගැන කතා කළේ ය. තොරතුරු දැනගැනීමේ පනත යටතේ රජයේ තොරතුරු පොදු දේපළ බවට පත්කර තිබියදී දත්ත ආරක්ෂණ පනතෙන් එය සංකීර්ණත්වයට පත්කර තියෙනවා ද යන ගැටලුව මතුවන බව ඔහු කීවේය. ඔහු උදාහරණයක් ද ඒ සඳහා ගත්තේය. සම්මුඛ පරීක්ෂණයට ගියොත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඕනෑම කෙනෙකුට සියලු දෙනාගේ ලකුණු ඉල්ලන්න පුළුවන්. මේ පනතට අනුව සම්මුඛ පරීක්ෂණයෙන් තේරෙන කෙනා කිව්වොත් එයාගේ ලකුණු දෙන්න එපා කියලා ඒක නොදී ඉන්න පුළුවන්. අනෙක් අතට තොරතුරු දැනගැනීමේ පනත යටතේ නිලධාරියෙක් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් පත්කරනවා. මේ පනත යටතේ තාක්ෂණ අමාත්‍යාංශයේ නිලධාරියෙක් පත්කරනවා. ඒකෙන් ගැටලුවක් මතු වෙනවා." යැයි චරිත කීවේය. ඊට පිළිතුරු දුන්නේ නාමල් රාජපක්ෂ ඇමැතිවරයා ය. ඔහු කීවේ මේ පනත සම්බන්ධයෙන් උසාවියක හෝ ප්‍රශ්න කිරීමක් සිදු වී නොමැති බවය. බැසිල් රාජපක්ෂ හා අලි සබ්රි යන ඇමැතිවරු දෙදෙනාද කීවේ මේ ප්‍රශ්න තිබේනම් පසුව ඒවා වෙනස් කළ හැකි බව ය.

## තුන් නිකායේ ම මහනාහිමිවරුන් සජිත්ට ආශිර්වාද කළ හැටි!

**විපක්ෂනායක සජිත් ප්‍රේමදාස ට ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායෙන් ''ශාසන කීර්ති දේශාභිමානී ශ්‍රී ලංකා ජනරංජන" ගෞරව නාමය පිරිනැමීමේ පුණ්‍යමය කටයුත්ත ඉකුත් සිකුරාද සිදුවිය.**

අදාළ ගෞරවනාම සම්මානය වෙනුවෙන් දිවයිනේ ප්‍රකටතම සහ ගෞරවණීය භික්ෂූන් වහන්සේලා සජිත්ට සුබ පතන්නට අමතක කළේ නැත.

"විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් සිදුකරනු ලබන ජාතික, ආගමික, සාමාජික කටයුතු ද සැලකිල්ලට ගෙන මෙම සම්මාන උපාධිය පිරිනමන" බව අග්ගමහා පණ්ඩිත මකුලෑවේ විමලාභිධාන ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක හිමියෝ මේ පිළිබඳව සිය ප්‍රසාදය පළ කළහ.

''සමාජ ප්‍රගමනය උදෙසාත්, ශාසනයේ සුරක්ෂාව උදෙසාත් ධර්මකාමීව කටයුතු කරන සත්පුරුෂයන් සම්මානයට පාත්‍ර කිරීම චිරාගත සාසනික චාරිත්‍රයක්. මල්වතු මහා විහාරය මගින් "ශාසන දීපන අභිමානී ශ්‍රී ලංකා ජනරංජන" යන ගෞරව නාමයෙන් සම්භාවනාවට පාත්‍රව සිටින සජිත් ප්‍රේමදාස මහතා සමාජීය, ආගමික සේවයට උපහාර වශයෙන් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය මගින් එතුමන් ගෞරව නාමයකින් සම්භාවනාවට පත් කිරීම සන්තෝෂයට කරුණක්. සිය තනතුර හා ප්‍රතිබද්ධිත වගකීම් සමුදයන් මනාව පූර්ණය කරමින් සැබෑ මානව දයාවෙන් දේශයේ උන්නතිය උදෙසා කටයුතු කරනවා" යැයි තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මල්වතු මහානාහිමියෝ සුබපැතූහ.

මීට පෙර මල්වතු අස්ගිරි පාර්ශ්වයන් මුල්කරගනිමින් විපක්ෂනායක සජිත් ට ශාසන දීපන අභිමානී ශ්‍රී ලංකා ජනරංජන" ගෞරව නාමය පිරිනමා තිබේ.

"ත්‍රෛනිකායික මහා සංඝරත්නයෙන්ම මේ විදිහට ආශිර්වාද ලබාගත්ත වෙන කිසිම නායකයෙක් ගැන අපි දන්නේ නැහැ" ගයන්ත කරුණාතිලක කීවේය.

"ඔව් අපි අහල තියෙන්නෙ ජනරංජන අගමැති කියලා ඩඩ්ලි සේනානායක මහත්තයා ගැන. එතුමට මිනිස්සු එහෙම කීවා. ඔබතුමාට ත්‍රෛනිකායික මහා සංඝරත්නය ම ජනරංජන නාමය පිරිනමලා තියෙනවා. ඒක විශාල භාග්‍යයක්" මහලේකම් රංජිත් එහෙම කීවේ ය.

## කාන්තා දිනය දින හතක් සැමරූ සජබය

මේ අතර පසුගිය සතියට යෙදී තිබූ කාන්තා දිනය නිමිති කොටගෙන විපක්ෂනායක සජිත් ප්‍රමුඛ සමගි ජන බලවේගය දින හතක කාන්තා වැඩසටහන් මාලාවක් සකස් කළේ සමගි වනිතා බලවේගය සමග එක්වය.

ගම්පහ රත්නාවලි බාලිකා විදුහලට බස් රථයක් පරිත්‍යාග කරමින් ආරම්භ වූ එම කටයුත්ත පාසල් කිහිපයක ම 'සක්වල' වැඩසටහන් රැසක් දක්වාම ව්‍යාප්ත විය.

''සම්මන්ත්‍රණ තියන්න ඕනෑ කෙනෙකුට පුළුවන්. ශාලාවලට වෙලා කාන්තා දිනය සමරන්න පුළුවන්. හැබැයි ප්‍රායෝගිකව අගයක් එකතු කරන්න බොහෝ දෙනෙක් කැමැති නැහැ. අපි අන්න ඒ වැඩේ තමයි කළේ." සජිත් කීවේය.

මේ අතර පාර්ලිමේන්තුවේ විපක්ෂනායක කාර්යාලයේදී ඔහු විපක්ෂයේ පක්ෂ නායකයින් මුණගැසුණි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සඳහා ගෙන යන සටනට සුමන්දිරන් ට සහාය පළ කරමින් ඊට සියලු සහාය ලබාදෙන බවද සඳහන් කොට ඔහුට ලිපියක් භාර දීමට ද කටයුතු කළේය.

## සජබ 15 වැනිදා කොළඹ වටලයි!

**සමගි ජන බලවේගය ලබන පහළොස් වැනිදා ආණ්ඩුවට එරෙහි දැවැන්ත ම සටන කොළඹින් ආරම්භ කිරීමට නියමිතය.**

**දිනෙන් දින ඉහළ යන ජීවන වියදම සහ බංකොලොත්භාවයට පත්වන රට ඉන් මුදාගැනීම උදෙසා අරගලය ආරම්භ කිරීම එහි අරමුණයි.**

**"රට විනාසයි, බේරාගනිමු" යන්න තේමා කොට ගනිමින් එම විරෝධතා රැලිය පැවැත්වේ.**

**"දැන් මේ ආණ්ඩුව තියෙන්නෙ බිත්තර කට්ටක් වගේ. පොඩි තට්ටුවක් දැම්මොත් කුඩු." නලින් බණ්ඩාර කීවේය.**

**"මේ වගේ පිස්සුවෙන් වැඩ කරන ආණ්ඩුවක් ලංකා ඉතිහාසයේවත් තිබිලා නෑ."**

**අශෝක් අබේසිංහ කීවේය.**

**"හරිනුයි මනුෂයි දෙන්න පිනීවා ගිහිල්ලා කරපු වැඩේ හරිම වටිනවා. වැඩෙන් ආණ්ඩුවට කට උත්තර නැති වුණා" රාජිත සේනාරත්න කීවේය.**

**"ඒ විතරක් නෙමේ හිරුණිකා ජනාධිපති ගේ ඉස්සරහට ගිහිල්ලා කරපු විරෝධතාවය සමහරුන්ට අදහගන්නත් බෑ" ඉරාන් වික්‍රමරත්න කීවේය.**

**"හිරුණිකාට මැතිවරණ කාලයේ ගැහුවෙ යකඩ ගැහැනිය කියලා. ඇත්තටම ඒක හිරුණිකා ඔප්පු කළා. මේක කොච්චර ආණ්ඩුවට දැනිලා ද කිව්වොත් ඊට පහුවදා, පොහොට්ටුවේ හෙංචයියෝ වගයක් ඇවිල්ලා අපේ කාර්යාලයටත් ගැහුවා. ඔන්න විනයගරුක රට" මහලේකම් රංජිත් කීවේය.**

**"මේ හැම දේකින්ම ආණ්ඩුව පෙන්වන්නේ එයාලගේ තියෙන දුෂ්ටකම සහ දුර්දාන්තකම. අපි එක තත්පරේකටවත් හිරුණිකාට මේ ප්‍රශ්නයෙන් තනි වෙන්න දෙන්නෙ නෑ. මේ ආණ්ඩුව පන්නන සටන අපි නතර කරන්නෙත් නෑ" සජිත් කීවේය.**

## රටේ තත්ත්වය කතා කරන්න ජවිපෙ පූජක පක්ෂය බැහැදකියි

රටේ පවතින තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීමට පැමිණෙන්නැයි කතෝලික හා ක්‍රිස්තියානි පූජකතුමන්ලාත් විවිධ නායක හිමිවරුන් හා අනුනායක හිමිවරුන් කළ ඉල්ලීම අනුව උන්වහන්සේලා ඉදිරි සති කීපය තුළ බැහැදැක සාකච්ඡා කරන බව ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා පසුගිය සතියේ පැවැති මධ්‍යම කාරක සභාවේදී දැනුම් දුන්නේය.

කොස්වත්තේ පිහිටි පක්ෂ මූලස්ථානයේදී ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභාව රැස්වූයේය. එහිදී බංග්ලාදේශයේ සමාජවාදී පක්ෂයේ සමුළුවට සහභාගී වන ලෙස ජනතා විමුක්ති පෙරමුණට ලැබී ඇති ආරාධනාවට අනුව එහි යැවිය යුත්තේ කවුද යන්න පිළිබඳව ප්‍රථමයෙන්ම සාකච්ඡාවට භාජනය කළේය. ඒ අනුව පක්ෂයේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා හා හිටපු මන්ත්‍රී බිමල් රත්නායක මහතා එම සමුළුවට සහභාගී කළ යුතු බවට ඉදිරිපත් වූ යෝජනාවට මධ්‍යම කාරක සභාව ඒකමතිකව අනුමැතිය පළ කළේය.

ගොවි ජනතාවට නිසි පරිදි වන්දි ලබා නොදීම හා පොහොර ගැටලුවට විසඳුම් නොලැබීම පිළිබඳව හිටපු මන්ත්‍රී ලාල්කාන්ත මහතා මධ්‍යම කාරක සභාව හමුවේ කරුණු දැක්වූයේය. එහිදී ගොවිජන සම්මේලනය ලබන 29 වැනිද පොළොන්නරුවේදී පැවැත්වීමට සංවිධානය කර ඇති විරෝධතා ව්‍යාපාරයට හා ගොවි රැලියකට පක්ෂ නායක අනුර කුමාර දිසානායක, සමන්ත විද්‍යාරත්න හා නාමල් කරුණාරත්න යන මහත්වරුන් සහභාගී විය යුතු බවට ගොවිජන සම්මේලනය කළ ආරාධනාවට අනුව ඔවුන් තිදෙනා එම සමුළුවට සම්බන්ධ වීමටද එහිදී තීරණය කරනු ලැබීය.

ඌව වෙල්ලස්ස ඉඩම් කොල්ලයට හා ප්‍රදේශයේ ගොවීන් දැනුවත් කිරීමට සෙනසුරාද පැවැත්වෙන විරෝධතා පාගමන හා රැලිය පිළිබඳව සමන්ත විද්‍යාරත්න මහතා මෙහිදී මධ්‍යම කාරක සභාව දැනුවත් කළේය. ඉඩම් හා ප්‍රදේශයේ පුරාවස්තු බේරාගැනීම මූලික කර ගනිමින් මෙම විරෝධතාව පැවැත්වෙන බවද මෙහිදී විද්‍යාරත්න මහතා ප්‍රකාශ කළේය.

විමල් වීරවංශ හා උදය ගම්මන්පිලගේ තනතුරු අහිමි වීම පිළිබඳව ද කරුණු මෙහිදී සාකච්ඡා කෙරුණි. රජය ඇතුළත තවත් පිරිසක් එළියට යාමට සූදනමින් සිටින අතර ඉවත්වන අය යළි සම්බන්ධ කර ගැනීමට බැසිල් රාජපක්ෂ මහතා යම් උත්සාහයක යෙදෙමින් සිටින බවට ලැබී ඇති තොරතුරු පිළිබඳව නායක අනුර කුමාර දිසානායක මහතා මෙහිදී පැහැදිලි කළේය. ආර්ථික අර්බුද උග්‍ර වනවිට ඇතුළත අයට එක්ව කටයුතු කළ නොහැකිවීමත් ජනතා විරෝධය ඉස්මතු වන ආකාරයක් මෙහිදී අනුර කුමාර දිසානායක මහතා සවිස්තරාත්මකව පැහැදිලි කළේය.

ත්‍රිරෝද රථ රියදුරන් මුහුණ පා සිටින ගැටලු පිළිබඳව එක්ව ක්‍රියාත්මක විය යුතු බවට ත්‍රිරෝද රථ සංගම් ගණනාවක් කරන ලද ඉල්ලීමටද ජනතා විමුක්ති පෙරමුණේ එකඟතාව දක්වා ඇත.

## 25 වැනිදා සත්‍යග්‍රහයකට එජාපය සැරසෙයි

ජනතාවට පීඩාකාරී ලෙසින් රජය ගෙනයන වැඩපිළිවෙළට විරෝධය දක්වා ලබන 25 වැනිද එක්සත් ජාතික පක්ෂය මගින් කොළඹ හයිඩ් පිටියේදී පැවැත්වෙන සත්‍යග්‍රහ ව්‍යාපාරය සඳහා ආසන සංවිධායකවරුන්ට වගකීම් පැවරීම ඉකුත් සතියේදී සිදුවිය.

මේ සතියේදී සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පැවැති කළමනාකරණ රැස්වීමේදී ද පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා හයිඩ් පිටියේදී පැවැත්වෙන සත්‍යග්‍රහ ව්‍යාපාරයට දිස්ත්‍රික් මට්ටමින් හා ආසන මට්ටමින් සංවිධායකවරුන්ට වගකීම් පැවරීමේ කටයුත්ත නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතාට බාර කළේය.

ඒ අනුව රුවන් විජයවර්ධන මහතා ගිය සතියේ සිටම වැඩ ආරම්භ කළේය. ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේදී දිස්ත්‍රික් සංවිධායකවරුන් හා ආසන සංවිධායකවරුන් හමුවී සත්‍යග්‍රහ ව්‍යාපාරය සම්බන්ධ වගකීම් බාර දුන්නේය.

මේ අතර ජාතික ආණ්ඩුවක් පිළිබඳව ඇති කතාබහ පිළිබඳව පක්ෂයේ ප්‍රධානීන් නායක රනිල් වික්‍රමසිංහ මහතාගෙන් විමසා ඇත.

මෙහිදී රුවන් විජයවර්ධන මහතා ප්‍රකාශ කර සිටියේ ''ජාතික ආණ්ඩු හදල නම් අගමැතිකම් ගන්න වැඩක් නැහැ. නායකතුමා දැන් අවස්ථා පහක් අගමැති වුණා. දැන් ඉතිරි වෙලා තියෙන්නේ නායකතුමා ජනාධිපති පුටුවේ වාඩිවෙන එකයි' යනුවෙනි.

ඩොලරයේ අගය නිදහස් කිරීම පිළිබඳව කරුණු දැක්වූ රුවන් විජයවර්ධන මහතා ප්‍රකාශ කර සිටියේ ''මහ බැංකුව ඩොලරය නිදහස් කිරීමත් සමග වාණිජ බැංකු ඩොලරයේ අගය රුපියල් 260ට ගෙනිච්චා. එය ඉතා හොඳ තීරණයක්. දැන් විදෙස් ශ්‍රමිකයන් වාණිජ බැංකු හරහා රටට ඩොලර් එවාවි'' යනුවෙනි.

මේ අතර ලබන 25 වැනිද පැවැත්වෙන සත්‍යග්‍රහයේ තේමාව ''දැක්ම'' වශයෙන් සඳහන් කර ඇති අතර එයට සහභාගි වන සියලු දෙනා සුදු පැහැයෙන් සැරසී සිටිය යුතු බව තීන්දු කර ඇත.

## දේශපාලනයට ආ යුතු ආකාරය ගැන කරුගෙන් පාඩමක්

දේශපාලනය පිළිබඳ අධ්‍යයන ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලාව හදාරණ නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීමේ උත්සවය පැවැතියේ පසුගිය සතියේය. එහි ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූයේ කරු ජයසූරිය මහතාය. එහිදී ඔහු දේශපාලනය ගැන උනන්දුවක් දක්වන නවකයන්ට වැදගත් පාඩමක් කියාදීමට අමතක නොකළේය.

''දේශපාලනය ගැන ඉගෙන ගැනීම ඉතා වැදගත්. ඒ වගේම ඉගෙනුමකින් යුතුව දේශපාලනයට පිවිසෙන්නේ නම් එය ඊටත් වඩා වැදගත්. මොකද රටේ අනාගතය මෙහෙයවිය යුත්තේ දැනුමැත්තන් විසින් මිසක ලාබ ජනප්‍රියතාවයෙන් දේශපාලනයට පිවිසෙන්නන් විසින් නොවේ. එහිදී මා ඔබගෙන් එකම එක ඉල්ලීමක් කරනවා. ඔබ දේශපාලනයට පිවිසෙන්නේ නම් ඒ සඳහා යොමුවිය යුත්තේ එකම එක දෙයක් උපයාගැනීමට පමණයි. ඒ නිසා පිරිසිදු දැතින් යුතුව දේශපාලනයට ඇතුළු වෙන්න ඒ වගේම දේශපාලනයෙන් නික්ම යන දවසටත් පිරිසිදු දෑතකින්ම යුතුව නික්ම යන්න'' කරු ජයසූරිය මහතා කීවේය.

**-ගජබා-**

www.nsbm.ac.lk

NSBM GREEN UNIVERSITY TOWN

නිපුණතා සංවර්ධන,
වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව
නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය



උසස් පෙළින් පසු

# එන්න ඉගෙනගන්න - ඔබේ බලාපොරොත්තු ජයගන්වන්න!

ඉගෙන ගන්නවා කියන්නේ හඳුන ගන්නවා කියන එක. අසීරු කාලවලත් සීරුවෙන් ඉදිරියට යන ක්‍රමය තේරුම් ගන්නවා කියන එක. අභියෝග ඉදිරියේ නිර්භීතවීමේ දිරිය සොයා ගන්නවා කියන එක. නිවැරදි විකල්ප තෝරාගෙන ඒ තුළින් නොනැවතීමේ බලය ආදේශ කරගන්නවා කියන එක. පොත්පත්වල ඇති දැනුම මෙන්ම ප්‍රායෝගික කුසලතාවන්ගේ ආශ්චර්යය ජීවිතයට එකතු කරගන්නවා කියන එක. ඒ ලබාගත් දැනුම, කුසලතා අනිත් අය සමඟ බෙදාගන්නවා කියන එක.

ඉගෙන ගන්නවා කියන්නේ දැනුමේ සහ කුසලතාවන්ගේ උපරිම අගය උපදවා ගෙන පිරිපුන් පුද්ගලයෙක් බවට පරිවර්තනය වෙනවා කියන එක. එන්න ඉගෙන ගන්න, ඔබේ බලාපොරොත්තු ජයගන්වන්න!

# 2022 මාර්තු කණ්ඩායම සඳහා ලියාපදිංචිය ඇරඹුණා

## FACULTY OF BUSINESS

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

BSc in Business Management (Human Resource Management) (Special)
BSc in Business Management (Logistics Management) (Special)
BSc in Business Management (Project Management) (Special)
BSc in Business Management (Industrial Management) (Special)
BM (Honours) in Accounting & Finance
BM (Honours) in International Business
BA in Business Communication
BBM in Tourism Hospitality and Events

**UNIVERSITY OF PLYMOUTH – UNITED KINGDOM**

BSc (Honours) International Management & Business
BSc (Honours) Accounting & Finance
BSc (Honours) Marketing Management
BSc (Honours) Operations & Logistics Management
BSc (Honours) Events,Tourism & Hospitality Management
BSc (Honours) Business Communication

**VICTORIA UNIVERSITY – AUSTRALIA**

Bachelor of Business: Banking and Finance & Financial Risk Management
Bachelor of Business: Management and Innovation & Supply Chain and Logistics Management

## FACULTY OF ENGINEERING

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

Bachelor of Science Engineering Honours in Mechatronic Engineering
Bachelor of Science Engineering Honours in Electrical and Electronic Engineering
Bachelor of Science Engineering Honours in Computer System Engineering

## FACULTY OF SCIENCE

**UGC APPROVED DEGREE PROGRAMMES- OFFERED BY NSBM**

BSc (Honours) in Biomedical Science
BSc (Honours) in Public Health and Nutrition

## FACULTY OF COMPUTING

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

BSc in Management Information Systems (Special)
BSc (Honours) in Software Engineering
BSc (Honours) in Computer Science
BSc (Honours) in Computer Networks
BSc (Honours) in Data Science

**UNIVERSITY OF PLYMOUTH – UNITED KINGDOM**

BSc (Honours) Software Engineering
BSc (Honours) Computer Networks
BSc (Honours) Computer Security
BSc (Honours) Computer Science

**VICTORIA UNIVERSITY – AUSTRALIA**

Bachelor of Information Technology (NBIT):
Major in Web and Mobile Application Development

## DESIGN STUDIES

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

Bachelor of Interior Design
BSc in Multimedia

**UNIVERSITY OF PLYMOUTH – UNITED KINGDOM**

BA (Honours) Interior Design
BSc (Honours) Quantity Surveying

## FOUNDATION PROGRAMME FOR BACHELOR'S DEGREE

Complete the one year NSBM foundation programme and advance to any foreign degree programme

AACSB
The highest standards in business education

UNIVERSITY OF PLYMOUTH | VICTORIA UNIVERSITY MELBOURNE AUSTRALIA
Affiliated exclusively to top-ranked universities

THE UNIVERSITY OF WESTERN AUSTRALIA
Transfer to Australia

NSBM හරිත සරසවිය, මාහේන්වත්ත, පිටිපන, හෝමාගම.
ඊමේල් : inquiries@nsbm.ac.lk
/nsbm.lk

www.nsbm.ac.lk

## දැන්ම අමතන්න!

**011-544-5000**
**071-244-5000**

අන්තර්ජාලය ඔස්සේ ද ලියාපදිංචි විය හැක

සාඩම්බර
වෝග්

# කාන්තා සැමරුම



මුළු ලොවම අන්තර්ජාතික කාන්තා දිනය සමරන මේ මොහොතේ, වෝග් ජුවලර්ස් හි අප සැමවිටම කාන්තාවන්ට ඉහළම වටිනාකමක් ලබාදී ඇත්තෙමු. විශේෂයෙන්ම අපගේ සාර්ථකත්වය වෙනුවෙන් සුවිසල් භූමිකාවක් ඉටුකළ අපගේම කාර්යමණ්ඩලයේ කාන්තාවන්ගේ පටන්, ගැනිය නොහැකි තරම් ශ්‍රී ලාංකික කාන්තාවන් අලංකාරයෙන් සරසන්නටත්, සවිබලගන්වන්නටත් අපි කටයුතු කර ඇත්තෙමු. ශ්‍රී ලංකාවේ වඩාත් විශ්වාසනීය ස්වර්ණාභරණ ව්‍යාපාරය ලෙසින් අප දිනා ඇති අසමසම උරුමය පිටුපස ඇති ගාමක බලවේගය සේම, මේ සියලු කර්තව්‍යයන්හි ඉදිරියෙන්ම සිටින්නේ, කාන්තා පරම්පරා තුනක ආදර්ශයෙන් වීමත් ඊට හොඳම නිදර්ශන වේ.



## බලගැන්වුණු කාන්තාවන්ගේ උරුමයක්

**චන්ද්‍රා හේමචන්ද්‍ර** – ඇය වෝග් ආයතනයේ සභාපතිනිය සේම මාතෘවරියද වේ. සිය ස්වාමිපුරුෂයා වන දිවංගත සරත් හේමචන්ද්‍ර මහතා සමගින් මෙම ව්‍යාපාරය ආරම්භ කළ මොහොතේ පටන් ඇයගේ නොසැලෙන අධිෂ්ඨානය, ධෛර්යය සහ දැක්ම දශක හයක් තුරාවට පැමිණි මේ ගමනේ මඟපෙන්වීමේ ආලෝකය විය. අද දවසේ, ඇය තම දරුවන් සේ සලකන විසල් සේවක කැළකට ධෛර්යයේ සහ ප්‍රඥාවේ ස්ථම්භයක් ලෙසින් එකසේ ආලෝකය බෙදා දෙයි.

**සමන්තා හේමචන්ද්‍ර** – අධ්‍යක්ෂවරියක සහ නිදහස් පුරෝගාමිනියක වන ඇය සන්නිවේදන අංශයේ අභියෝගාත්මක වගකීම භාරගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලයට එක් විය. එහි ප්‍රතිඵලය නම් තරගකාරීත්වය අභිභවා ගිය අසමසම සන්නාමයකි. සමන්තා එතැනින් පසුව සන්නාමයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම කැරට් 22 මනාලියන්ගේ ආභරණ එකතුව වන වෝග් ටස්කර් කලෙක්ෂන් සහ ටස්කර් ට්‍රෆල් කලෙක්ෂන් මාල එකතුව හඳුන්වා දීමෙන් ව්‍යාපාරයේ දිශානතිය වඩාත් සෞභාග්‍යමත් අතකට වෙනස් කරනු ලැබීය.

**මදාරා හේමචන්ද්‍ර** – අධ්‍යක්ෂවරියක සේම වෝග් හි අඛණ්ඩ උරුමයේ අනාගතයයි. තාරුණ්‍යයේ ජවසම්පන්න බව සහ නව තාක්ෂණික දැනුමින් යුතු ඇයගේ ප්‍රවේශය සමාගමට ස්වර්ණමය අනාගතයක් සහතික කරනුයේ, නූතන පරම්පරාවේ පාරිභෝගිකයින්ගේ ප්‍රවණතා සහ සිතිවිලි මත පදනම් වූ නැවුම් මානයක්ද විවර කරලමිනි.

මේ පුරෝගාමීත්වය සමගින් අපගේ වෝග් හි සාඩම්බර කාන්තා නියෝජනය මෙතෙක් පැමිණි අපගේ ගමන්මගට සේම එතැනින් ඔබ්බටත් ස්වර්ණමය ප්‍රමිතීන් ස්ථාපිත කරමින්, සියලු කාන්තාවන්ට ආදර්ශනයක්ද වනුයේ, ලෝකය විස්මයට පත් කරවමිනි.

www.voguejewellers.lk

voguejewellers.sl
voguejewellerssl
voguejewellers
Vogue Jewellers Pvt Ltd

කොල්ලුපිටිය +94 11 5414414 / නුගේගොඩ +94 11 2826271 / මීගමුව +94 31 2238311
කුරුණෑගල +94 37 2229133 / මහනුවර සිටිසෙන්ටර් +94 81 2221900

වෝග් ජුවලර්ස්
සැමදා ඔබ සමග...

ESTD. 1962

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී



## විමල්ලා හැලවෙද්දී ශ්‍රීලනිපය ආණ්ඩුවට දත් හැපුවාද?

ශ්‍රීලනිප මහලේකම් දයාසිරි ජයසේකර කතා කරයි

# නිවැරදි වෙලාවට අපි නිවැරදි තීන්දුව ගන්නවා

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් නීතිඥ දයාසිරි ජයසේකර

**ශ්‍රී ලංකාවේ දේශපාලනය ගිනියමිය. ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ 11 ක් වෙනම ක්‍රියාන්විතයකය. ඒ අතරවාරයේදී විමල් වීරවංශ හා උදය ගම්මන්පිල යන මහත්වරුන් ඇමැති ධුරවලින් නෙරපා හැරිණි. ඉනික්බිති ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හමුවිය. එය පාවාදීමක්ද? ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද? ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම්, නීතිඥ දයාසිරි ජයසේකර මහතා සමග මේ කතාබහ ඒ සම්බන්ධවය.**

> විමල් - ගම්මන්පිල ගැන තමන්ට එල්ල වූ බලපෑම් ගැන ජනාධිපතිතුමා කීවා

**? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජනාධිපතිවරයා ළඟටම ගිහින් දණ ගැහුවා කීවම හරිද?**

දණ ගැහුවේ නෑ. අපි මීට සති කිහිපයකට කලින් අපේ පක්ෂයේ සමස්ත ලංකා කාරක සභාවට ඉදිරිපත් කරපු වැඩපිළිවෙළ රජයට අපි ඉදිරිපත් කළේ රටේ තියෙන මේ ආර්ථිකමය ප්‍රශ්න. ඉන්ධන හිඟය, ගෑස් හිඟය, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල හිඟය, පොහොර සම්බන්ධව ඇතිවෙලා තියෙන මේ දැවැන්ත අර්බුදය මේ විදිහේ ප්‍රශ්නවලට විසඳුම් සඳහා වහාම ආණ්ඩුව යා යුතුයි කියන කාරණය අපි අවධාරණය කළා.

**? ජනාධිපතිවරයාගේ ප්‍රතිචාරය?**

ජනාධිපතිතුමා සාවධානව ඇහුම්කන් දුන්නා. අපේ විශේෂ ඉල්ලීමක් වුණේ සර්ව පාක්ෂික සමුළුවක් කැඳවන්න කියලා. ඒ වගේම විද්වතුන්ගේ සමුළුවක් කැඳවන්න කියලා. ඊට අමතරව සර්ව ආගමික නායකයන්ගේ සමුළුවක් කැඳවන්න කියලත් ඉල්ලීමක් කළා. රට වෙනුවෙන් අපි ඒ ක්‍රියාවලියට අත තිබ්බේ. එහෙම නැතුව කා ළඟටවත් ගිහින් දණ ගහන්න නොවෙයි.

**? සර්ව පාක්ෂික සමුළුව කැඳවලා ඒ තියන්නේ මාර්තු අග. මේ මාර්තු මුල. වැඩේ නොකෙරෙන වෙදකමක් වගෙයි.**

නෑ ඒක කෙරෙන වැඩක්. ජනාධිපතිතුමා ඒකට දිනය ලෑස්ති කරගන්නවා කිව්වා. එතුමා විශේෂයෙන්ම කිව්වා ඒක අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා කියලා. අපේ ඉල්ලීම අනුව ඒ වැඩපිළිවෙළ යයි.

**? හැමෝම හිතුවේ ඔබලාත් සමඟ එකම වේදිකාවට ගොඩවෙලා ඇමැතිකම් අහිමි කර ගත්ත විමල් හා ගම්මන්පිල ගැන කතා කරන්න ගියා කියලා. නමුත් එහෙම කතාවක් වෙලා නෑ?**

අපි ඒ ගැනත් සාකච්ඡා කළා. අපි පළමුව අපේ කනගාටුව ප්‍රකාශ කළා ජනාධිපතිතුමා ඉදිරියේ. ඒ වගේම අපි බොහොම පැහැදිලිව කිව්වා මේ සමුළුව තියන බව ආණ්ඩුව කලින් දැනගෙන හිටියා. එහෙම දැනගෙන සාකච්ඡාවකට කැඳෙව්වා නම් මේ ප්‍රශ්නය මේ විදියට උද්ගත වෙන්නේ නෑ කියලා. විමල් හා උදය ඇමැතිවරුන් ඉවත් කිරීම පිළිබඳව අපගේ අදහස අපි බොහොම පැහැදිලිව ජනාධිපතිතුමාට ඉදිරිපත් කළා.

**? විමල් හා ගම්මන්පිල ඇමැති ධුරවලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා කිව්වේ මොකක්ද?**

නෑ ඉතින් එතුමා ප්‍රශ්න ගණනාවක් ගැන කතා කළා. එතුමාට එල්ල වුණ බලපෑම් ගැනත් එතුමා කතා කළා. ඒ අනුව තමයි එතුමාට ඒ තීරණය ගන්න වුණේ කියලා එතුමා කිව්වා.

**? විමල් වීරවංශ නම් කිව්වේ ඇමති බැසිල්ගේ බලපෑම නිසයි ඔවුන් දෙදෙනා ඉවත් කළේ කියලා. ජනාධිපතිවරයා ඒ ගැනත් කියන්න ඇති?**

එහෙම කාරණාවක් එතැන කතා වුණේ නෑ. නමුත් ඇමැතිවරු මන්ත්‍රීවරු සියයට 95 ක්ම එතුමාට කියලා තියෙන්නේ තීන්දුවක් ගන්න කියලා එතුමා කිව්වා.

**? ප්‍රශ්නය:- ඇමැති වාසුදේව ඇමැති ධුරයෙන් යන්නේ නෑ. නමුත් අමාත්‍යාංශයට යන්නේ නෑ. මේ මොකක් ද වෙන්නේ?**

ඒක ඉතින් එතුමාගෙන් තමයි අහන්න ඕනෑ. එතුමා විරෝධාකල්පයක ඉන්නවා විමල් හා උදය ඇමැතිවරුන් ඉවත් කිරීම සම්බන්ධව.

**? එතකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එහෙම විරෝධාකල්ප නැද්ද?**

අපි ක්‍රියාමාර්ග තීරණය කරන්නේ පක්ෂයක් විදියට මධ්‍යම කාරක සභාවත් එක්ක සාකච්ඡා කරලා. අපට මන්ත්‍රීවරු 14 ක් ඉන්නවා. ඒ වගේම ලංකාව පුරාම සංවිධායකවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයගේ අදහස් උදහස් හැම විටම සමාන වෙන්නේ නෑ. ඒ නිසා තනි තීන්දුවක් අරගෙන වැඩකරන්න තත්ත්වයක් අපට නෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ දැවැන්ත බලවේගයක්. ඒ නිසා හදිසි තීන්දු අපට ගන්න බෑ. තීන්දුවක් ගන්නකොට සියලුම දෙනා සමග සාකච්ඡා කරලා තමයි ගන්නේ. ඒ නිසා යම් ප්‍රමාදයක් වෙන්න පුළුවන්. නමුත් නිවැරදි වෙලාවටව අපි නිවැරදි තීන්දුව ගන්නවා.

**? පොහොට්ටුවේ මැති ඇමැතිවරු ඔබලාගැන කියන කතා ඇහුවම රෙදි ඇඳගෙන ආණ්ඩුවේ ඉන්න පුළුවන්ද?**

ඒ ගොල්ලන්ට රෙදි ඇඳගෙන ඉන්න බැරි වුණාට අපට ප්‍රශ්නයක් නෑ. අපි වැරැදි ආරක්ෂා කරන්නේ නෑනේ. ඒගොල්ලෝ රෙදි ඇඳගෙන ද ඒවා ආරක්ෂා කරන්නේ කියලා අපට අහන්න වෙනවා. සියල්ලම හරියට සිද්ධ වෙන්නේ නෑ. ඒ නිසා අපි වැරැදි ගැන සංවේදීව කතා කරනවා. හොඳ දේවල්වලට අපි අපේ ශක්තියත් සහයෝගයත් ලබා දෙනවා. රෙදි ඇඳගෙනද? නැද්ද? ඉන්නේ කියලා ඔය කියන අයගෙන් තමයි අහන්න ඕනෑ.

**? ඔබත් අහනවා ඒ අය රෙදි ඇඳගෙන ද ආණ්ඩුවේ ඉන්නේ කියලා. මමත් ඔබෙන් අහන්නේ ඒකමයි?**

අපට ප්‍රශ්නයක් නෑ. මොකද අපි නිකම් කඩේ යන්න සූදානම් නැහැනේ. අපි කියන කියන දේට 'එහෙයි සර්' කියලා කියන්න යන්නේ නෑ. අපි බොහොම පැහැදිලිව අපේ අදහස් ටික ජනාධිපතිතුමා ඉදිරියේ වුණත් ආණ්ඩුවේ මන්ත්‍රී කණ්ඩායම ඉදිරියේ වුණත් කියනවා. නැතිව ආණ්ඩුව ආරක්ෂා කරනවා කියලා රෙදි ගලවාගෙන ඒක කරන්න අපි සූදානම් නෑ.

**? ආණ්ඩුවේ ඉන්න ගමන්, ඇමැතිධුර දරමින් පොඩ්ඩක් කොනිත්ත කොනිත්ත ඉන්න තමයි බලන්නේ?**

එහෙම නොවෙයි. වැරැදි දේ ගැන කතා කරන්න බයවෙන්න ඕනෑ නෑ. අනිත් එක මේක මේ අපි හදපු ආණ්ඩුව. අපි නිකම් ඇවිත් ඇමැතිකම් අරන් ඉන්නවා නෙවෙයිනේ. එක්සත් ජාතික පක්ෂයත් එක්ක ආණ්ඩු කරන කාලෙ නම් ඔහොම කිව්වත් කමක් නෑ. නමුත් මෙතැනදී අපි ශක්තිය දුන්නේ ජනාධිපතිතුමා දිනවන්න. ඒකට මහන්සි වෙලා ඊට පස්සේ ආණ්ඩුව හදන්න මහන්සි වෙලා ඒ සියල්ල කරලා ආණ්ඩුව නිවැරැදි මාර්ගයේ අරන් යන්න අනිවාර්යයෙන්ම අපි කටයුතු කළ යුතුයි. ඒ වෙනුවෙන් අපි කැපවෙලා වැඩ කරනවා.

> යම් යම් ප්‍රතිවිරෝධතා තිබුණත් අපි දාහතර දෙනාම එක මතයක ඉන්නවා.

**? පොහොට්ටුවේ අය නම් කියන්නේ ඔබලා පොහොට්ටුවෙන් ඉල්ලුවේ නැත්නම් ඇපත් නෑ කියලයි?**

පොහොට්ටුවේ ඡන්ද විතරක් අරගෙන අපට මන්ත්‍රීවරු වෙන්න බෑ. පොහොට්ටුවේ පාක්ෂිකයන්ට ඒ අය කිව්වේ මොකක්ද? 'මෛත්‍රීට ගැවුණ එකෙකුටවත් ඡන්දෙ දෙන්න එපා' කියලනේ කිව්වේ. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වගේම පොහොට්ටුවේ බුද්ධිමත් හා වැදගත් මිනිසුන්ගේ ඡන්ද තමයි අපට ලැබුණේ. ඒ නිසා අපට ඒ වගකීම තියෙනවා ආණ්ඩුවේ නිවැරැදි වැඩපිළිවෙළකට සහයෝගය දෙන්න.

**? ආණ්ඩුවෙන් එළියට යන්න බෑ කියන ස්ථාවරයේ තදින්ම ඉන්නේ කවුද?**

මට ඒක ඒ විදියට කියන්න බෑ. නමුත් අවශ්‍ය වෙලාවට අවශ්‍ය තීන්දු තීරණ අපි ගන්නවා.

> ආණ්ඩුව ආරක්ෂා කරනවා කියලා රෙදි ගලවා ගෙන ඒක කරන්න අපි සූදානම් නෑ.

**? ඔබේ ස්ථාවරය මොකක්ද? ආණ්ඩුවෙන් යා යුතුද? ආණ්ඩුව සමග යා යුතුද?**

ඒක අපි පක්ෂයක් විදියට ගන්න ඕනෑ තීන්දුවක්. ඒ නිසා පක්ෂයේ මහලේකම්වරයා හැටියට මට මගේ පෞද්ගලික මතය කියන්න බෑ. අපේ මන්ත්‍රී කණ්ඩායමේ දාහතර දෙනාම එකම මතයක ඉන්නවා. පක්ෂයේ මධ්‍යම කාරක සභාව තීන්දුවක් ගත්තොත් ඒකත් එක්ක තීන්දු කරන්න පුළුවන් මොකක්ද කරන්නේ කියලා.

**? ශ්‍රී ලංකා එක ආණ්ඩුවෙන් එළියට යන්න තීන්දුවක් ගත්තොත් පක්ෂය දෙකට කැඩෙන එක නවත්තන්න බෑ?**

නෑ එහෙම තත්ත්වයක් නෑ. පක්ෂයේ අපි හැමෝම එකට එකතුවෙලා ඉන්නවා එකා වගේ. අපි දාහතර දෙනාම එක මතයක ඉන්නවා. යම් යම් ප්‍රතිවිරෝධතා තිබුණත් ඒ විරෝධතා මකා ගන්න අවශ්‍ය සාකච්ඡාව අභ්‍යන්තරයේ අපි සිදු කරනවා.

**? ආණ්ඩුවක ඉන්න ගමන් ඔබලා කරන දේ හරි ද? එහෙම ආණ්ඩුවක් ගෙනියන්න පුළුවන් ද?**

නෑ ඒක සාධාරණයි. අපි සෞභාග්‍යයේ දැක්ම ක්‍රියාවලිය තුළ ඉඳගෙන වැඩ කරනකොට ප්‍රතිවිරෝධතා විශාල සංඛ්‍යාවක් මතුවුණා. විශේෂයෙන්ම යුගදනවි ගිවිසුම, ඒ වගේම 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් දැවැන්ත මතවාදී අරගලයක් සිදුවුණා. නැගෙනහිර ජැටිය අදානි සමාගමට දීම සම්බන්ධයෙන් ගැටුමක් ඇතිවුණා. මේ විදියට යම් යම් කාරණා සම්බන්ධයෙන් අභ්‍යන්තරයේ මතවාදී ගැටුමක් තිබුණා. ඒක තමයි මේ පුපුරලා ගියේ.

**? ප්‍රශ්නය:- මම අහන්නේ ආණ්ඩුවක් ඇතුළේ ඔහොම ඉන්න පුළුවන්ද? රණ්ඩු කරනවා මිසක් වැඩක් කරන්න වෙලාවක් නෑනේ?**

ඔව් එළියට ඇවිත් කතා කරන එකේ ප්‍රශ්නයක් තියෙනවා. අපි සමහර කාරණා ගැන කතා කරනවා වගේම, සමහර කාරණා ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන කතා කළාට ඇහුම්කන් දෙන්නේ නැත්නම් ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ ඔක්කොම එකතුවෙලා සාකච්ඡාවක් කරන්නේ නැත්නම් ප්‍රශ්න කියන ඒවා එළියට යන එක වළක්වන්න බෑ. ඒක කොයිතරම් ප්‍රමාණයකින් කියනවද කියන එකයි අපි කල්පනා කළ යුත්තේ. එහෙම කතා කිරීම තුළ ආණ්ඩුවෙ අභ්‍යන්තරයේ ප්‍රශ්නයක් ඇති වෙනවා නම් ඒකට වගකිවයුත්තෙක් සිටිය යුතුයි. හවුල්කාර පක්ෂවලට සවන් දෙන්නේ නැති නායකයොත් ඒවට වගකියන්න ඕනෑ. ඒ වගේම සවන් නොදීම නිසාම එළියට ඇවිත් ඉතාම දරුණු විදියට ආණ්ඩුවට ගහන්න ගියාම ඒක අනික් පැත්තට බලපාන්නේ කොහොමද කියලත් බලන්න ඕනෑ.

**? ජනාධිපතිවරයා හමුවීමට යෑමෙන් ඔබලා අනෙක් පක්ෂ දහය පාවා දුන්නා කියලා මම කිව්වොත්?**

> අපි නිකම් කඩේ යන්න සූදානම් නෑ. කියන කියන දේට එහෙයි සර් කියන්නෙත් නෑ.

එහෙම කිසිම දෙයක් වුණේ නෑ. අපේ පක්ෂ 11 අතර සම්බන්ධය එලෙසින්ම තියෙනවා. අපි ජනාධිපතිතුමාට ඉතාම පැහැදිලිව කිව්වා අපේ එකමුතුභාවය හා ඒකාබද්ධව දේශපාලන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන එක ඉදිරියටත් කරනවා කියලා.

**? අගමැති මහින්ද රාජපක්ෂ කිව්වෙත් 'තෙල් අර්බුදයක් තිබුණේ නෑ. ඇමැති ගම්මන්පිල කළ ප්‍රකාශ නිසයි තෙල් අර්බුදය මතුවුණේ' කියලා. ඔබත් ඒක පිළිගන්නවද?**

අන්තිමට සියලු බර ගම්මන්පිල ඇමැතිතුමාගේ කරට දානවානම් එතුමාට කියන්න දෙයකුත් තියෙනවනේ. ඒකත් එතුමා කිව්වේ 'මෙච්චරයි තෙල් තියෙන්නේ. ඒක තුළ අපට තෙල් ගෙන්වීමේ අර්බුදයක් තියෙනවා' කියලා එතුමා කිව්වා. එතුමා මේ සම්බන්ධයෙන් කැබිනට් එකේදී ඕනෑ තරම් කතා කරලා ඇති. ඒකට අවශ්‍ය කරන පත්‍රිකාත් ඉදිරිපත් කරන්න ඇති. ඉතින් ඒකට සහයෝගයක් නුදුන්නාම අවසාන වශයෙන් ඔහුගේ ප්‍රශ්නයක් නිසා නොවෙයිනේ තෙල් නැතිව යන්නේ.

**? ඉතින් ආණ්ඩුව කියන්නේ එහෙමනේ?**

නෑ ඒක වැරැදියි. ඒ ප්‍රශ්නයේ වගකීම ආණ්ඩුවේ සමස්ත වගකීමක් හැටියට බාරගත යුතුයි. එහෙම කරන්නේ නැතුව ප්‍රශ්න මතුවෙන කොට ඒවා විසඳා ගන්න ආණ්ඩුවෙන්ම සහාය නොලැබෙන කොට පෞද්ගලිකව ඔහුගේ ගැලවීම සඳහා ඔහු ප්‍රකාශයක් කළා. උදය ඇමැතිතුමාට වෙන කරන්න දෙයක් නෑ. එතුමාට ඒ ප්‍රශ්නය විසඳගන්න සහයෝගය දීලා ශක්තිය ලබාදුන්න නම් ඔය ප්‍රශ්නය මතුවෙන්නේ නෑ.

**? ඇයි මේ රට මේ විදියට අර්බුද සුළියකට ගොදුරු වුණේ. කොතැනද වැරැද්ද වුණේ?**

මේ අර්බුදය තව අවුරුදු පහකින් විතර එන්න තිබුණ අර්බුදයක්. මේ කොවිඩ් වසංගතයත් එක්ක දැන් මේ අර්බුදය එළියට ආවා. කොවිඩ් වසංගතයත් එක්ක රට අවුරුද්දක් වහලා තිබ්බා. සංචාරක ව්‍යාපාරය කඩා වැටිලා. ඩොලර් බිලියන 84 ක විතර ආර්ථිකයක් තමයි අපට තියෙන්නේ. ඒ තුළ තමයි මේ සියල්ල සිදුවුණේ. කොවිඩ් වසංගතය මේකට යම්කිසි විදියකින් බලපාලා තියෙනවා. හැබැයි කොවිඩ් නැත්නම් තව අවුරුදු පහකින් මේක මතුවෙනවා.

**? මේ අර්බුදයට මුහුණ දෙන්න තමයි මොළ හතක් තියෙනවා කියන ඇමැති බැසිල් ගෙනාවේ. ප්‍රයෝජනයක් වුණාද?**

මම දන්නෑ මොළ හතක් ද දහයක් ද පහළොවක් ද කියලා. නමුත් ප්‍රශ්නය තියෙන්නේ කවුරු ගෙනාවත් කවුරු ආවත් මේ අර්බුදයට මුහුණ දෙන්න වෙනවා. මේක කාලාන්තරයක් තිස්සේ වර්ධනය වුණු අර්බුදයක්. මේකට ක්ෂණික විසඳුම් කාටවත් නෑ. මුදල් ඇමැතිගේ කර උඩින් පමණක් මේක තියලා හරියන්නේ නෑ. මේක සමස්ත රටක් හැටියට ප්‍රතිපත්ති මාලාවක් මත ආර්ථික ක්‍රියාවලියක් මත මුහුණ දිය යුතු තත්ත්වයක්.

**? ඔබේ පක්ෂයේ නායක හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන අත්අඩංගුවට ගැනීමේ කුමන්ත්‍රණයක් තියෙනවා කියලා ඔබ කිව්වා. ඒ කුමන්ත්‍රණය එන්නේ ආණ්ඩුව ඇතුළෙන්මද?**

ඔව් ඉතින් ප්‍රසන්න රණතුංග...... ඒ වගේම තව කීප දෙනෙක්ම සනත් නිශාන්ත වැනි ඇමැතිවරු කිව්වනේ හිටපු ජනාධිපතිතුමාව අත්අඩංගුවට ගන්න කියලා. ඒක තනිකරම දේශපාලන හේතු මත තමයි අත්අඩංගුවට ගන්නවා නම් ගන්නේ.

**? ඔබ එහෙම කියන්නේ?**

පොලිසිය කටඋත්තර අරගෙන. එහෙම නැත්නම් නීතිපති දෙපාර්තමේන්තුවෙන් නඩු දාන්නේ නැත්නම් කොහොමද අත්අඩංගුවට ගන්නේ. එහෙම දෙයක් සිද්ධ වෙනවා නම් ඒක සිද්ධ වෙන්නේ බොහොම පැහැදිලිව දේශපාලනඥයන් විසින් බලපෑම් කිරීමෙන්. ඒක බොහොම සාක්ෂි සහිතව ඔප්පු කරන්න පුළුවන් ඔවුන්ගේ ප්‍රකාශවලින්. වැරැද්දක් නැතිව කොහෙත්ම අත්අඩංගුවට අර ගෙන හිරේ දානවා නම්... එහෙම දාන්න කියලා කියනවා නම් ඒ පුද්ගලයාව හිරබාරයට ගන්නවා නම් ඒක දේශපාලන බලපෑමක් මත සිද්ධ වෙන දෙයක්. ඒක තනිකරම දේශපාලන පලිගැනීමක්.

**? එහෙම දෙයක් වුණොත්?**

බලමු ඉතින්. ඒකට ඒ වෙලාවේ මුහුණ දෙන්න වෙනවා. යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් වැඩ කරන මිනිස්සු නිකම් ඉන්නේ නැති වෙයි.

**? ඉදිරියේ එන මැතිවරණය කුමක් වුවත් ඔබලා ඉදිරිපත් වෙන්නේ පොදුජන පෙරමුණෙන්ද ශ්‍රී ලංකා එකෙන්ද?**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරුන්ගේ රැස්වීමේදී අදහස් ගණනාවක් ආවා. තනියෙන් තරග කළ යුතුයි කියලත් අදහසක් ආවා. ඒ අදහස තුළ ඉඳගෙන යම් ආකාරයකින් අපට වැඩ කරන්න වෙයි. අපි ජනාධිපතිතුමාටත් එහෙම තත්ත්වයක් ඇතිවෙලා තියෙනවා කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයකින් තමයි අපට යන්න වෙන්නේ.

**? පක්ෂ 11 වෙනම සන්ධානයක් හදාගෙන මැතිවරණවලට යන්න බලාපොරොත්තු වෙනවද?**

තාම එච්චර දුර සාකච්ඡා කරලා නෑ. අපේ එකමුතුව තිබුණා. අපේ අන්‍යෝන්‍ය අවබෝධය තියෙනවා. එකට තරග කරනව ද කියන එක ඉදිරියේදී ගන්න තියෙන තීන්දුවක්. අපි එකට වැඩ කරනවා.



සාකච්ඡා කළේ :
**ප්‍රසන්න සංජීව තෙන්නකෝන්**




# එජාප මහර ආසන කාර්යාලය විවෘත වෙයි

එක්සත් ජාතික පක්ෂයේ මහර ආසන කාර්යාලය එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියද විවෘත කෙරිණි.

රුවන් විජයවර්ධන මහතා පීත්ත පටිය කපා කාර්යාලය විවෘත කළ අවස්ථාව. එජාප මහර සංවිධායක එච්.එම්. ඉන්දික හේරත්, අමල් රුද්‍රිගු, නාලක ජයසිංහ යන මහත්වරුද මෙහි වෙති.

(ඩික්සන් වසන්ත)

# කබ්රාල්ගේ ප්‍රකාශ ගැන පසුපෙළ නොහොඳින්

(දයාසිලි ලියනගේ)

**මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා කරනු ලබන ඇතැම් ප්‍රකාශ පිළිබඳව පසුපෙළ මන්ත්‍රීවරුන් පිරිසක් මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතාට පැමිණිලි කර ඇත.**

ආර්ථික ප්‍රශ්නයෙන් ගොඩ ඒම සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවන් පිළිබඳව විවිධ මත ප්‍රකාශ කර ඇති ඔහු රටේ ආර්ථික ප්‍රශ්නයක් නැති බවට කළ ප්‍රකාශ මේ මොහොතේ නොගැලපෙන බව පසුපෙළ මන්ත්‍රී කණ්ඩායමේ පිරිසක් පෙන්වා දී තිබේ.

බොහෝ අවස්ථාවල අධිපතිවරයා කරන ප්‍රකාශ නිසා රජය අසීරුතාවට පත් වන බවද ඔවුන් පෙන්වා දී ඇති බව වාර්තා වේ.




# ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීන් මුදල් ඇමැති බැසිල්ගෙන් ඉල්ලුවේ මොනවාද?



**විමල් වීරවංශ, උදය ගම්මන්පිල, වාසුදේව නානායක්කාර යන මහත්වරුන් ප්‍රධාන පක්ෂ 11 ක් මගින් 'රට හදන මග' යනුවෙන් යෝජනා මාලාවක් සමාජගත කිරීමෙන් පසු ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරුන් හා මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා අතර හමුවක් පාර්ලිමේන්තුවේ අංක 1 කමිටු ශාලාවේදී පැවැත්වුණි. ඒ අවස්ථාවට රජයට සම්බන්ධ පසුපෙළ මන්ත්‍රීවරු 47 දෙනෙක් සහභාගි වූහ. ඔවුන් දිගින් දිගටම විමල් - ගම්මන්පිල ඇතුළු කණ්ඩායමට විරුද්ධව මත දැක්වූ බව ප්‍රකට කරුණකි. විමල් හා ගම්මන්පිල ඇමැති ධුරවලින් ඉවත් කිරීමෙන් පසු පසුපෙළ මුදල් ඇමැතිවරයාගෙන් තනතුරු ආදිය ඉල්ලුවාද? නැතිනම් මන්ත්‍රීවරුන්ට බලපාන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කළේ දැයි ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගෙන් කළ විමසීමක්?**

## රටේ තත්ත්වය යහපත් වුණාම අපේ ප්‍රශ්න විසඳන බව කීවා

**මන්ත්‍රී**
**තිස්ස කුට්ටිආරච්චි**



**රටේ තත්ත්වය යහපත් වූ වහාම පසුපෙළ මන්ත්‍රී කණ්ඩායමට ඇති ගැටලුවලට විසඳුම් ලබාගත හැකි වන බව මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා පසුපෙළ මන්ත්‍රී කණ්ඩායම හමුවූ අවස්ථාවේදී ප්‍රකාශ කළ බව බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී තිස්ස කුට්ටිආරච්චි මහතා කියයි.**

ඒ මහතා මෙසේ ද කීය.

පසුපෙළ මන්ත්‍රීවරුනට බලපාන ප්‍රශ්න පිළිබඳව මෙම සාකච්ඡාවේදී මූලික තැනක් ලබා දුන්නේ නැහැ. අපගේ ප්‍රධාන පරමාර්ථය වුනේ ශක්තිමත්ව රජය ඉදිරියට ගෙනයාමට අවශ්‍ය පූර්ණ සහාය ලබා දෙන බව ප්‍රකාශ කර සිටීමයි.

එහිදී එක් මන්ත්‍රීවරයෙක් වාහන පිළිබඳව ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. එහිදී මුදල් ඇමැතිවරයා ප්‍රකාශ කර සිටියේ පසුපෙළ මන්ත්‍රී කණ්ඩායමේ ප්‍රශ්නවලට රට යහපත් වූ වහාම පිළිතුරු දෙන බවයි.

පසුපෙළ මන්ත්‍රී කණ්ඩායම හමුවීමට අවස්ථාවක් දෙන්න කියල මුදල් ඇමැතිවරයාගෙන් ඉල්ලීමක් කර තිබුණා. මේ රජය බලයට ගෙන ඒමට රජයේ ප්‍රබල නායකයන් වගේම පසුපෙළ මන්ත්‍රී කණ්ඩායමත් විශාල කැප කිරීමක් කළා. පසුපෙළ මන්ත්‍රී කණ්ඩායමේ ඉන්න බහුතරයක් ප්‍රාදේශීය සභා, පළාත් සභා නියෝජනය කරන ගමත් එක්ක සමීපව බැඳුන කණ්ඩායමක්. කිසිම තනතුරක් දරන්නේ නැතිව කොන්දේසි විරහිතව ආණ්ඩු බලය ආරක්ෂා කළ පිරිස ලෙසට පසුපෙළ කණ්ඩායම හඳුන්වන්න පුළුවන්. බැසිල් රාජපක්ෂ මහත්තය පාර්ලිමේන්තුවට ගේන්නත් පසුපෙළ කණ්ඩායම විශාල කැපකිරීමක් කළා. රජයේ ඉදිරි වැඩපිළිවෙළත් රටේ වර්තමාන තත්ත්වයත් ගැන බැසිල් ඇමැතිවරයා සමඟ සාකච්ඡා කළා. පළමුවෙන්ම අපි හැමෝම අත්දෙක ඔසවලා බැසිල් රාජපක්ෂ ඇමැතිවරයාට සහාය දෙන බවට එකඟතාවයක් ලබා දුන්නා. මොන පක්ෂ නායකයා ඉවත් වුණත්, පසුපෙළ මන්ත්‍රී කණ්ඩායම රජය ඉදිරියට ගෙනයාමට කොන්දේසි විරහිතව එකඟතාවය පළ කළා. රටේ තියෙන ආර්ථික ප්‍රශ්න ගැන, තෙල් පෝලිම් ගැන, විදුලිය කැපීම් ගැන, බඩු භාණ්ඩ නොමැතිවීම ගැනත් සාකච්ඡා කළා. ගාමිණී ලොකුගේ ඇමැතිවරයා කැඳවලා ෂෙඩ්වලට එන තෙල් බවුසරයක් වෙනුවට දෙකක් හෝ යවන්න කියලත් පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් බලන්න කියලත් උපදෙස් දුන්නා.

**විදුලිය කැපීම ගැනත් කතා කළා. භාණ්ඩ හිඟය සම්බන්ධයෙන් මේ මාසයේ ඉන්දියාවට ගිහිල්ල අත්‍යවශ්‍ය ආහාර ලබා ගැනීම ගැන ගිවිසුමකට පියවර ගන්න බවත් කිව්වා. ඩොලර් ප්‍රශ්නය මේ වසරේදී විශාල වශයෙන් විසඳෙන බව ද මුදල් ඇමැතිවරයා ප්‍රකාශ කළා. ලෝක ආර්ථික තත්ත්වය ගැනත් හිතලා මේ වසරේ ඉඩදෙන්න කියලත් ප්‍රකාශ කළා.**

මේ මොහොතේ අපේ කිසිම කෙනෙක් අපට සම්බන්ධ ප්‍රශ්න ගැන කතා කළේ නැහැ. වාහන පර්මිට් ගැන එක් මන්ත්‍රීවරයෙක් කතා කළා. අපේ වාහන ගෙන්වීම ගැන කතා කළා. පර්මිට් ගැන නෙවෙයි බැසිල් ඇමැතිවරයා ප්‍රකාශ කළේ. මන්ත්‍රීවරුන්ගේ වාහන පර්මිට් ප්‍රශ්න තියෙනවා. මේ තියෙන ආර්ථික තත්ත්වයත් එක්ක මෙමා අවස්ථාවේ එවැනි දේකට අතගැසීම අපහසු බවයි. සමාජ මාධ්‍යවල මන්ත්‍රීවරුනට තීරු බදු නිදහස් වාහන දෙනවා කියල සඳහන් වුණා. මන්ත්‍රීවරුනට වාහන බලපත්‍රයක් දීම වරප්‍රසාදයක් ලෙසට සඳහන් වෙනවා. නමුත් මේ රටේ ආර්ථික ප්‍රශ්නත් එක්ක වාහන පර්මිට් එකක් ගැන කතා කරන්න අපහසුයි. ඉදිරියේදී ආර්ථිකය හොඳ මට්ටමකට ආවොත් එදාට මන්ත්‍රීවරුනට වාහන බලපත්‍රයක් දීම ගැන සලකා බලමු කියල බැසිල් රාජපක්ෂ මහතා පැහැදිලිව ප්‍රකාශ කළා.

**බහුතරයක් මන්ත්‍රීවරුන් පැහැදිලිවම ප්‍රකාශ කර සිටියේ මේ අවස්ථාවේ මන්ත්‍රීවරුන් වාහන පර්මිට් ඉල්ලා නොසිටින බවයි. රටේ තත්ත්වය හොඳ අතට ආවම ඒ ගැන සලකා බලන්න කියල එක් මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා. ඒ හැරෙන්නට වාහන පර්මිට් ඉල්ලුවෙත්, වාහන පර්මිට් දෙනවා කියලවත් කිව්වේ නැහැ.**

**අපේ ගෙවල්වලත් ප්‍රශ්න තියෙනවා. අපිටත් විදුලිය විසන්ධි වෙනවා. පාර්ලිමේන්තුවට එන්න වාහනවලට ඩීසල් නැහැ. සමහරු ඩීසල් වාහන ගෙදර දාලා ආවේ. මේ සැබෑ තත්ත්වය අපට තේරුම් ගන්න පුළුවන් විය යුතුයි. එහෙම නැතිනම් අපි බබාල වෙන්න ඕනැ. කැන්ටිමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිරි ඉල්ලල යකා නැටුව කියල ප්‍රකාශයක් මාධ්‍යවල ගියා. ඒක සම්පූර්ණයෙන්ම බොරුවක්. අනුර කුමාර ඇතුළු ජනතා විමුක්ති පෙරමුණ මන්ත්‍රීවරු කන්නෙ බොන්නෙත් ඔය කැන්ටිමෙන්ම තමයි. පක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවරුන්, කාර්ය මණ්ඩලය ආහාර ගන්නෙ එකම කැන්ටිමෙන්. එතැනදිත් මන්ත්‍රීවරයා හෑල්ලුවට ලක් කරල තියෙනවා.**

සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබාදීම පිළිබඳව මෙහිදී මුදල් අමාත්‍යවරයාගෙන් විමසා සිටියා.

ප්‍රාදේශීය ව්‍යාපෘති සඳහා යෝජනා දැනට දීලා තියෙනවා. පළමු කාර්තුවට මුදල් වෙන්වී තිබුණත්, රටේ තත්ත්වය මත ඒ මුදල් ලැබේවිද යන්න පිළිබඳව මුදල් ඇමැතිවරයාගෙන් විමසා සිටියා.

**අනෙක් වැඩ කටයුතු වගේම මූල්‍ය අර්බුදයක් තිබුණත් මේ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නොඅඩුව යවන බව මුදල් ඇමැතිවරයා ප්‍රකාශ කළා.**

මන්ත්‍රීවරු මාර්ගයෙන් සුදුසුකම් ඇති අයට රැකියා ලබාදීම ගැනත් මෙහිදී කතා වුණා. මීට පෙරත් එවැනි යෝජනා යම් යම් අවස්ථාවල සිදුවී තිබුණා. රැකියා ලක්ෂයේ වැඩපිළිවෙළ යටතේ 8 වසර සමත් 35,000 කට පමණ රැකියා ලබා දුන්නා. ඒ ගැටලුවත් කතා කළා. ඉතිරි අයටත් රැකියා දෙන බව ප්‍රකාශ කළා. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සමත් අයටත් යම් සාධාරණයක් විය යුතු බව ඉල්ලා සිටි විට බැසිල් රාජපක්ෂ ඇමැතිවරයා ප්‍රකාශ කළේ මීට පෙර ඒ අයට රැකියා දෙන්න සැලසුම් කර තිබුණත් කොරෝනා ප්‍රශ්නයත් රටේ ආර්ථිකයත් මත රැකියා ලබාදීමේ ගැටලුවක් ඇති බවයි. රට යහපත් තත්ත්වයට පත්වූ වහාම ඒ රැකියා ටික ලබා දෙන බවට ඇමැතිවරයා පොරොන්දුවක් දුන්නා.

**අපි ප.ව. 2 1/2 ට පමණ අප සාකච්ඡාව පටන් ගත්තෙ. ප.ව. 4.00 ට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සාකච්ඡාව යෙදී තිබුණ නිසා බැසිල් ඇමැතිතුමා එයට සහභාගි වීමට යා යුතුව තිබුණි.**

**අප සාකච්ඡා කළේ පැය එකහමාරක පමණ කාලයක්.**

රජය ඉදිරියට ගෙනයන වැඩපිළිවෙළට පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ සහාය ලබාදෙන බව මූලික කරගත් සාකච්ඡාවක් පැවැත්වුණේ රජයක් හැටියට කොන්ද කෙළින් තියාගෙන රටේ ජනතාවට අවශ්‍ය වැඩපිළිවෙළට සහාය දැක්වීම මේ සාකච්ඡාවේ ප්‍රධාන හරය වී තිබුණා. මේක ශක්තිමත් රජයක් බව ඔප්පු කිරීම, රටේ පෝලිම් ප්‍රශ්න හා අත්‍යාවශ්‍ය ආහාර ක්‍රමය නොඅඩුව ලබාදීමත් අපේ ප්‍රධාන ගැටළු වී තිබුණා.

## අපි දැනම ඔසවා මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහත්තයාට සහාය පළකළා

## මේ මාසෙ ඉන්දියාවට ගිහින් අත්‍යවශ්‍ය ආහාර ගේන්න ගිවිසුමක් ගහන බව ඇමැති බැසිල් කීවා

## අපේ එක් මන්ත්‍රීවරයෙක් වාහන පර්මිට් එක ගැන කතා කළා

## රැකියා නැති අයට මන්ත්‍රීවරුන් හරහා රැකියා ලබා දෙන්න අපි ඉල්ලා සිටියා

## ගම්මන්පිල ජනතාව කලබල කරවූ බව සාකච්ඡා වුණා

**මාතලේ දිස්ත්‍රික්**
**පාර්ලිමේන්තු මන්ත්‍රී**
**ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්**



පසුපෙළ මන්ත්‍රීවරුනට බලපාන ප්‍රශ්න ගැන මෙහිදී මූලික වශයෙන් සාකච්ඡා කෙරුනෙ නැහැ. රටේ බලශක්ති අර්බුදය, වසංගත අර්බුදය, ආර්ථික අර්බුදය, ඩොලර් ප්‍රශ්න ගැන මෙහිදී මූලික වශයෙන් බැසිල් රාජපක්ෂ මහතා අදහස් දැක්වූවා.

**මුල ඉඳලම අපි එක ස්ථාවරයක කටයුතු කළා. අපි සම්ප්‍රදායිකව මීට පෙර සිටි පසුපෙළ මන්ත්‍රීවරුන් වැඩ කළ ආකාරයට අපි කටයුතු කළේ නැහැ. රජය ඇතුළතින් රජයට එරෙහි කණ්ඩායමක් ලෙසත් මෙතෙක් කලක් පසුපෙළ මන්ත්‍රීවරුන් කටයුතු කර තිබුණා. නමුත් මේ පාර්ලිමේන්තුවේ පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකාරීත්වය ඊට වඩා වෙනස් වුණා.**

අපේ ප්‍රධාන අරමුණ වූයේ ජනතා ප්‍රශ්න විසඳමින් රට ඉදිරියට ගෙනයාමයි. ඒ සඳහා පසුපෙළ මන්ත්‍රීවරුන් සියලු ශක්තිය ලබා දීමට එකඟ වුණා. රටේ ප්‍රශ්න අතර ගෑස්, තෙල් ප්‍රශ්න බරපතළයි. සිල්ලර කඩේකවත් තමුන්ගේ තියෙන තොග ප්‍රමාණය එළියට කියන්නෙ නැහැ. ඒක සාමාන්‍ය න්‍යාය. 'මට තව දින 2 කට සීනි තියෙන්නෙ' වගේ ප්‍රකාශ කරන්නේ නැහැ. නමුත් උදය ගම්මන්පිල මහත්තය මුළුමනින්ම රජය අප්‍රසාදයට පත්වන ආකාරයට කටයුතු කළ බව මෙහිදී සාකච්ඡා වුණා. එයාගෙ ප්‍රකාශවලට ජනතාව කලබල වුණා. නැති අර්බුදයක් මවා පෙන්නුවා.

ඉදිරි කාලයේදී ජනතාවට ජනප්‍රිය නොවන තීන්දු මුදල් ඇමැතිවරයාට ගන්න සිදුවන බව අප මෙහිදී පෙන්වා දුන්නා. ඒක රටේ ජනතාවට තේරුම් ගැන්වීමට අපි ඉන්න බව මුලින්ම පෙන්වා දුන්නා. ජනතාවට බොරු කියල මේ ප්‍රශ්නවලින් ගොඩ එන්න බැහැ. ඒ නිසා ජනප්‍රිය නොවන තීන්දු ගන්නත් රජයට සිදුවේවි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යනව නම් ඒ සඳහාත් සහාය දෙන බවත් අපි ප්‍රකාශ කළා. අපි එකතු වෙලා මේ ප්‍රශ්නවලින් ගොඩ ඒමට කටයුතු කළ යුතු බව දැනුම් දුන්නා. මේ රටේ ප්‍රශ්නවලට හේතුව මුදල් ඇමැතිවරයා බව ඒත්තු ගැන්වීමට පිරිසක් සූදානමින් ඉන්නවා.

**මහ බැංකු අධිපතිවරයාත් ඇතැම් අවස්ථාවල එලෙස ඒත්තු ගන්වන ප්‍රකාශ කරන බවට අපට සැකයක් තියෙනවා. අජිත් නිවාඩ් මහතා කරන ඇතැම් ප්‍රකාශවල පැහැදිලි බවක් නැහැ. එයා යෝජනා කරන දේවල් මාධ්‍යයට දෙනවා. මාධ්‍යයට දෙන්න දෙයක් නැහැ. ප්‍රශ්න විසඳන්න වැඩපිළිවෙළ සැකසීම අවශ්‍යයි. අර්බුදයක් හැදෙන්න විමල් - උදය හිටපු ඇමැතිවරු කළ ප්‍රකාශ හේතු වූ බව ද සඳහන් වුණා.**

සමහර ප්‍රකාශ අපටත් පැහැදිලි නැහැ. මහ බැංකු අධිපති කියන්නේ කිසිම ප්‍රශ්නයක් නැහැ කියලයි. ප්‍රශ්නයක් තියෙන බව ඇත්ත. ඒක වහන්න බැහැ. ප්‍රශ්න විසඳීමට පැලැස්තර අලවල වැඩක් නැහැ ප්‍රශ්නවලට සියලු දෙනා එක්වී විසඳුම් ලබාගත යුතු බවත් මෙහිදී සාකච්ඡා කෙරුණා.

**සටහන**
**දයාසීලි ලියනගේ**

---

# ඩොලරය පාකළේ ඉන්දීය විදේශ ඇමැතිගේ ඉල්ලීම නිසාද?

**ආන්දෝලනාත්මක පුවත් මැවෙන කාලයකි. ආණ්ඩුවෙන්ම ආණ්ඩුවට ප්‍රහාර එල්ලවෙන කාලයකි. ඇමැති සංශෝධනයේ උණුසුම ගෙවී යන්නටත් මත්තෙන් ආර්ථික ගිනි පුපුර ඇවිළෙන්නට ගත්තේය. ඒ දැඩි ආයාසයකින් පාලනය කරගෙන සිටි රුපියලේ අගය තවත් අවප්‍රමාණය කිරීමට කටයුතු කිරීමත් සමගය. රට ඩොලර් අර්බුදයකට මුහුණ දී සිටින්නේ කලක පටන්ය. කොරෝනා වසංගතයත් සමග රටට ලැබෙන ඩොලර් ආදායම් දැනෙන ආකාරයට අහිමිව ගියේය. සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු ඩොලර් ආදායම පසුගිය කාලයේ සම්පූර්ණයෙන් අහිමිව යාම මෙයට එක් උදාහරණයකි. විදෙස් ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණද පහළ ගියේය. ආනයනික භාණ්ඩ නිදහස් කර ගැනීමට ඩොලර් හිඟ විය. එසේ තිබියදී ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 203 මට්ටමේ කෘත්‍රිමව පවත්වාගෙන යාමට මහ බැංකුව කටයුතු කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කළු කඩයේ ඩොලරයේ මිල රුපියල් 240, 250 ආදී විවිධ අගයන්වලට විකිණෙන්නට ගත්තේය. මේ හේතුවෙන් රජයට තව තවත් ඩොලර් ආදායම් අහිමිව ගියේය.**

ඇමෙරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ශක්තිමත්ව පවත්වාගෙන යාම අවශ්‍ය බව කියමින් ආණ්ඩුව දිගින් දිගටම සංචිතවල තිබූ ඩොලර් ද විකුණමින් රුපියලේ අගය රැක ගැනීමට උත්සාහ ගත්තේය. වත්මන් පාලනය යටතේ රුපියලේ අගය 203 මට්ටමේ පවත්වාගෙන යාමට ඩොලර් බිලියන 1.5 ක් 'පුච්චා' දැමූ බව බොහෝ විට ඇසෙන කතාවකි.



ඉන්දීය විදේශ කටයුතු ඇමැති එස්. ජයිශංකර්



කෙසේ වෙතත් ආණ්ඩුව දැරූ ස්ථාවරය එක්වරම වෙනස් වූවාද? රුපියලේ අගය වෙළෙඳපොළ බලවේග මත නිදහසේ තීරණ වීමට ඉඩ දෙනු වෙනුවට මහ බැංකුව කළේ එය රුපියල් 230 සීමාවේ රඳවා ගැනීමට කටයුතු කිරීමය. එයට 'නම්‍යශීලී' යන වචනය ද එක්කර ගත්තේය. මේ පියවර මීට කලින් ගත්තා නම් අර්බුදය මෙතරම් උග්‍ර නොවන්නට තිබුණි. ඒ ඩොලරයට වැඩි අගයක් ලැබෙන නිසා විදේශ ප්‍රේෂණ වැඩියෙන් ගලා ඒමට අවස්ථාව තිබූ හෙයිනි. ආණ්ඩුව අභ්‍යන්තරයේ පවත්නා කඹ ඇදීම් රටට අවශ්‍ය පියවර පමා කරන්නේදැයි මේ පසුබිමේ මතුවන ප්‍රශ්නයකි. පසුගිය කාලයේ විටින් විට සමාජ ගතවූ කාරණා ඒ සැකය තවත් තහවුරු කරනු පෙනේ.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ හමුවක් පසුගිය මාර්තු 03 වැනිදා පැවැත්වුණි. එම හමුවේදී ගන්නා ලද තීන්දු තීරණ රටට අනාවරණය කිරීමට මාර්තු 04 වැනිදා මහ බැංකුවේදී මාධ්‍ය හමුවක් පැවැත්වුණි. ඒ මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙනි. රටේ පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට මුදල් මණ්ඩලය විසින් රජයට ඉදිරිපත් කරනු ලැබූ යෝජනා අටක් සම්බන්ධයෙන් අනාවරණය කිරීම ද මෙදින සිදුවිය. කෙසේ වෙතත් රටේ පවතින ඩොලර් අර්බුදය හමුවේ රුපියලේ අගය පා කරන්නේදැයි මේ අවස්ථාවේ මාධ්‍යවේදීහු විමසූහ. එවැනි තීන්දුවක් ගෙන නැති බව ඊට පිළිතුරු වශයෙන් මහ බැංකු අධිපතිවරයා ප්‍රකාශ කළේය. එහෙත් එයින් දින දෙකක් ඉක්ම ගිය තැන එනම් පසුගිය 07 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට රුපියලේ අගය 230 මට්ටමේ රඳවා ගැනීමට පියවර ගන්නා බව මහ බැංකුවම නිවේදනය කළේය. පසුගිය කාලය පුරාම රුපියලේ අගය 203 මට්ටමේ ස්ථාවරව පවත්වාගෙන යාමට මහත් වෙහෙසකින් ක්‍රියා කළ මහ බැංකුවේ ස්ථාවරය මුදල් මණ්ඩලයේ නිල හමුවකින් තොරව සිදුවූවේද යන කුකුසද සමාජ ගත වී තිබේ. හදිසි රැස්වීමක් මාර්ගගත ක්‍රමයට හෝ පැවැත්වුණා දැයි අපි නොදනිමු.**

රුපියලේ අගය අවප්‍රමාණය කිරීමට පූර්වගාමීව තවත් සිද්ධියක් සිදුව තිබුණි. එනම් මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ සහ ඉන්දීය විදේශ කටයුතු ඇමැති එස්. ජයිශංකර් අතර පැවැති දුරකථන සංවාදයයි. එකී සංවාදය පැවැත් වුණේ පසුගිය අඟහරුවාදා (08) දිනයේය. පවතින ඩොලර් අර්බුදය සමනය කර ගැනීමට ඉන්දියාවෙන් ලබාගැනීමට අපේක්ෂා කරනු ලබන ඩොලර් බිලියනයක ණය මුදල සම්බන්ධයෙන් මෙම සාකච්ඡාවේදී අදහස් හුවමාරු කරගත් බව ආරංචිමාර්ග සඳහන් කරන්නකි. ලංකාවට අදාළ බොහෝ ආර්ථික කාරණා මෙම සංවාදයේදී සාකච්ඡාවට ලක්වූ බව නම් නිසැකය. තවත් ටික දිනකින් ගෙවීමට ඇති ඩොලර් මිලියන 500 ක ණය මුදල ඒ අතර ප්‍රමුඛ වූවා විය හැකිය. ඩොලර් බිලියනයක ණය මුදල ලබාදීමට නම් රුපියලේ අගය පා කළ යුතු යැයි ජයිශංකර් හරහා ඉන්දියාව දැනුම් දුන් බවට ද ඇතැම්හු කියති. ඒ අනුව අපේ රුපියලේ අගය තීරණය කිරීමට ඉන්දියාව බලපෑම් කළාදැයි යන සැකය තිරය පිටුපස මෝදු වෙමින් තිබේ. මහ බැංකුවට හොරෙන් රුපියලේ අගය අවප්‍රමාණය කළේ යැයි ඇතැම් අය කියන්නේ මේ නිසාය.

**පවත්නා ආර්ථික අර්බුදය හඳුනාගෙන එය විසඳීමට විසඳුම් මාලාවක් අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් ඉදිරිපත් කරනු ලැබ තිබුණේ 2020 ඔක්තෝබර් 26 වැනිදාය. ලංකාවේ ණය බරතාව, දැනට මුහුණ දෙන අභියෝග හා යෝජිත විසඳුම්' යනුවෙන් එම යෝජනා මාලාව ඇමැති මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ හා සේවා සඳහා ආනයන සීමා පවත්වා ගැනීමෙන් ආර්ථික වර්ධනයට සහාය විය හැකි බව එහි 26 වැනි පිටුවේ පෙන්නා දී තිබේ. ගෙවුණු වසරේ ආනයන වියදම ඩොලර් බිලයන 21 කි. එයින් බිලියන 6 ක් වියදම් කර ඇත්තේ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනයටය. එහෙත් මේ යෝජනා වසරක් යනතෙක් ක්‍රියාත්මක වූයේ නැත. මේ යෝජනා ක්‍රියාත්මක කිරීම මුදල් අමාත්‍යාංශය සිතාමතාම මගහැරියා දැයි කෙනකුට සිතෙන්නට පුළුවන.**

ඒ වගේම 'සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සයමාසික ප්‍රතිපත්ති පෙර දැක්ම' ඉදිරිපත් කිරීමට ද මහ බැංකු අධිපතිවරයා පියවර ගත්තේය. ඒ 2021 ඔක්තෝබර් 01 වැනිදාය. මෙම යෝජනා මුදල් ඇමැතිවරයාට ඉදිරිපත් කළේ ඇමැති මණ්ඩලයට එය ඉදිරිපත් කර අනුමැතිය ගෙන ක්‍රියාත්මක කිරීමටය. එහෙත් පසුගිය ඇමැති මණ්ඩල හමුව දක්වාම එවැන්නක් ඉදිරිපත් වූ බවක් පෙනෙන්නට නොතිබුණි. සාමාන්‍යයෙන් ආර්ථිකය සම්බන්ධව මහ බැංකුව උපදෙස් දෙන්නේ මුදල් අමාත්‍යාංශයටය. එහෙත් එම උපදෙස් නොසලකා හැර කටයුතු කරන්නේ දැයි පවතින අර්බුදය දෙස බලන විට පෙනෙන කාරණයකි.

**මහ බැංකුව රජයට ලබාදී ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමට මාස හයක් තිස්සේ කටයුතු කර නැති බවට ද චෝදනා නැගුණි. ඒ වගේම මහ බැංකු අධිපතිවරයාට මුදල් ඇමැතිවරයා හමුවීමට අවස්ථාවක් නොලැබුණු බවට දේශපාලන වේදිකාවේ ප්‍රකාශ වුණි. සංචාරක ව්‍යාපාරයේ නියුතු ආයතන හා සම්බන්ධව මහ බැංකුව නිකුත් කළ නිර්දේශ ක්‍රියාවේ යෙදවීමට මුදල් අමාත්‍යාංශය කටයුතු නොකළ බවට කතා පසුගිය කාලයේ තිබුණි. ඒ නිසා මුදල් පනතෙන් මහ බැංකුවට පැවරී ඇති බලතල අනුව එම නිර්දේශ ගැසට් කිරීමට මහ බැංකුව පියවර ගත්තේය. මෙයින් පෙන්නුම් කරන්නේ ආර්ථිකය සම්බන්ධව රජයට උපදෙස් දෙන්නාගේ අදහස් පිළිබඳව රජය එතරම් තැකීමක් නොකරන බවද? මහ බැංකුව ආර්ථිකය සම්බන්ධයෙන් ලබාදී ඇති උපදෙස් ඒ ඒ අවස්ථාවල ක්‍රියාවේ යෙදවූවා නම් අර්බුදය මෙතරම් තීව්‍ර නොවන්නට ඉඩ තිබුණා නොවේදැයි මේ අනුව යම් කෙනකුට සිතන්නට පුළුවන.**

කෙසේ වෙතත් අර්බුදය ඔඩුදුවා ඇති බව පැහැදිලි කාරණාවකි. රුපියලේ අගය පා කිරීමට ගත් තීරණයත් සමග ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ශීඝ්‍රයෙන් පිරිහෙමින් තිබේ. පළමු දිනයේදී එය රුපියල් 229 ක සීමාවේ රැඳී තිබුණි. නිල විනිමය අනුපාතය එය වුවත් එදිනද විදේශ මුදල් හුවමාරු මධ්‍යස්ථානවල ඩොලරයට රුපියල් 249 ක් රුපියල් 252 ක් පමණ ගෙවමින් තිබුණි. හවාලා සහ උණ්ඩියල් ක්‍රමයට කෙරෙන ගනුදෙනු වලදී මෙම අගය මීට වඩා වැඩි බව අමුතුවෙන් කිවයුතු නැත. මෙම සටහන තබන දිනයේ (10) මෙරට ප්‍රමුඛ වාණිජ බැංකුවල ඩොලරයක විකුණුම් මිල රුපියල් 260 ක් ලෙස ද ගැනුම් මිල රුපියල් 250 ක් ලෙසින්ද සටහන්ව තිබුණි. මෙයින් පෙන්නුම් කරන්නේ මහ බැංකුව අපේක්ෂා කළ රුපියල් 230 සීමාව ඉක්මවා රුපියලේ අගය පිරිහෙමින් ඇති බවය. මේ තත්ත්වය ඇතිවී තිබෙන්නේ යම් පාලනයක් පවතින පසුබිමකය. වෙළෙඳපොළ බලවේග මත රුපියලේ අගය නිදහසේ තීරණය වීමට ඉඩ ලබා දුනහොත් ඩොලරයක අගය රුපියල් 280 - 290 මට්ටමකට පවා ළඟා වන්නට පුළුවන.

**මෙවැනි තත්ත්වයක බලපෑම දැඩිව ජනතාවට දැනෙන බව අමුතුවෙන් කිව යුතු නැත. මෙරටට ආනයනය කෙරෙන ලූනු, පරිප්පු, සීනි, අල ඇතුළු සියලු අත්‍යවශ්‍ය ආහාර මිල ගණන් ජනතාවට දරාගත නොහැකි මට්ටමකින් ඉහළ යාමට රුපියලේ අගය පිරිහීම බලපාන බව සක්සුදක් සේ පැහැදිලිය. ඒ වගේම දැනටත් රටේ හිඟ වී තිබෙන ඉන්ධන, ගෑස්, කිරිපිටි ආදියේ මිල ද දරාගත නොහැකි මට්ටමකට වැඩි වෙන බව අමුතුවෙන් කිවයුතු නැත. ආනයනය කෙරෙන අනෙකුත් අමුද්‍රව්‍ය හා භාණ්ඩවල මිලට අත්වන්නේ ද එකී ඉරණමය.**

ඖෂධ මිල ගණන් සියයට 18 කින් පමණ ඉහළ යාමක් අපේක්ෂා කරන බව මේ වන විටත් ප්‍රකාශ වී තිබේ. ඉදිරි දින දෙක තුනේදී එම මිල වැඩිවීම සිදු නොවුණහොත් රටේ ඖෂධ හිඟයක් නිර්මාණය විය හැකි බවට මේ වන විටත් අනතුරු අඟවා තිබේ.

**මෙකී බරට අමතරව රටට මහා බරක් වී ඇති ණය කිහිප ගුණයකින් ඉහළ යාමට රුපියලේ අගය පිරිහීම බලපා ඇත. එය ණය ගෙවීමේ හැකියාව තව තවත් අසීරු තැනකට තල්ලු කිරීමට හේතුවන්නට පුළුවන. රට ණය අර්බුදයෙන් ගිලෙන වේගය මේ සමග වැඩි වන බව ද පෙනෙන්නට තිබේ.**

මේ සියල්ල රජයත් මහ බැංකුවත් අතර ඇති වී තිබෙන විවිදාත්මක තත්ත්වයේ ප්‍රතිඵලයක් දැයි අපි නොදනිමු.

රුපියලේ අගය පා කිරීමට ගත් පියවරේ වාසි සහගත පැත්තක් ද ඇති බව අමතක නොකළ යුතුය. ඩොලරයට වැඩි අගයක් ලැබීමත් සමග අපනයනකරුවන් රටට වැඩියෙන් මුදල් ගෙන ඒමට යොමුවීම ඉන් එකකි. ඒ වගේම විදේශ ප්‍රේෂණ ගලා ඒම ඉහළ යාමට ද මෙම පියවර හේතුවනු ඇත. විදේශ ආයෝජන රට තුළට ගලා ඒමට මෙම තීරණය සුබදායකව බලපාන බව ද අමතක නොකළ යුතුය. වගකිව යුතු ආයතන සහ පුද්ගලයන් වගකීමෙන් තොරව කටයුතු කරන්නේ නම් ඊට අවසන් වන්දිය ගෙවීමට සිදුවන්නේ ජනතාවට බව අවසන් වශයෙන් සටහන් කළ යුතුය.

**සටහන**
**චමින්ද මුණසිංහ**

# නව පරිච්ඡේදයක උදාව




**අලුත් නමක්. නොවෙනස් විශ්වාසයක්**

අයිඩියල් ෆිනෑන්ස් සහ මහින්ද්‍රා ෆිනෑන්ස් එක්ව මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලෙස නව මුහුණුවරකින් ඔබ වෙතට නව්‍ය මූල්‍ය පහසුකම් සමුදායක් පිරිනමමින් ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් බලගන්වයි.

- පුළුල් ශාඛා ජාලය
- ෆිච් ශ්‍රේණිගත කිරීම AA- (ස්ථාවර ඉදිරිදැක්ම)
- නොවෙනස් විශ්වාසය සහ උසස් සේවය

**අප පිරිනමන මූල්‍ය පහසුකම්**

- රන් ණය
- පුද්ගලික ණය
- පාරිභෝගික භාණ්ඩ ණය
- වාහන ලීසිං

ශ්‍රී ලංකාවේ බැංකු, මූල්‍ය සේවා සහ රක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කිරීමට හොඳම සේවා ස්ථාන 10 අතර (GPTW, 2021)

www.mahindraifl.lk | ක්ෂණික ඇමතුම් 011 7 724 724

2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී සමාගමකි. සංස්ථාපිත දිනය 2012 ජනවාරි 24 වන දින



HCL

HORIZON CAMPUS

# A rewarding IT career with a global giant - right after A-Levels, with 100% scholarship for graduation!



TECH BEE™ EARLY CAREER PROGRAM

## Join the HCL TechBee Early Career Program

- 100% paid scholarship for the following degrees:
  - BSc (Hons) Information Technology
  - BIT (Hons) in Networking & Mobile Computing
- Job specific training and an assured job at HCL Sri Lanka
- Freedom from financial burden for higher education
- Years of global IT experience by the time you graduate

**Eligibility**

- Completed GCE A-Levels in 2018, 2019 or 2020
- 3 'S' passes in core subjects and in English

Rise to a global IT career
**Call 077 4 753 640**

website: www.hclsrilanka.com/techbee
email: riseSL@hcl.com
Address: HCL Technologies Lanka Pvt. Ltd., Cinnamon Life, 200 Glennie St., Colombo 2, Sri Lanka

SCAN HERE

USD 11.18 BILLION REVENUE COMPANY | OVER 157 NATIONALITIES | OPERATING IN 52 COUNTRIES | 197,000+ IDEAPRENEURS

# විදුලිය කපන්නේ නෑ කියා රටට බොරු කීවේ මුදල් ඇමතිද මණ්ඩලයද?

**විදුලි කප්පාදුව ගිය 5 වැනිදා සිට නතර කිරීමට උත්සාහ ගන්නා බව මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා කැබිනට්ටුවේදී මාර්තු 1 වැනිදා ප්‍රකාශ කර සිටියේය. ඉන්පසු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හා විදුලිබල අමාත්‍යාංශ නිලධාරීන් සමඟ පැවැති සාකච්ඡාවක දී අඛණ්ඩව විදුලිය සැපයීමට පියවර ගන්නා ලෙස ජනාධිපතිවරයා උපදෙස් දී තිබුණි. ඒ අනුව මාර්තු 5 වැනිදා සිට විදුලිය කප්පාදුවකින් තොරව ලබාදෙන බවට නිලධාරීන්ට දැනුම් දී තිබුණි. ප්‍රමාදයකින් තොරව ඉන්ධන ගෙන්වීම, ඉන්ධන සංචිත පවත්වා ගෙන යාම, විදුලිය උත්පාදනය සඳහා ඉන්ධන හා ගල් අඟුරු සැපයීම අඛණ්ඩව සිදුකිරීමට ද මෙහි දී තීරණය කර තිබුණි.**

එහෙත් මේ කුමන තීරණයක් ගත්තත් මාර්තු 5 වැනිදා දිනය තවමත් පැමිණ නැද්ද? යන ගැටලුවට ජනතාව මුහුණ දී සිටිති. එයට හේතුව මාර්තු 5 වැනිදායින් පසුවත් පැය 7 1/2 ක පමණ කාලයක් විදුලිය කපා හැරීමය.

පසුගිය කාලය පුරා දේශපාලනඥයන් එක් එක් මතවල ඉඳිමින් විවිධ ප්‍රකාශ නිකුත් කළහ. විදුලිය භාරව අලුතෙන් පත් වූ පවිත්‍රා වන්නිආරච්චි ඇමැතිනිය ඉතා පරෙස්සමෙන් වචන මෙහෙයවන බවත් පෙන්නුම් කරයි. මේ අතර විදුලි ඉංජිනේරුවන් කිසිදු කතාබහක් නොමැතිව විදුලිය විසන්ධි කිරීම සිදු කරයි. විදුලිය නැතිව ජනතාව දිනෙන් දිනම අසීරුවට පත්වේ.

ජනාධිපතිවරයා හා රජයේ ප්‍රධානීන් මොනවා දෙසා බැවත් විදුලිය කැපීම නතර වී නැත. පැය 7 ක් 7 1/2 ක් ලෙසට දීර්ඝ කාලයක් විදුලිය කැපීම සිදුවිය. සුළු අඩුවීමක් සිදු වූයේ ඉකුත් බදාදාය.

මෙයින් පැහැදිලි වෙන ප්‍රධාන කරුණක් ඇත. දේශපාලන තීන්දු තීරණවලට විදුලිබල මණ්ඩලයේ බලධාරීන් එකඟතාවයක් නොදක්වන බවය. මෙසේ වෙන්නේ ඇයි? මේ සම්බන්ධයෙන් විදුලි ඉංජිනේරු සංගමයේ සභාපති අනිල් ඉඳුවර මහතාගෙන් විමසීමක් කළෙමි.

## ඒවා දේශපාලන කතා

**විදුලි ඉංජිනේරු සංගමයේ සභාපති අනිල් ඉඳුවර**

දේශපාලනඥයන් තීන්දු තීරණ අරගෙන මොන ප්‍රකාශ නිකුත් කළත් ප්‍රායෝගිකව කළ නොහැකි දේ කළ නොහැකියි.' යැයි විදුලිබල මණ්ඩලයේ විදුලි ඉංජිනේරු සංගමයේ සභාපති අනිල් ඉඳුවර මහතා කියයි.

**ඒ මහතා මෙසේ ද කීය.**

විදුලිය ලබාදීම බොහොම නරක තත්ත්වයක තියෙන්නෙ. ජලය මගින් විදුලිය නිෂ්පාදනය කිරීමත් බෙහෙවින්ම අඩුවෙලා. ඊට අමතරව ඉන්ධන ලැබෙන්නෙත් නැහැ. ගල්අඟුරු තියෙන ප්‍රමාණයත් ලබන ජූනි - ජූලි වගේ වෙන විට අවසන් වෙනවා. දැනට නොරොච්චෝල ගල්අඟුරු බලාගාරයෙන් විදුලිය මෙ.වොට් 900 කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබනවා. ඒක මේ වනවිට නොඅඩුව ලබා දෙනවා. ඒත් ලබන ජූනි, - ජූලි වෙන විට දැනට ගබඩා කර තිබෙන ගල්අඟුරු අවසන් වෙනවා.

වාරකන් කාලය ලබන නිසා කල් ඇතිව ලබන මාසය වෙන විට ගල්අඟුරු ඇනවුම් කර ගෙන්විය යුතුව තිබෙනවා. ඉන් පසු ගෙනාවත් බා ගන්න බැරි වෙනවා. ඒ නිසා අප්‍රේල් මැද

## ජූනි-ජූලි වෙද්දී ගල් අඟුරුත් අවසන්

වන විට ගල්අඟුරු ගෙන්විය යුතු වෙනවා. ඒ සියල්ලටම ඩොලර් අවශ්‍යයි. වැස්සට හැර අනෙක් සියලු දේ ගෙන්වීමට ඩොලර් අවශ්‍යයි.

වතුර ටික ඉවර කර ගත්තොත් තවත් පැය ගානක් විදුලිය කපන්න වේවි. ජලයෙන් සියයට 17 ක පමණ ප්‍රමාණයක් දැනට විදුලිය නිෂ්පාදනය කරනවා.

**ප්‍රශ්නය - ජනාධිපති නම් කිව්වේ ඉකුත් 5 වැනිදායින් පස්සෙ ලයිට් කපන්න එපා කියලයි. ඒත් තවම ලයිට් කපනවානේ. මොකද ඒ ? ජනාධිපතිට අවනත නැද්ද ?**

**පිළිතුර:-** ඒ ගොල්ලන් කිව්වට කොහොම ද කරන්නේ. තෙල් දෙන නිසා ලයිට් දෙන්න කියනවා. ඒවා දේශපාලන කතා. කිව්වට ඉතින් අවශ්‍ය ප්‍රමාණයට තෙල් ලැබෙන්නෙත් නැහැනේ. කරන්න බැරි නම් මොනව කරන්න ද? මේ වගේ ප්‍රශ්න ගැන ප්‍රායෝගිකව බලන්න අවශ්‍යයි. විදුලිය දෙන්න පුළුවන්. විදුලිය නිෂ්පාදනයට යොදා ගන්නා ජලය හා ඉන්ධන සීමා කරල නම් ප්‍රමාණවත් තරම් දෙන්නේ නැත්නම්. ඉල්ලුම වැඩිනම් මොනවද කරන්නේ? කරන්න වෙන්නෙ විදුලිය සීමා කිරීම පමණයි. නිෂ්පාදනය අඩුවෙන විට බෙදා හැරීමම සීමා කරන්න වෙනවා. ඒක තමයි සාමාන්‍ය දේ. කවුරු කිව්වත් එච්චරයි. දවසකට, දෙකකට විදුලිය දෙනවා නම්, සියලු ශක්තියෙන් විදුලිය නිපදවල දීලා ඉවර කරන්න පුළුවන්. නමුත් විදුලිය අඛණ්ඩව සැපයිය යුතු දෙයක්. ඒ නිසා ප්‍රශ්න විසඳන තුරු ඉදිරියටත් විදුලිය පාවිච්චි

> අඛණ්ඩව විදුලි සැපයුමක් ලබාදීම වෙනුවෙන් ගතහැකි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා උපදෙස් දී තිබෙනවා.

> ජනාධිපතිවරයා හා රජයේ ප්‍රධානීන් මොනවා දෙසා බෑවත් විදුලිය කැපීම නතර වී නැත. පැය 7 ක් 7 1/2 ක් ලෙසට දීර්ඝ කාලයක් විදුලිය කැපීම සිදුවිය. සුළු අඩුවීමක් සිදු වූයේ ඉකුත් බදාදාය.

කළ හැකි ආකාරයට බෙදා හැරීම සිදු කරන්න තිබෙනවා. ඒ සඳහා පාලනයක් අවශ්‍යයි. විදුලිය කපන්නෙ ඒ නිසයි.

මේ වන විට ජලයෙන් විදුලිය නිෂ්පාදනය කළ හැක්කේ මෙ.වො. 436 ක ප්‍රමාණයක්. ඉකුත් 8 වැනිදා වන විට දිනකට පමණක් ගිගාවොට් පැය 45 ක් පාවිච්චි කරලා තියෙනවා. එහෙම වුණොත් තව දින 10 කට ජලය තියෙනවා. අප්‍රේල් අග වෙනතුරු මේ ගානට යන්න



පවිත්‍රා වන්නිආරච්චි

පුළුවන්. ජලය ආරක්ෂා කරගෙන පාවිච්චි කළ යුතු වෙනවා. කියන්නත් වාලේ ජලයෙන්ම විදුලිය නිෂ්පාදනය කර බෙදා හරින්න බැහැ. ජලය හිඟවන විට පාලනය කළ යුතු වෙනවා. දැන් සිදුවන්නේ එයයි. ඇතැම් ජලාශවල ජලය විදුලිය සැපයීමට පමණක්ම යොදා ගන්න පුළුවන් කමක් නැහැ. කෘෂිකර්මයටත්, බීමටත් ප්‍රමුඛ ස්ථානය ලබා දීමට සිදුවී තිබෙනවා.

ඒ වගේ තත්ත්වයක් යටතේ තනිකරම ජලයෙන් විදුලිය නිපදවන්න බැහැ.

## අඛණ්ඩ විදුලිය සැපයුමකට ජනාධිපති උපදෙස් දුන්නා

**විදුලිබල ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි**

නිලධාරීන් එසේ කියද්දී විදුලිබල ඇමැතිනිය කියන්නේ කුමක් ද? අපි ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගෙන් විමසීමු.

ජනතාව අසීරුවට පත් නොවන ආකාරයට විදුලිය සැපයීම රජයේ ප්‍රධාන අභිමතාර්ථයයි. ඒ සඳහා අඛණ්ඩව විදුලිය සැපයීමට පියවර ගන්නා ලෙසට ජනාධිපතිවරයා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබෙනවා.

**විදුලිබල ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය එසේ ප්‍රකාශ කළාය.**

අඛණ්ඩව විදුලි සැපයුමක් ලබාදීම වෙනුවෙන් ගතහැකි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා උපදෙස් දී තිබෙනවා. ඒ අනුව විදුලිබල අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, සුනිත්‍ය බලශක්ති අධිකාරිය, වාරිමාර්ග අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය හා

> විදුලිය ලබාදීම බොහොම නරක තත්ත්වයක තියෙන්නෙ. ජලය මගින් විදුලිය නිෂ්පාදනය කිරීමත් බෙහෙවින්ම අඩුවෙලා. ඊට අමතරව ඉන්ධන ලැබෙන්නෙත් නැහැ. ගල්අඟුරු තියෙන ප්‍රමාණයත් ලබන ජූනි - ජූලි වගේ වෙන විට අවසන් වෙනවා. දැනට නොරොච්චෝල ගල්අඟුරු බලාගාරයෙන් විදුලිය මෙ.වොට් 900 කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබනවා. ඒක මේ වනවිට නොඅඩුව ලබා දෙනවා. ඒත් ලබන ජූනි, - ජූලි වන විට දැනට ගබඩා කර තිබෙන ගල්අඟුරු අවසන් වෙනවා



අනිල් ඉඳුවර

ආරක්ෂක අමාත්‍යාංශය ආදී ආයතන රැසක සහභාගිත්වයෙන් පැවැති සාකච්ඡාවක දී මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කිරීමට තීරණය කරනු ලැබුවා.

පවතින වියළි කාලගුණික තත්ත්වය යටතේ හා ඉන්ධන ප්‍රශ්නය මත දැනට අඛණ්ඩව විදුලිය සැපයීම දුෂ්කරයි. පැය විසිතර පුරාම විදුලි සැපයුම අවශ්‍ය රෝහල්, ආරක්ෂක ස්ථාන, ආයෝජන ප්‍රවර්ධන කලාප වැනි ස්ථානවලට අඛණ්ඩව විදුලිය සැපයිය යුතු වෙනවා.

කාසල්රී, මාඋස්සාකැලේ, කොත්මලේ ජලාශ ආශ්‍රිතව වැසි ඇතිවිය හැකි බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර තිබෙනවා. අපි ඒ ගැන බලාගෙන ඉන්නවා. අඩුගානේ මිලි මීටර් 25 ක් වත් ජලාශ පිරුනොත් සුළු සහනයක් හෝ ලබාගන්න පුළුවන් වේවි.

> මේ වන විට ජලයෙන් විදුලිය නිෂ්පාදනය කළ හැක්කේ මෙ.වො. 436 ක ප්‍රමාණයක්. ඉකුත් 8 වැනිදා වන විට දිනකට පමණක් ගිගාවොට් පැය 45 ක් පාවිච්චි කරලා තියෙනවා. එහෙම වුණොත් තව දින 10 කට ජලය තියෙනවා. අප්‍රේල් අග වෙනතුරු මේ ගානට යන්න පුළුවන්. ජලය ආරක්ෂා කරගෙන පාවිච්චි කළ යුතු වෙනවා

රටේ ජනතාවට පීඩාවට නොවන ආකාරයට විදුලිය සැපයීම රජයේ අවශ්‍යතාවයි. අඛණ්ඩව විදුලිය සැපයීමට පියවර ගන්නැයි

## කොළඹට ලයිට් නොකැපුවත් පිට පළාත්වල පැය හතහමාරක් විදුලිය කැපුවා

ජනාධිපතිතුමා සියලු වගකිව යුතු පාර්ශ්වයන්ට උපදෙස් දුන්නේ ඒ නිසයි.

ඒ සඳහා ඉන්ධන ගෙන්වීම, සංචිත පවත්වා ගෙනයාම, විදුලිය උත්පාදනය, ඉන්ධන හා ගල්අඟුරු ගෙන්වීම අඛණ්ඩව සිදු කිරීමට පියවර ගනිමින් සිටිනවා.

මාර්තු 5 වැනිදා සිට විදුලිය කප්පාදුවක්

## ජල විදුලිය තියෙන්නේ අප්‍රේල් 6 වෙනතුරු පමණයි

සිදුනොකරන බවට නිලධාරීන් සඳහන් කර තිබුණා. මේ වන විටත් නැව්වලින් තෙල් ගොඩබෑමේ කටයුතු සෙමින් සිදුවෙමින් පවතිනවා. සියල්ල යථා තත්ත්වයට ඒවි. බොහොම ළඟදීම

පෞද්ගලික, බලාගාර 4 කින් නිෂ්පාදනය කරනු ලබන මෙගාවොට් 250 ක විදුලියත් ජාතික පද්ධතියට එකතු කිරීම සඳහා යෝජනා වී තිබෙනවා. නමුත් ඔවුන් ඒ සඳහා ගිවිසුම් ගතවිය යුතු බවට ඉල්ලා තිබෙනවා. ඉහළ මිල ගණන්වලට මෙම විදුලිය මිලදී ගැනීම ගැන මේ දිනවල දෙවරක් සිතන්න වී තිබෙනවා. මෙම ආයතනවලින් විදුලි මිලදී ගැනීමට සිදුවී ඇත්තේ ඉහළ මිල ගණන්වලට. මේ ප්‍රශ්නය බොහෝ කෙටි කාලයකට තියෙන එකක්. කලබලවිය යුතු නැහැ. ඉක්මනින් විසඳේවි. අමැතිනිය කීවාය.

## මාර්තු 8 වැනි දින දිනට තාප බලාගාරවල තත්ත්වය


| | |
|---|---|
| වෙස්ට්කෝස් (මෙ. වො. 270) | විදුලිබල මණ්ඩලය මගින් ඉන්ධන සඳහා මුදල් ගෙවා ඇත. |
| සොජිට්ස් (මෙ.වො. 130) | දැනට වසා ඇත. |
| කොලොන්නාව - 2 (මෙ.වොට.10) | වසා ඇත |
| කොලොන්නාව - 1 (මෙ.වො. 10) | වසා ඇත |
| තුල්හිරිය (මෙ.වො. 10) | වසා ඇත |
| මතුගම (මෙ.වො. 20) | වසා ඇත |
| Small GTS (මෙ.වො. 16) | තෙල් ලැබෙන දිනයක් සඳහන් නොවේ |
| කැලණිතිස්ස GT 7 (මො.වො. 115) | තෙල් ලැබෙන දිනයක් සඳහන් නොවේ |
| කැලණිතිස්ස CCY (මෙ.වො. 150) | තෙල් ලැබෙන දිනයක් දක්වා නැත |
| උතුර ජනනි (මෙ.වො. 25) | තෙල් ලැබෙන දිනයක් දන්වා නැත |
| වරාය බාජ් (පාවෙන) මෙ.වො. 60) | තෙල් ලැබෙන දිනයක් දන්වා නැත |
| සපුගස්කන්ද B (මෙ.වො. 63) | ඉන්ධන ඇත |
| සපුගස්කන්ද A (මෙ.වො. 70) | දින 4 කට ඉන්ධන ප්‍රමාණවත්ය |


සටහන
දයාසීලි ලියනගේ




## SLT-MOBITEL CELEBRATES


# THE GRADUATION OF SLT TRAINING CENTRE STUDENTS WITH WORLD-CLASS EDUCATION.










Guest of Honour – Professor Rodney Day – Dean of the School of Physics, Engineering and Computer Science, University of Hertfordshire, UK.






The graduation ceremony of the SLT Training Centre (SLTTC) students was held on 9th of March 2022 at the BMICH. SLT-MOBITEL, The National ICT Solutions Provider, is driving the nation towards a future tech-hub by providing the youth with world-class engineering and technological education through the SLT Training Centre.

SLT Training Centre is the only franchise for the University of Hertfordshire's BEng (Hons) degree programme in South Asia and it is recognised by the University Grants Commission of Sri Lanka. Recently Pearson BTEC Higher National Diploma in Electrical and Electronic Engineering became the only programme to obtain the NVQ level 6 equal status from the Tertiary and Vocational Education Commission of Sri Lanka. The central location and state-of-the-art resources make SLT Training Centre the best place for your studies.










"Best Student of BEng (Hons) Electronics and Communication Engineering"
**Mr. K. Neron Nelundeniya**




"Gold Medal for the Best Academic Performance of BTEC HND Programme"
**Miss. R. M. Nawanjana Heshani**



"Best Student of BEng (Hons) Electrical and Electronic Engineering"
**Mr. L. Manupiya Illeperuma**

### OUR ACHIEVEMENTS





- International Tutor of the Year 2016
- International Learner of the Year 2016
- International Centre of South Asia in the Year 2016/17

### OUR COURSES

**University of Hertfordshire, UK - BEng (Hons)**
**Bachelor of Engineering – Honours Degrees**

- Electrical & Electronic Engineering
- Electronics & Communication Engineering
- Electronics & Computer Engineering

**Pearson, UK - BTEC**

- International Level 3 Foundation Diploma in Engineering
- Level 5 HND in Business
- Level 5 HND in Digital Technology
- Level 5 HND in Electrical & Electronic Engineering

**Other Courses**

- Optical Fibre Courses
- Network Security Courses
- Certificate in Applied Information Technology
- NVQ Level 4 National Certificate for Telecommunication Technicians

**SLT TRAINING CENTRE** | **0112 956 633**
www.slt.lk/en/training

*In affiliation with:*
University of Hertfordshire UH | Pearson | BTEC

**Welisara**
**0112 956 721**

**Moratuwa**
**0112 645 371**

**Kandy**
**0812 388 500**

**SLTMOBITEL**
The Connection

# රට අන්තිමට බංකොලොත් කරල දාපු මේ ආණ්ඩුවෙන් තවත් ලබාගන්න දෙයක් නෑ

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික

## සමන්ත විද්‍යාරත්න

සටහන
**ප්‍රියන්ත කොඩිප්පිලි**

**රටේ වත්මන් දේශපාලන තත්ත්වය සහ ඒ සඳහා ඔවුන්ගේ මැදිහත් වීම පිළිබඳ කරුණු දක්වමින් මෙවර 'මුහුණට - මුහුණ' සංවාදය හා එක්වන්නේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සමන්ත විද්‍යාරත්නයි.**

**ප්‍ර: අද මේ ආණ්ඩුවට විරුද්ධව සාමාන්‍ය ජනතාව පාරට බහින මට්ටමටම ඇවිත්. විපක්ෂයේ අය රැස්වීම් තිය තිය ගියාට ඔවුන්ගේ ආණ්ඩු විරෝධී සටන පණ මදි කියලයි මිනිස්සු කියන්නේ.**

දැන් නායකත්වයක් දීල කරගන්න තියෙන්නෙ මේ රටේ ආණ්ඩුවක් හැදීම පමණයි. විපක්ෂය විදියට බොහෝ අය පහුගිය කාලය පුරාම ආණ්ඩුවට බලපෑම් කළානේ. ඒ බලපෑම් කළේ ආණ්ඩුවෙන් යමක් දිනාගන්නනේ. පෝර නැතිවෙනකොට පෝර ලබා ගන්න. වන්දි ලබාගන්න. දැන් මේ ආණ්ඩුවෙන් බලපෑම් කරලා ලබාගන්න දෙයක් නෑ. ඒ කියන්නේ මේ ආණ්ඩුවට දැන් මොකුත් කරන්න බෑ. දැන් ඕනෑ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්න පුළුවන් රටේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙන්න පුළුවන් පාලනයක් මිසක් මේ ආණ්ඩුවෙන් යමක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් නෑ. ආණ්ඩුව සම්පූර්ණයෙන්ම අසමත්. ජනතාව දිනවිය හැකි ආණ්ඩුවක් පත්කර ගැනීමේ අවශ්‍යතාව තමයි දැන් රට හමුවේ තියෙන්නේ. ඒකට වටපිටාව සකස් කරන්න ඕනෑ. නමුත් මේ පීඩාවට පත්වෙච්ච ජනතාව වෙනුවෙන් අවසාන මොහොතේ හෝ යමක් ලබාගන්න පුළුවන් ද කියන උත්සාහයෙන් ආණ්ඩුවට බලපෑමක් කරනවා. නමුත් ඇත්ත අපි තේරුම් ගන්න ඕනෑ. මේ ආණ්ඩුවට තව කරන්න පුළුවන් දෙයක් නෑ. බිඳ වැටුණු රට ගොඩනැගිය හැකි ආණ්ඩුවක අවශ්‍යතාව වෙනුවෙන් පෙළගැහෙන්න ඕනෑ දැන්.

**ප්‍ර: මේ ආණ්ඩුව ගෙදර යවල ගේන ආණ්ඩුව මොකක්ද කියන ප්‍රශ්නය මිනිස්සුන්ට තියෙන්නේ. කවුරු බලයට ගෙනාවත් මේ අර්බුදවලින් ගොඩ එන්න පුළුවන් ද කියන සැකයක් ඔවුන්ට තියෙනවා.**

රටේ ජනතාව මේ ගැන සංවාදයක ඉන්නවා. මොකද නිදහසින් පස්සේ අවුරුදු හැත්තෑ හතරක් මේ රටේ ජනතාව අත්හදා බලල තියෙන ආණ්ඩු වර්ග දෙකයිනෙ තියෙන්නේ. කොළ පාට ආණ්ඩු සහ නිල් පාට ආණ්ඩු. මේ පවතින අර්බුදවලට වගකියන්න ඕනෑ රාජපක්ෂවරු විතරක් නෙවෙයි. අවුරුදු හැත්තෑහතරක් රට පාලනය කරපු කවුරු කවුරුත් මේවට වගකියන්න ඕනෑ. ණයට කෑම. විකුණාගෙන කෑම. හොරා කෑම මේ හැම කාලයකදීම සිද්ධ වුණා. මේකට වගකියන්න ඕනෑ නිල් කොළ දෙගොල්ලොම. ඒක නිසා දැන් විකල්පයක් ඒ දෙකෙන් හොයන්න බැනේ. ඉතුරුවෙලා තියෙන එකම විකල්පය, ජනතාවට විශ්වාසයක් ගොඩනැගිල තියෙන එකම කඳවුර වෙන්නේ ජාතික ජනබලවේගය විතරයි. තවත් එක් ආණ්ඩුවක් හදනවා කියන එක නෙවෙයි. දැන් රටේ අවශ්‍යතාව. දැන් ජාතික අවශ්‍යතාවයක් වෙලා තියෙන්නේ රටේ මේ තියෙන ප්‍රශ්නවල

## අරෙහෙන් මෙහෙන් පනින ගෙම්බො අපි ගන්නේ නෑ

ප්‍රශස්ත විසඳුම් දෙන්න පුළුවන්, හොරකම දූෂණය, වංචාව පිටුදකින්න ප්‍රගතිශීලී පාලනයක්. ඒකට සුදුසුකම් තියෙන එකම කඳවුර ජාතික ජනබලවේගය පමණයි. මේක ජාතික ව්‍යාපාරයක්. මැතිවරණ බලාගෙන විතරක් ගොඩනැගුණු එකක් නෙවෙයි මේක. ජාතියක් හැටියට අර්බුදයකට යද්දී ඒකට මුහුණ දෙන්න ජාතික ව්‍යාපාරයක් අවශ්‍යයි. දැන් මේකට තියෙන ප්‍රමුඛ කාර්යය තමයි බලය ලබා ගැනීම සහ බලය ලබාගෙන රට ගොඩනැගීම කියන කාරණය. අපි ඒ නිසා ජනතාවට මතක් කරනවා ඒ අවශ්‍යතාව සඳහා අපිත් එක්ක පෙළගැහෙන්න කියලා.

**ප්‍ර: රටේ මේ අර්බුදයට වගකියන්න ඕනෑ අවුරුදු හැත්තෑ හතරක් රට පාලනය කරපු නිල් පාට සහ කොළ පාට දෙගොල්ලො කියල ඔබලා චෝදනා කරද්දී ඒ අය ඔබට පෙරළා චෝදනා කරනවා ජේ.වී.පී. එක පහුගිය කාලේ ඒ හැම ආණ්ඩුවකම කොටස්කාරයෝ වෙලා හිටිය සහ සහාය දුන්නා මතක නැද්ද කියලා. ඒ දෙගොල්ලට වරද පටවලා ජේ.වී.පී. එකට අත පිහිදාගන්න බෑ කියල ඒ අය කියන්නේ.**

ඒ චෝදනාව එල්ල කරන්නේ කවුද? ඒ චෝදනාව එල්ල කරන්නේ අසාර්ථක ආණ්ඩු කරපු ඔය දෙගොල්ලොම තමයි. ඒ කට්ටිය බලනව ඒ කට්ටියගෙ මල්ලට අපිවත් දාගන්න පුළුවන් ද කියලා. ඒක සාධාරණ නෑ වගේම නිවැරදි නෑ. ඔය නිල් කොළ ආණ්ඩුවලට මේ රට ගොඩනගන්න බෑ කියලා අපි හොඳටම දන්නවා. යම් කෙනෙකුට ඔය වගේ චෝදනාවක් එල්ල කරන්න පුළුවන් වෙන අවස්ථාව තමයි 2004 අපි ගහපු සන්ධානේ. ඒක තමයි එකම අවස්ථාව. අපි යම් සම්බන්ධයක් තිබුණ නම් තිබුණෙ නිල් පාටත් එක්ක විතරයි. කොළ පාට එක්ක එකතුවෙලා අපි ආණ්ඩු කෙරුවෙ නෑ. චන්ද්‍රිකා ජනාධිපති වෙලා ඉද්දි 2004 රටේ විශේෂ තත්ත්වයක් පැනනැගුණා. ඒක රටක් විදියට අපි අනතුරට පත්වෙන්න ගිය මොහොතක්. රනිල් වික්‍රමසිංහ පාලනය යටතේ රට බෙදන්න ඔන්න මෙන්න ආවා. අන්තර් පාලන දෙළ පිදේනිය දීලා රට බෙදුම්වාදය දක්වා දක්කලා රට අනතුරකට පත්කරන්න යන වෙලාවෙ පක්ෂයක් විදියට අපි කල්පනා කළා මේ අනතුර වළක්වන්නේ කොහොමද කියලා. ඒ කාලේ 'යළි පුබුදමු ශ්‍රී ලංකා' වැඩසටහන ගෙනල්ලා මේ රටේ බොහෝ සේවාවන් පෞද්ගලීකරණය කරන්න උත්සාහයක් රනිල්ලගෙ ආණ්ඩුව ගත්තා. මේ කරුණු දෙක ඒ වෙලාවෙ රටේ තිබුණු බරපතළම ප්‍රශ්න. මේකට අපිට තනියම මුහුණ දීලා වළක්වන්නත් බැරි නිසා මේ කොඩිවිනය කපන්න අපි ගෙනාපු ක්‍රමය තමයි චන්ද්‍රිකාලා එක්ක ගහපු සන්ධානේ. චන්ද්‍රිකාලට තිබුණෙත් බලය ලබා ගැනීමේ ඕනෑකමක්. අපිට තිබුණ රට බේරා ගැනීමේ ඕනෑකමක්. අපි එයාලට කොන්දේසි දාලා ආණ්ඩුවක් පිහිටෙව්වා. ඒකෙන් අපි රටට ජයග්‍රහණයක් අරගෙන දුන්නා. ඒක කාටවත් අමතක කරන්න බෑ. අපි දැනගෙන හිටියා චන්ද්‍රිකාලා මහින්දලා එක්ක රට ගොඩනගන්න බෑ කියලා. අපි එදා සන්ධානෙ ගැහුවෙ එදා රට මුහුණ දීපු අනතුරෙන් රට ගලවා ගන්න. ඒ මොහොතේ අපි ඒක කළා. අපිට ඔවුන් එක්ක ගමනක් යන්න බැරි මොහොතේ ඒ ආණ්ඩුවෙන් ඉවත් වුණා. අපි ඒ ආණ්ඩුවෙ ඉඳගෙන කරපු වැඩ ටික රටට අයහපතක් වුණා කියලා ඔය කාටවත් කියන්න බෑ.

**ප්‍ර: මැතිවරණයක් පේන මානෙක නැතුව කොහොමද ආණ්ඩු පෙරළන්නේ? අනික එන්.පී.පී. එකේ ඔය ගැම්ම තව අවුරුදු දෙක තුනක් ඔය විදියට අල්ලගෙන ඉන්න පුළුවන්ද?**

අපි මේ ආණ්ඩුවට බලපෑම් කරලා ඉල්ලීම් දිනාගන්න බැරි නිසා තව ආණ්ඩුවක් හදනවා කියන අදහසක් නෙවෙයි තියෙන්නේ. කොහොමත් අපි ආණ්ඩුවක් හදනව කියන තැන ඉඳන් ජාතික ජනබලවේගය වැඩ කරන්නේ. රට අන්තිමටම බංකොලොත් කරලා දාපු මේ ආණ්ඩුවෙන් ලබාගන්න පුළුවන් දෙයක් නෑ තවත්. අපිට තියෙන්නේ මේ රට අරගෙන හදන එක තමයි. ඊට මෙහා දෙයක් නෑ. ඡන්දයක් ළඟදී නෑ කියලා ආණ්ඩුවට මේ විදිහට දිගමට යන්න බෑ. ඡන්දයක් දෙන්නේ නැත්නම් ගන්න ක්‍රම තියෙනවා. ඡන්ද දෙන්නේ නැතුව එයාලට ඉන්න පුළුවන් වගේම ඡන්ද ගන්නත් අපිට පුළුවන්. අපි ජයග්‍රහණයක් වෙනුවෙන් පසුබිම සකස් කරගෙන යන එක තමයි මේ ටිකේ කරන්නේ. ඡන්දය වෙලාවට අපි ගන්නම්. දැනටත් ඡන්ද දෙකක් කල් ගිහින් තියෙන්නේ. පළාත් පාලන ඡන්දය කල් දාලා. පළාත් සභා තියන්නේ නැතුව කට්ටි පනිනවා. දැන් පාර්ලිමේන්තුවත් විසුරුවන්න කාලය ඇවිත් තියෙන්නේ. ඒකට අපි සූදානම් වෙමින් යන්නේ.

**ප්‍ර: මැතිවරණ නැති කාලේ ජේ.වී.පී. එකට මාර චියර් එකක් හම්බවෙනවා. මැතිවරණයක් තිබ්බම තමයි ඡන්ද නැත්තේ. සීයට තුනක් තියාගෙන ඊළඟ ආණ්ඩුව හදනවා කියන එක අධි තක්සේරුවක් නෙවෙයිද?**

අපි අධි තක්සේරුවක නෑ. අපි හරි තක්සේරුවක ඉන්නවා. අපි රටේ ජනතාවට කිව්වා මේ රටට මේ තත්ත්වය උදාවෙනවා කියලා. රටට අත්විය හැකි ඉරණම ගැන අපි අනාවැකි පළ කළා. අද ඒ සියල්ල ඇත්ත වෙලා තියෙනවා. ඡන්දවලදී ජනතාව හැසිරෙන විදිය අපි නොදන්නවා නෙවෙයි. පහුගිය ඡන්දවලදී හැසිරුණෙ එහෙම තමයි. නමුත් හැමදාම එක විදියට වෙන්නෙ නැනේ. ජනතාව තත්ත්වය තේරුම් ගන්න මොහොතක් එනවා. අපි ජනතාවට ආපහු මතක් කරනවා පහුගිය කාලෙ අපි කියපුව නැවත අහන්න කියලා. අපි කියන දේ අහන්න ලක්ෂ ගණනින් අපි වටා එකතු වුණා. ඒ හැමදෙනාම අපිට ඡන්දෙ දෙනවා කියන මතයේ ඉන්න බෑ. ඒවා ඡන්ද හැටියට රටේ මිනිස්සු හඳුණ ගන්න ඇති. ඒත් අපි එහෙම අධි තක්සේරුවක හිටියෙ නෑ. අපේ තරම අපි දන්නවා. එද අපි කියපු දේ අහපු ජනතාව අද අපිත් එක්ක එකතුවෙමින් ඉන්නවා. ඇටයක් හිටවපු ගමන් ගෙඩි කන්න බෑ. අපි පහුගිය කාලේ මේ රටේ කෙරුවේ අස්වැද්දීමක්. ජනතාව අතරට අපේ මතය ගෙනිච්චා. ඒකෙ ප්‍රතිඵලය ඉදිරියේ ලැබෙයි. එදාට වඩා ජනතාව අද සත්‍යය තේරුම් අරගෙන ඉන්න බව අපිට පේනවා.

**ප්‍ර: ඔහොම කිව්වට ඔබලට ලේසි වෙන එකක් නෑ. මොකද විමල් වීරවංශලා එහෙමත් ඇමැතිකම් අතඇරලා දාලා දැන් ආණ්ඩුවෙන් ගේම ඉල්ලනවා. ආණ්ඩු විරෝධී ඡන්ද එතෙන්ටත් එකතුවෙයි නේද?**

ඒකත් ඉතින් ආණ්ඩුවෙම රංගනයක්නේ. බල්ලා මැරෙන්න කිට්ටු වෙද්දි මැක්කො පනිනවනේ වෙන බල්ලො හොයාගෙන. ඒක සාමාන්‍ය ස්වභාවය. වීරවංශලා ඇතුළු කණ්ඩායම මේ සියලු දෙයින් නිදෙස්කොට නිදහස් කරන්න බැනේ. මේ අපරාධවල පීතෘවරු ඒගොල්ලෝ. මේ ජනාධිපතිවරු ගෙන්නුවෙ මේ මුදල් ඇමැතිවරු ගෙන්නුවේ එයාලනේ. දැන් අපි සුද්දයි කියල අත පිහදා ගන්න බෑ ඒගොල්ලන්ට. එයාල මේ අපරාධවලට වගකියන්න ඕනෑ. බළල මල්ලෙන් එළියට පැන්නා වගේ වාසුදේවගේ කටින් කියවුණා ආණ්ඩුවෙන් ගැලවිලා යන ඡන්ද ජාතික ජනබලවේගයට යන එක නවත්තන්න, විපක්ෂයට යන එක නවත්තන්න අපි මල්ලක් හැදුවා කියලා. දැන් මල්ල අල්ලගෙන ඉන්නවා. එහෙම අල්ලගෙන ඉඳලා වැටෙන ඡන්ද ටික ආපහු කාගෙ හරි කකුල් දෙක ළඟ තියල මොනව හරි දෙයක් ලබාගෙන සැපෙන් ඉඳිවි. ජනතාව මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. ඔය වගේ කතා අපි හොඳට අහල දැකලා තියෙනවනේ. මේ අයගෙ උගුලට අහුවෙන පොඩි පිරිසක් නෑ කියලා අපිට කියන්න බෑ. ඒ අයට අපි කියන්නේ ඇත්ත තේරුම් ගන්න කියලා.

**ප්‍ර: මෙහෙම ආණ්ඩුවෙන් එළියට එන අයට සමගි ජනබලවේගය නම් එයාලට එකතුවෙන්න කියල ආරාධනා කරනවා දැක්කා. ජාතික ජනබලවේගයේ දොරවල් මේ වගේ ආණ්ඩුවෙන් එළියට බහින අයට ඇරිලද තියෙන්නේ?**

ඔය දෙරවල් ඇරිච්ච තැන්වලට එයාල ගියාට අපිට ප්‍රශ්නයක් නෑ. එයාලට ගැලපෙන තැන් ඒවා. ඔය ඔක්කොම එක වගේ කුරුවල්වෙලානේ. හැබැයි ජාතික ජනබලවේගයට කවුරු හරි සම්බන්ධ කරගනිද්දි ඒක ජනතා විමුක්ති පෙරමුණට විතරක් තීන්දු කරන්න බෑ. ජාතික ජනබලවේගය කියන්නේ පක්ෂ හා සංවිධාන රාශියක එකතුවක්. ඒක ඇතුළෙ සාකච්ඡා කරලා තමයි තීන්දු ගන්නේ. කවුද ඒ සමඟ එකතුවෙන්න ඕන කියලා අරහෙන් මෙහෙන් පනින ගෙම්බො මේක අස්සට දාගන්න කොහොමත් සූදානමක් නෑ. මේක රට ගොඩනගන්න අවශ්‍ය චේතනාවක් තියෙන ප්‍රගතිශීලී මිනිස්සු ඉන්න වේදිකාවක්. ඒ වේදිකාවෙ ඉන්න සුදුසු මිනිස්සු විතරයි ඒකට නගගන්නේ.

**ප්‍ර: රටේ ප්‍රශ්න ගොඩක් තියෙද්දි ජේ.වී.පී. එක නිශ්ශංක සේනාධිපතිල වගේ අරගොල්ලො මේගොල්ලො එක්ක රණ්ඩු වෙවී ඉන්නවා කියලා සමහරු කියනවා.**

ඒ චෝදනාවෙ පදනමක් නෑ. ඕක අනිත් පැත්තටයි කියන්න ඕනෑ. අපි ආණ්ඩුව එක්ක හැප්පෙනවා. ඒ අතරේ නිශ්ශංක සේනාධිපතිලා ඇවිත් අපි එයාලා එක්ක හප්ප ගන්න හදනවා. අපි ඔය කියන නිශ්ශංක සේනාධිපති සත පහකට ගණන් අරගෙන නෑ. එයාට උත්තර දෙන්න ගිහිල්ලත් නෑ. අපිට ඔය කිසිම දූෂිතයෙක් හොරෙක් එක්ක ගනුදෙනුවක් නෑ. අපිට ප්‍රශ්න තියෙන්නේ ආණ්ඩුව සහ ඒකෙ නායකයෝ එක්ක. ඒක අපි බේරගන්න සූදානම්. එහෙම නැතුව වටේ ඉඳන් බුරන අය අදාළම නෑ.

**ප්‍ර: ගම්පහ රැස්වීමකදී විජිත හේරත්ගෙන් ප්‍රශ්න අහපු පුද්ගලයෙක් පොලිසිය ලවා ඉවත් කරපු එක ගැන සමාජ මාධ්‍යවල එහෙම ඔබලට විවේචන එල්ලවෙලා තිබුණා. දේශපාලනය කිරීම ගැන තව හිතන්න කියලා සමහරු යෝජනා කරල තිබුණා.**

එතන කිසිම ප්‍රශ්නයක් නෑ. ඉවසන්න පුළුවන් උපරිම ඉවසලා. ප්‍රශ්න අහන්න අවස්ථාව දීලා. ඒ පුද්ගලයගේ අදහස කියන්න දීලා සිනාමුසු මුහුණින් ප්‍රතිචාර දක්වල සීමාව ඉක්මවා ගියාම තමයි විජිත හේරත් සහෝදරයා පොලිසියට කියන්නේ රැස්වීමට බාධාවක් නිසා ඒ පුද්ගලයා ඉවත් කරන්න කියලා. අපි මුදල් ගෙවලා වෙන් කරපු තැනකට ඇවිත් ඒ වැඩේ කඩාකප්පල් කරන්න දෙන්න බැනේ. ඒ පුද්ගලයාගේ හැසිරීමෙන් තේරුණා මොකක්ද එයාගෙ අවශ්‍යතාව කියලා. අනිත් අතට ඔය වගේ සිදුවීමක් ආණ්ඩුවෙ රැස්වීමක හරි පොදුජන පෙරමුණේ රැස්වීමක හරි සමගි ජනබල වේගයේ රැස්වීමක වුණා කියලා. අපි සැලකුවා වගේ සලකයි ද එහෙනම්. ඔය ගැන අපිට චෝදනා කරන අය ගැන කනගාටුයි.

නිදහසින් පස්සේ අවුරුදු හැත්තෑ හතරක් මේ රටේ ජනතාව අත්හදා බලල තියෙන ආණ්ඩු වර්ග දෙකයිනෙ තියෙන්නේ.

කොළ පාට ආණ්ඩු සහ නිල් පාට ආණ්ඩු. මේ පවතින අර්බුදවලට වගකියන්න ඕනෑ

බල්ලා මැරෙන්න කිට්ටු වෙද්දි මැක්කො පනිනවනේ වෙන බල්ලො හොයාගෙන. ඒක සාමාන්‍ය ස්වභාවය

වීරවංශලා ඇතුළු කණ්ඩායම මේ සියලු දෙයින් නිදොස් කොට නිදහස් කරන්න බෑ

මේ ආණ්ඩුවට දැන් මුකුත්ම කරන්න බෑ

රාජපක්ෂවරු විතරක් නෙවෙයි, අවුරුදු හැත්තෑ හතරක් රට පාලනය කළ කවුරුත් මේකට වග කියන්න ඕනෑ

චන්ද්‍රිකා ජනාධිපති වෙලා ඉද්දි 2004 රටේ විශේෂ තත්ත්වයක් පැනනැගුණා. ඒක රටක් විදියට අපි අනතුරට පත්වෙන්න ගිය මොහොතක්.

බළල මල්ලෙන් එළියට පැන්නා වගේ වාසුදේවගේ කටින් කියවුණා ආණ්ඩුවෙන් ගැලවිලා යන ඡන්ද ජාතික ජනබලවේගයට යන එක නවත්තන්න, විපක්ෂයට යන එක නවත්තන්න

අපි අධි තක්සේරුවක නෑ. අපි හරි තක්සේරුවක ඉන්නවා. අපි රටේ ජනතාවට කිව්වා මේ රටට මේ තත්ත්වය උදාවෙනවා කියලා.

රටට අත්විය හැකි ඉරණම ගැන අපි අනාවැකි පළ කළා. අද ඒ සියල්ල ඇත්ත වෙලා තියෙනවා. ඡන්දවලදී ජනතාව හැසිරෙන විදිය අපි නොදන්නවා නෙවෙයි

පහුගිය ඡන්දවලදී හැසිරුණෙ එහෙම තමයි. නමුත් හැමදාම එක විදියට වෙන්නෙ නැනේ. ජනතාව තත්ත්වය තේරුම් ගන්න මොහොතක් එනවා

ඡන්දයක් දෙන්නෙ නැත්නම් ගන්න ක්‍රම තියෙනවා







# ශිල්පය විහිටන්න
## රත්න අභ්‍යාස පොත්

## පොත්වලට ගරු කරන්න

ලියන්න ලියන්න ආස හිතෙන 60 GSM හොඳම කොළවලින් නිෂ්පාදිත සුදුම සුදු පොත් පිටු අතරේ මුතුවන් රන් අකුරු මතකයේ රැඳෙන්නම ලියන්න. වෛවර්ණ පිටකවර සහ උසස් ප්‍රමිතිගත නිමාව. දිවයින පුරා පොත් අලෙවිසැල් සහ අනෙකුත් වෙළෙඳසැල්වලින් නම කියලම ඉල්ලන්න, රත්න අභ්‍යාස පොත්.

**63 වසරක අකුරු කිරීමේ අභිමානය - රත්න පොත් ප්‍රකාශකයෝ සමූහයේ ආයතනයකි.**

RATHNA EXERCISE BOOKS




**එකතුකරගත් පොල්කටු ඔබ ප්‍රදේශයේ නියෝජිත වෙත ලබාදීමට අමතන්න**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය / නියෝජිත බල ප්‍රදේශය | නම | දුරකතන අංකය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල | සමරකෝන් මහතා | 0774419222 |
| ගාල්ල | හික්කඩුව | උඩුගල්පිටිය මහතා | 0768500285 |
| ගාල්ල | හික්කඩුව | සොයිසා මහතා | 0766150433 |
| ගාල්ල | හික්කඩුව | කලන ෆයිබර් ආයතනය | 0777905550 |
| ගාල්ල | කරන්දෙනිය | පෙරේරා මහතා | 0768891923 |
| ගාල්ල | ඇල්පිටිය | අමිල සම්පත් මහතා | 0761010083 |
| ගාල්ල | ඇල්පිටිය | ජනප්‍රිය මහතා | 0774316210 |
| ගාල්ල | අම්බලංගොඩ | ධනුල කොයර් ආයතනය | 0912277028 |
| ගාල්ල | ගාල්ල දිස්ත්‍රික්කයම | පුබුදු මහතා | 0779213102 |
| ගාල්ල | ගාල්ල දිස්ත්‍රික්කයම | සමිත සඳරුවන් මහතා | 0715997052 |
| ගාල්ල | අම්බලංගොඩ/හික්කඩුව/ඇල්පිටිය/බලපිටිය | රංජිත් සොයිසා මහතා | 0775531867 |
| මාතර | මාතර | සෝමසිරි මහතා | 0777773974 |
| මාතර | දෙයියන්දර | කරුණාරත්න මහතා | 0775671701 |
| මාතර | තිහගොඩ | නිරෝෂන් මහතා | 0713816499 |
| මාතර | දෙවිනුවර | අමරවික්‍රම මහතා | 0769230736 |
| මාතර | වැලිගම/වැලිපිටිය | ගයාන් සංජීව මහතා | 0712590652 |
| මාතර | කඹුරුපිටිය/පස්ගොඩ/පිටබැද්දර/මුලටියන | ලක්මාල් මහතා | 0714485662 |
| මාතර | මාතර දිස්ත්‍රික්කයම | සමර්සෙට් හෝල්ඩින්ග්ස් ආයතනය | 0773852274 / 0773622504 |

පොල් සංවර්ධන අධිකාරියේ විශේෂ පණිවිඩයකි

වැඩි විස්තර සඳහා අමතන්න - 076 1418765 / 076 9901029



# ඇමැතිකම් පූජා කළේ නෑ එයාලව අයින් කළා

සමගි ජන බලවේගයේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

**එස්.එම්. මරික්කාර්**

**ආණ්ඩුවේ අර්බුදය පුපුරා යද්දී විපක්ෂය කරමින් සිටින්නේ කුමක්ද? මේ ඒ ගැන විමසමින් සමගි ජන බලවේගයේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. මරික්කාර් මහතා සමග කළ සාකච්ඡාවකි.**

**ප්‍රශ්නය - ඇමති ධුරවලින් ඉවත් කළ විමල් හා ගම්මන්පිල විපක්ෂයේ හිටගනී කියලා ඔබලා හිතුවට එහෙම වුණේ නෑ?**

පිළිතුර - අපි හිතුවෙ නෑ. ඒක අපේ වැඩකුත් නොවෙයි. එතුමන්ලා ආණ්ඩුවට ඇත්තටම විරුද්ධනම් දැන් එතුමන්ලට ආණ්ඩුවත් එක්ක දිග කන්න බෑ.

**ප්‍රශ්නය - "අපේ උත්සාහය ආණ්ඩුව හරි මගට ගැනීම කියලයි විමල් සහ ගම්මන්පිල කියන්නේ?**

පිළිතුර - එහෙමනම් ඉතින් බොරුවට ආණ්ඩුවට බැණ බැණ ඉන්න එපා. මට නම් සැකයක් තිනෙවා මේක මහින්ද රාජපක්ෂ මහත්තයාගේ තිර පිටපතක්ද කියලා.

**ප්‍රශ්නය - ඔබ එහෙම සැක කරන්නේ?**

පිළිතුර - හැමදාමත් මහින්ද රාජපක්ෂ මහත්තයාගේ තිර පිටපත්වල ප්‍රධාන නළුවෝ වෙලා හිටියේ ඒ ගොල්ලොනේ.

**ප්‍රශ්නය - රටේ ප්‍රශ්න කතා කරලා ඇමැතිකම් පූජා කරන තැනට ඔවුන් ආවා?**

පිළිතුර - ඇමැතිකම් පූජා කළේ නැනේ. අයින් කළානේ.

**ප්‍රශ්නය - ඒ අවදානම දැක දැකනේ එහෙම කතා කළේ?**

පිළිතුර - නෑ. නෑ. ඇමතිකම් පූජා කළේ නෑ. එයාලව අයින් කළා මිසක්

දැන් මෙහෙමනේ. ඒ ගොල්ලන් මේ ආණ්ඩුවට ගත්තා කියලා අඩුපාඩු පෙන්වලා දුන්නා කියලා වීරයෝ වෙන්නේ නෑ. මොකද හේතුව මේ සියල්ලේ කොටස්කාරයෝ ඒ ගොල්ලෝ. අතීත ක්‍රියාකාරකම් එක්ක බැලුවමත් ඊළඟට මේ ආණ්ඩුව ගේන්න කරපු කටයුතුත් අපට මතකයිනේ. ඒ ගොල්ලොම වැඩ බැරි ටාසන්කෙනෙක් ලී ක්වාන්යූට සම කළේ මහතිර් මොහොමඩ්ට සම කළේ. එහෙම නම් ඒගොල්ලන්ගේ තෝරා ගැනීම වැරැදියිනේ. ඒ ගොල්ලෝ රටට බොරුනේ කියලා තියෙන්නේ. ඒ නිසා මේක මේ රට බේරාගන්න හරි ආණ්ඩුව හරි මගට ගන්න හරි නොවෙයි. ඒ ගොල්ලන්ට බැසිල් රාජපක්ෂ පාලනය කරගන්න බැරිවීම නිසා ආපු ප්‍රශ්නයක්.

**ප්‍රශ්නය - මේ ආණ්ඩුව බලයට ආපු දවසෙ ඉඳන් විපක්ෂය තමන්ගේ පාක්ෂිකයන් ඉවක් බවක් නැතිව පාරට බැස්සුවා. රට අරාජික කිරීම නේද අරමුණ?**

පිළිතුර - මිනිස්සු නම් කියන්නේ විපක්ෂය කරනවා මදියි කියලයි. ගොවියා පොහොර නැති වුණාම පාරට ආවා. ගුරුවරුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් නොලැබෙනකොට ඔවුන් සටන් කළේ අපි කියලද? මිනිස්සු ගෑස්වලට පෝලිමේ ඉන්නේ අපි ගෙනල්ලා නොවෙයි.

**ප්‍රශ්නය - ඒවා යම් සංවිධානාත්මක බවක් තියෙනවා?**

පිළිතුර - ඔය වැඩ බැරි ටාසන් ආණ්ඩුව කියන කතානේ? කරන්ට් කපන එකට මිනිස්සු පන්දම් අල්ලන්නේ අපි කියලද? මිනිසුන්ව කබලෙන් ලිපට වට්ටලා රට බංකොලොත් රාජ්‍යයක් බවට පත් කරලා මිනිසුන්ව මහ පාරට ඇදලා දැම්මේ ආණ්ඩුව. අපිට බැණලා වැඩක් නෑ. අපි නොවෙයි ආණ්ඩුව කරන්නේ.

**ප්‍රශ්නය - විපක්ෂය තරගයට වගේ උද්ඝෝෂණ සංවිධානය කරන්නේ අනාගත ජනාධිපති අපේක්ෂකත්වය වෙනුවෙන්?**

පිළිතුර - පළමුවැනි දවසේ ඉඳලා අපි කල්පනා කළේ වගකිවයුතු විපක්ෂයක් හැටියට ආණ්ඩුවට තුනෙන් දෙකක ජන වරමක් ලැබිලා තියෙනවා නම් ආණ්ඩුවට ඒ කටයුතු කරන්න ඉඩ දෙන ගමන් වැරැදි අඩුපාඩු පෙන්වා දිය යුතුයි කියලයි. අපි ඒක කළා. උදහරණයක් විදියට කොරෝනා එනකොටම අපි කිව්වා මාස්ක් ගෙන්වන්න. එන්නත් ගේන්න. රෝහල් පහසුකම් වැඩි කරන්න කියලා. එහෙම කියනකොට අපිට හිනා වුණා. මේ ආර්ථික අර්බුදය එනකොටත් අපි කිව්වා රුපියල බලෙන් අල්ලන් ඉන්න එපා. ඒ වගේම ණය ගත්තු තැන්වලට ගිහිල්ලා ණය රීෂැඩුල් කරගන්න. ඩොලර් ආදයම වැඩි කරගන්න. අපි එහෙම කිව්වා. ඒවා අහපු නැති එකේ උද්දච්චකම හා තකතීරුකම නිසයි මෙහෙම වුණේ. මේ ගොල්ලෝ හිතාගෙන ඉන්නේ මොළ හතයි කියලනේ. හත්පොළේ ගා ගත්තට පස්සෙ අපට පේන්නේ මොළ භාගයක්වත් නෑ කියලයි.

**ප්‍රශ්නය - මම මතු කළේ ජනාධිපති අපේකෂකයන් ගැනයි. සජබය තුළත් ජනාධිපති අපේක්ෂකයන් බර ගණනක් ඉන්නවා?**

පිළිතුර - සමගි ජන බලවේගය තුළ ඉන්නේ සජිත් ප්‍රේමදස මහත්තයා විතරයි. ඕනෑම පෘතග්ජන පුද්ගලයකුට හීන දකින්න අයිතිය තියෙනවා. එහෙම හීන ඔබටත් තියෙනවා. මටත් තියෙනවා. සමගි ජන බලවේගයෙ නායකයා සජිත් ප්‍රේමදස මහත්තයයි. එතුමා තමයි ජනාධිපති අපේක්ෂකයා.

**ප්‍රශ්නය - ඒක සැරින් සැරේ මතක් කරලා දෙන්න වෙලා තියෙනවා නේද?**

පිළිතුර - නෑ. නෑ. ඔබ අහපු නිසයි මම කිව්වේ. කෙසේ වෙතත් ජනාධිපතිවරණය නොවෙයි මුලින් එන්නේ. පාර්ලිමේන්තු මැතිවරණයක් තමයි මුලින්ම එන්නේ.

**ප්‍රශ්නය - එහෙම කියන්න තියෙන සාධක?**

පිළිතුර - මේ ආණ්ඩුවට මෙහෙම යන්න බෑ. පාර්ලිමේන්තු මැතිවරණය ආවම ඒකෙ බලය අපි ගත්තාම සජිත් ප්‍රේමදස මහත්තයා අගමැති වෙනවා. එතකොට නිකම්ම ජනාධිපති අපේක්ෂකයා එතුමා. ඔය කාට කාටත් මහ ජන්දෙදි සජිත් ප්‍රේමදස මහත්තයාගේ නායකත්වයෙන් තියෙන සමගි ජන බලවේගයෙන් තමයි ඉල්ලන්න වෙන්නේ.

**ප්‍රශ්නය - කොහොම වුණත් එජාප නායක රනිල් වික්‍රමසිංහ තමන්ගෙ පරිණත බව පෙන්වමින් ඉන්නවා කියලා කිව්වොත්?**

# මේක මහින්ද රාජපක්ෂ මහත්තයාගේ තිරපිටපතක්ද කියලත් සැකයි

පිළිතුර - ඡන්ද පැරදිලා පක්ෂය නන්නත්තාර කරලා පරිණත බවක් පෙන්නුවා කියලා වැඩක් තියෙනවද අනේ

**ප්‍රශ්නය - ඔබේ මැනීමට අනුව ඉදිරියෙදී රටේ කුමක් වෙයිද?**

පිළිතුර - මේ රට බංකොලොත් රාජ්‍යයක් බවට පත්වෙලා ඉවරයි. මේක කොරෝනා කොරෝනා කිව්වට එහෙම එකක් නෑ. මේක මේ කොරෝනා නිසා නම් කලාපයේ අනික් රාජ්‍යවලත් තෙල් පෝලිම් තියෙන්න ඕනෑ. කරන්ට් කපන්න ඕනෑ. ඖෂධ නැති වෙන්න ඕනෑ. මේක තනිකරම අකාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය නිසා වෙච්ච දෙයක්. මේ ආණ්ඩුව ආපු ගමන්ම ගජ මිතුරන්ට මිලියන 800ක බදු සහන දුන්නා. එතැනින් රාජ්‍ය ආදයම නැති වුණා. හානිවෙච්ච රාජ්‍ය ආදයම ගන්න සල්ලි අච්චු ගැහුවා. ඒකෙන් උද්ධමනය වැඩි වුණා. ඒ සමගම රුපියලේ අගය බහින්න ගත්තා. රුපියල බලෙන් අල්ලාගෙන හිටිය. ඒ නිසා තමයි විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ඩොලර් එන්නෙ නැත්තේ. මේ අර්බුද ඔක්කොම ඒ නිසා.

**ප්‍රශ්නය - කොරෝනා බලපෑම ඔබ කියන තරම් සරල නෑ?**

පිළිතුර - කොරෝනා නිසා වැදුණේ සංචාරක කර්මාන්තයට පමණයි. ඒ අහිමි වෙච්ච ආදයම අපනයනයෙන් ලබාගෙන තියෙනවා. මෙතැන තියෙන්නේ අකාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය.

**ප්‍රශ්නය - 2019 දී ඔබලා භාර දුන්නෙත් හිස් වෙච්ච භාණ්ඩාගාරයක් සහිත රටක්?**

පිළිතුර - ඕක පරණ තැටියනේ. අපි තාමත් කියන්නේ මේ වෙලාවේ කරන්න තියෙන්නේ, මේවා කියලා වැඩකුත් නෑ. මේ ජනාධිපතිවරයා ආර්ථිකය ගැන මෙලෝ දෙයක් දන්නේ නෑ. ජනාධිපතිවරයා බැසිල්ගෙ හිරකාරයෙක්. බැසිල් රාජපක්ෂ මුදල් ඇමති වුණේ අජිත් කබ්රාල් ඉන්න නිසයි. මොකද බැසිල් ආර්ථිකය ගැන දන්නෙ නෑ. දැන් රුපියල සම්පූර්ණයෙන්ම අත හරින්න ඕනෑ. ඒක 270 ට ගියත් කමක් නෑ. මොකද මාසෙකට ඩොලර් මිලියන 400ක් විතර ඒවි. එහෙම ආවම ආනයනය වැඩි කරන්න පුළුවන්. ඒ නිසා රුපියල අතහැරලා ණය ගත්තු තැන්වලට ගිහින් අවුරුදු 3ක සහන කාලයක් ඉල්ලගන්න කියලයි අපි කියන්නේ. ඊට අමතරව කුහක නොවී රාජ්‍ය ආදයම ඩොලර්වලින් ලබා ගැනීම සඳහා වූ ප්‍රගතිශීලී වැඩපිළිවෙළවල් භය නැතිව කොන්ද පණ ඇතිව ක්‍රියාත්මක කළ යුතුයි.

# මුලින්ම එන්නේ පාර්ලිමේන්තු මැතිවරණයක්

**ප්‍රශ්නය - මොනවා කරන්න ගියත් සටන් පාඨ හදාගෙන විපක්ෂය පාරට බහිනවා?**

පිළිතුර - හොඳ දේට විරුද්ධ වෙන්නෙ කොහොමද? අපි කියන්නේ රුපියල අතහරින ගමන් ණය රීෂැඩුල් කරගන්න ගමන් අපේ ආර්ථිකය ඩිජිටල් ආර්ථියක් බවට පරිවර්තනය කරන්න ඕනෑ. උදහරණයක් විදියට එක් ලක්ෂ හැත්තෑ පන් දහක් විතර උසස් පෙළ සමත් වෙනවා. තිස් පන්දහයි හතළිස් දහයි විශ්වවිද්‍යාලයට යන්නේ. ඉතිරි අය මේ රටේ ආර්ථිකයට දයත්වය දෙන්නේ කොහොමද? රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල හදලා ඒ ළමයින්ට ඒ අවස්ථාව දෙන්න ඕනෑ. පිටරටට යන සල්ලි නතර කර ගන්න පුළුවන් වෙන්නේ එහෙමයි. ඒ විදියට අලුත් දේවල් හිතන්න බැරි ආණ්ඩුවකට මේ රට ගෙනියන්න බෑ.

සාකච්ඡා කළේ

**ප්‍රසන්න සංජීව තෙන්නකෝන්**



# තෙල් නැතුව අමාරුවේ වැටුණු කන්ටේනර් රථ

**රටම ගිලගත් ගෝලීය වසංගතයක් වූ කොවිඩ් අර්බුදයේදී ඇඳිරි නීතිය දමා රටම වසා දමා තිබියදීත්, දුෂ්කරතා දරාගනිමින් මහත් කැපවීමෙන් වැඩ කරමින් රටටත් ජනතාවටත් ශක්තියක් වූ බහාලුම් රථ ප්‍රවාහනය, පවතින ඩීසල් අර්බුදය හමුවේ බරපතළ ගැටලු ගණනාවකට මුහුණ දෙමින් සිටින බව එම සේවාවේ නිරත පිරිස් පවසති.**

හුස්ම ගන්නා ඔක්ෂිජන් වායුවේ සිට ජීවිතය ජීවත් කරවන ඖෂධ, ආහාර පාන, ඇතුළු අත්‍යවශ්‍ය බොහෝ දෑ ලංකාවට ආනයනය කරමින් තවත් සේවා රැසක් සපයන්නේ මෙම බහාලුම් ප්‍රවාහන රථවලින් බවත් පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ආනයන බහාලුම් බස්නාහිර පළාතෙන් පිටත ප්‍රදේශවලට ප්‍රවාහනය කිරීම සම්පූර්ණයෙන්ම ඇණ හිටින තත්ත්වයට පත්ව තිබෙන බව ද පවසන්නේ එක්සත් ලංකා බහාලුම් ප්‍රවාහන රථ හිමිකරුවන්ගෙ සංගමයේ සභාපති සනත් මංජුල මහතාය.

ඔහු පෙන්වා දෙන අන්දමට බහාලුම් ප්‍රවාහනය කරන කන්ටේනර් ප්‍රවාහන රථ 4000 ක් පමණ ඩීසල් නොමැතිවීම මත ධාවනය කිරීමට නොහැකි වී තිබේ. මෙම තත්ත්වය මත එදිනෙද අවශ්‍ය ආහාර, ඖෂධ ඇතුළු තවත් භාණ්ඩ ප්‍රවාහන සේවා සම්පූර්ණයෙන්ම අඩාළ වී ඇත.

අපේ ප්‍රවාහන කර්මාන්තයට තියෙන පළමුවෙනි ප්‍රශ්නය තමයි අපිට ආනයනික බහාලුමක් කොළඹින් ගත්තොත්, ඒ බහාලුම ගෙනියන්න ඕනෑ වව්නියාවට, අපිට වව්නියාවට ගිහිල්ල එන්න අවශ්‍ය තරම් ඉන්ධන අපේ ට්‍රක් එකේ තියෙන්න ඕනෑ. එහෙම ඉන්ධන නොතිබුනොත් අපිට ඒ අදළ තැන්වලට එම ආනයනික බහාලුම රැගෙන යන්න බැහැ. එතකොට අපි ඒ ජොබ් එක ගන්නේ නැහැ. ආනයනික බහාලුම වරාය තුළ ඉතුරු වෙනවා.

**එසේ ඉතුරු වුණු බහාලුම් මේ වන විට තියෙනවාද?**

ඇත්තෙන්ම ඔව්. මේ වන විට විශාල ප්‍රමාණයක් බහාලුම් වරාය තුළ තියෙනවා එළියට ගන්න බැරිව. ඒවාට ප්‍රමාද ගාස්තු ගෙවන්න සිද්ධ වෙනවා. ඒවා ගෙවිය යුතු වන්නේ ඩොලර්වලිනුයි. වරාය කිව්වහම, සීඅයිසීපී ටර්මිනල් එක වෙන්න පුළුවන්. එස්ජේජීටී ටර්මිනල් එක වෙන්න පුළුවන්. ඒ ටර්මිනල් දෙකටම සල්ලි යන්නේ අපේ රටෙන් පිටටයි. එකක් චීන. අනෙක් එක ඉන්දියා. ඒ දෙකටම ප්‍රමාද ගාස්තු ගෙවීමේ මුදල් අපේ රටෙන් පිටට යන්නේ. ජේසීජේ එක විතරයි ශ්‍රී ලංකා වරාය අධිකාරියට. මේ ප්‍රමාද ගාස්තු ගෙවන්න වෙන්නේ ඔය භාණ්ඩ හිමිකරුවන්ටයි. එතකොට ඒ ප්‍රමාද ගාස්තුවත් අල්ලල තමයි ඔය ආනයනික බහලුම්වල ඒවා විකුණන්නේ. උදහරණයක් විදියට අල කන්ටේනර් එකක් ආවොත්, ඒ අල කන්ටේනර් එකට ප්‍රමාද ගාස්තුවක් ගෙවන්න සිද්ධ වුනොත් ඒකට එතකොට අල කිලෝ එකේ ගාණ වැඩි වෙනවා. සීනි ගෙනාවොත් සීනි කිලෝවක ගාණ වැඩිවෙනවා.''

ඔහු පවසන අන්දමට මෙහිදී ප්‍රමාද ගාස්තුව ලෙස විශාල මුදලක් දරන්නට සිදුවෙයි. දින තුනකට පමණක් වරායේ දින තුනක් නොමිලේ ලබා දුන්නද එම දින තුනට අමතරම වැඩිවෙන දිනයන්ට ඩොලර්වලින් අදළ ප්‍රමාද ගාස්තු ගෙවීමට ඔවුන්ට සිදුවෙයි. එහිදී අදළ භාණ්ඩවල ටොන් ගණන් අනුව බර තීරණය වෙන අතර ඒ අනුව අදළ ගෙවීම් කළ යුතුව තිබේ.

**මේ වන විට ඖෂධ, ආහාර වර්ග ආදිය කොපමණ ප්‍රමාණයක් වරායේ බහලුම්තුල හිරවෙලා තියෙනවා ද කියලා ගණනය කරලා තියෙනවද?**

විශාල ප්‍රමාණයක් තියෙනවා. එක් දිනකට පමණක් 2000 කට ආසන්න සංඛ්‍යාවක් වරායෙන් ආනයනික බහලුම් වෙනදට එළියට යනවා. නමුත් මේ වන විට 2000 ක් එසේ එළියට යන්නේ නැහැ.

**දිනකට බහලුම් ප්‍රවාහන රථ කොපමණ සංඛ්‍යාවක් රට පුරාම ධාවනය වෙනවද? අපි ඔහු විමසුවෙමු.**

"බහාලුම් ප්‍රවාහන රථ දිනකට අපේ සම්පූර්ණ බහලුම් ප්‍රමාණය 6000 ක් තියෙනවා. දිනකට අනිවාරේයන් 4000 කට ආසන්න ප්‍රමාණයක් ධාවනය වෙනවා. එතකොට ඉතුරු බහාලුම් ප්‍රවාහන රථ 2000 ට මොකද වෙන්නේ කියලා ඔබ අහයි. ඒවා සමහර තැන්වල අන්ලෝඩින් කරන්න ගිහාම එතැන ප්‍රමාදයක් සිද්ධ වෙනවා. ඊට අමතරව තව ලෝඩින් වලට ගිහාම එතැන ට්‍රේලර් එක තියලා එතැන දලා එනවා. සමහර ඒවා දවස් දෙක තුන යනවා. ඒ විදියට බඩු බෑම සහ පැටවීමට ගතවන කාලය සඳහා රථ ප්‍රමාණයක් හිරවෙනවා. දින දෙක තුන හතර වෙනවා. සමහර ඒවා එක්ස්පෝර්ට් යන කන්ටේනර්ස් තියෙනවා ඒවා විෂබීජහරණය කරන්න ඕනෑ. එසේ විෂබීජහරණය කරන්න ගිහාම සමහර විට ට්‍රක් එක උඩ තමයි ටැංකිය තියන්නේ එය දවස් තුනක් පමණ තියන්න වෙන අවස්ථා තියෙනවා. එසේ ප්‍රමාද වෙන ප්‍රමාණයක් තියෙනවා. එය තමයි ඒ බහාලුම් 2000 ක් ගැන කිව්වේ. දැන් මේ පවතින වටපිටාව තුළ බහාලුම් ප්‍රවාහන රථ ධාවනය වෙන්නේ. 2500 ක් විතර තමයි.



එක්සත් ලංකා බහාලුම් ප්‍රවාහන රථ හිමිකරුවන්ගේ සංගමයේ සභාපති

**සනත් මංජුල**

**බහාලුම් රථ රියැදුරන් කොපමණ සිටිනවාද? මෙයින් සෘජුව හා වක්‍රව යැපෙන පිරිස කොපමණ ද අපි ඔහු විමසුවෙමු.**

"මේ වන විට බහාලුම් රථ රියැදුරන් 6000 කට ආසන්න පිරිසක් ඉන්නවා. මෙහි වපසරිය ගත්තොත් මේකෙන් විශාල පිරිසක් වක්‍රානුකූලව යැපෙනවා. බහාලුම් ප්‍රවාහන රථ රියැදුරන්, රිය සහායකයින් ඔවුන්ගේ පවුල් වල අය, ඒ වගේම මේවා නඩත්තු සේවා පවත්වා ගෙන යන අය, ගාරාජ්, වෙයාර්හවුස් පවත්වා ගෙන යන අය, බඩු බෑම් පැටවීම් කරන පිරිස්, ඇතුළු විශාල පිරිසක් ඉන්නවා. යැපෙන පිරිස දෙලක්ෂ පනස්දහසකට ආසන්න සංඛ්‍යාවක් සිටිනවා.

බහාලුම් ප්‍රවාහන රථ සඳහා ඉන්ධන ලබා දෙන නිශ්චිත ක්‍රමවේදයක් නොමැති වීම නිසා පවතින ගැටලු ගණනාවක් ද ඔහු මෙහිදී පැහැදිලි කර සිටියේ, ඒවාට කඩිනම් විසඳුම් අදළ වගකිවයුතු පාර්ශවයන් විසින් ගත යුතුව තිබෙන බව ද අවධාරණය කරමිනි.

"ඕනෑම ඉන්ධන පිරවුම් හලකින් අපිට අවශ්‍ය ප්‍රමාණයට ඉන්ධන ලබා ගැනීමේ හැකියාව තිබුණා. මොකද අපේ අතේ තියෙන මුදල්වලටනේ ඉන්ධන ලබා ගන්නේ. කිසිම ඉන්ධන පිරවුම්හලකින් අපි ණයට ඉන්ධන ගන්නේ නැහැ. එවේලේ සල්ලි දීලා තමයි ඕනෑම පිරවුම්හලකින් අපි ඉන්ධන ගන්නේ. අපිට අවශ්‍ය ප්‍රමාණයට ඉන්ධන ලබා ගැනීමට සිටිය යුතුමයි. මම ට්‍රාන්ස්පෝටර් කෙනෙක් විදියට මම තමයි දන්නේ මගේ ට්‍රක් එක අද කොහාටද යන්නේ? මොකද අපි තමයි දන්නේ අවශ්‍ය ප්‍රමාණය. මම මේ ට්‍රක් එක අද අනුරාධපුරයට නැතහොත් දඹුල්ලට යවනවා නම් මම දන්නවා මේ ට්‍රක් එකට කොපමණ ඉන්ධන අවශ්‍යද කියලා. අපිට ඒ අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලබා දීලා තමයි යවන්නේ.

"බහාලුම් ප්‍රවහන රථවලට ඉන්ධන ලබා දෙන ක්‍රමවේදයක් අපිට කිසිම ආයතනයකින් පැහැදිලි කරලා නැහැ. අපේ මේ බිස්නස් එක පටන් ගන්නේ කොළඹින්. ඒ කියන්නේ අනිවාර්යෙන්ම ආනයනික හෝ අපනයන බහාලුමක් අපේ රථයට පටවා ගන්නේ කොළඹින්, බස්නාහිර පළාතෙන්. ආනයනික බහාලුමක්නම් අනිවාර්යෙන්ම කොළඹ වරායෙන්. අපනයන බහලුමක් හිස් බහාලුමක් අපි ගන්නේ බස්නාහිර පළාතෙන්. අපේ ජොබ් එක පටන් ගන්නෙත් බස්නාහිර පළාතෙන්. එක ජොබ් එකක් අවසන් කරන්නෙත් බස්නාහිර පළාතෙන්. ඒ නිසා අපි බලධාරීන්ට පැහැදිලි කළේ බස්නාහිර පළාතේ තෝරා ගත් ඉන්ධන පිරවුම්හල් කිහිපයක් අපිට වෙන් කරන්න කියලා. මොකද සිපෙට්කෝ ආයතනයට අයත් සමුපකාර ඉන්ධන පිරවුම්හල් තියෙනවා රජයේ අනුබද්ධ. සමුපකාර ඉන්ධන පිරවුම්හල් 10 ක් ප්‍රධාන මාර්ග ටිකට ඇතුළත් වෙන විදියට එනම් උදහරණයක් ගත්තොත් මීගමුවට ඉන්ධන පිරවුම් හල් තුනක් වෙන් කරන්නට හැකි නම් එය ඉතා හොඳයි. මොකද ඒ පළාතේ තමයි වැඩිම ආනයන අපනයන බහාලුම් ප්‍රමාණයක් ධාවනය වෙන්නේ. නුවර පාරට සිපෙට්කෝ ඉන්ධන පිරවුම්හල් තුනක්. අවිස්සාවේල්ල මාර්ගයට ඉන්ධන පිරවුම්හල් තුනක්, ගාලු පාරට ඉන්ධන පිරවුම්හල් තුනක් මේ ආකාරයට අපිට නම් කරලා දුන්නා නම් අනිවාර්යෙන්ම ඒ ඉන්ධන පිරවුම්හල් දහයේ ඉන්ධන අපිට ලැබෙනවා. කොළඹ වරායට ආසන්නව තියෙනව සමුපකාර ඉන්ධන පිරවුම්හල් විශාල ප්‍රමාණයක්. පැලියගොඩ මට්ටක්කුලිය කොටහේන දෙමටගොඩ නාරාහේන්පිට වත්තල කිරිබත්ගොඩ මේ පළාත් ආවරණය වෙන විදියට අපිට දුන්නොත් අපිට ලොකු සහනයක්.

"මේ තත්ත්වය වැඩිදුරටත් පැවතුනහොත් අනිවාර්යයෙන්ම භාණ්ඩ හිඟයක් සහතික ලෙසම ඇතිවෙනවා. මොකද වරායට දවසකට ආනයනික බහලුම් 2000 ක් වරායෙන් පිටතට යන්න අවශ්‍යයි නම්, අපිට එයින් ලබා දීමට හැකියාව තියෙන්නෙ 1000 ක් විතරයි. එහිදිත් මෙතැන අක්‍රමිකතා රැසක් සිදුවෙනවා. ඉන්ධන පිරවුම්හලකට ඉන්ධන ගන්න ගිහාම වෙනදට රුපියල් 15000 ක ඉන්ධන ඉල්ලුවොත් අපිට ඒ මුදලට ඉන්ධන දෙනවා. නමුත් අද ඉන්ධන පිරවුම්හල්වල තියෙන්නේ කාගේ නීතියක්ද කියලා අපි දන්නෙ නැහැ. ඉන්ධන පිරවුම්හල්වලින් තීරණයක් අරන් තියෙනවා රුපියල් 5000 යි 6000 යි උපරිම රුපියල් 10000 ක ඉන්ධන දෙන්නේ. එතකොට අනුරාධපුරයට මගේ ට්‍රක් එකක් අරගෙන යවන්න මට රුපියල් 20,000 ක ඉන්ධන අවශ්‍යයි නම් එතකොට මම ඒ මුදලට ඉන්ධන ගන්න ගිහාම එම ඉන්ධන පිරවුම්හලේ සේවකයා කියනවා දෙන්න බැහැ කියලා. කීයක් හෝ සන්තෝෂමක් දෙනවා නම් පුළුවන් කියලා එහෙම රුපියල් 2000 ක් අමතරව දුන්නහම රුපියල් 20,000 ක ඉන්ධන දෙනවා. එතැනත් අපි අමතර මුදලක් අර මනුස්සයාගේ සාක්කුවට දෙන්න ඕනෑ. ඒවා බලන්න කවුරුවත් නැහැ. නීතියක් නැහැ. මේවා බලන්න මැදිහත් වෙන්න. ඉන්ධන පිරවුම්හලේ කැමරා සවි කරලා තියෙන්නේ. ඉන්ධන පිරවුම්හල්වලට ඕනෑ ඕනෑ විදියට නීති රීති ගේන්න බැහැනේ. ඛනිජ තෙල් සංස්ථාවෙන් කියලා තියෙනවා නම් පාරිභෝගිකයා ඉල්ලන ප්‍රමාණයට ඉන්ධන නිකුත් කරන්න කියලා අනිවාර්යෙන්ම එම ප්‍රමාණය දෙන්න ඕනෑ. එහෙම නැත්නම් රජයෙන් කියන්න ඕනෑ ආනයන අපනයන ක්ෂේත්‍රයේ බහාලුම් ප්‍රවාහන රථයකට අවශ්‍ය ප්‍රමාණයට ඉන්ධන ලබා දෙන්න කියලා. අපි අවුරුද්දකට කොටේෂන් දලා තමයි ට්‍රාන්ස්පෝර්ට් එකක් අරන් තියෙන්නේ. උදහරණයකට ගත්තොත් ඒක ඉන්දියානු සමාගමක් වෙන්න පුළුවන් ඒක සිංගප්පූරු කොම්පැනියක් වෙන්න පුළුවන්. අපිට එම අදළ කොම්පැනියට කියන්න බැහැ මෙයාට මෙච්චර මුදලක් දීලා ඉන්ධන ගන්නවා කියල. අවුරුද්දකට අපි ගාණක් පොරොන්දු වුණාට පසුව අපි ඒක ගිවිසුමේ අත්සන් කරනවා. මෙපමණ මුදලකට තමයි අපි මේ මාස අය කරන්නේ. ඉන්ධන මිල වැඩිවුණොත් මේ ගාණ වැඩි කරන්න පුළුවන්. නමුත් මේ අර්බුදයක් ආවොත් කියලා අපි ඒ ගිවිසුමේ කොතැනකවත් සඳහන් කරලා නැහැනේ. ඒ වගේ විශාල ප්‍රශ්න ගොඩක් තියෙනවා. මේ විදියට ගියොත් මේ කර්මාන්තය කඩාගෙන වැටෙනවා."

සාකච්ඡාව

**පද්මිණී මාතරගේ**











# DIMO
## විශ්වාසයේ වාසිය

DIMO කෘෂි යන්ත්‍රෝපකරණ අංශය රට පුරා විසිරී සිටින සිය අලෙවි නියෝජිත ආයතන ඇගයීම සඳහා DIMO විශ්වාසයේ වාසිය නමින් උළෙලක් පසුගිය දා DIMO 800 ශ්‍රවණාගාරයේ පවත්වන ලදී. මෙහිදී DIMO කෘෂි යන්ත්‍රෝපකරණ අංශයේ අලෙවි නියෝජිත මහතුන් පනහකට අධික පිරිසක් සහභාගී වූ අතර 2020/2021 වර්ෂයේ ජාතික සහ ප්‍රාදේශීය වශයෙන් විශිෂ්ට අලෙවි දායකත්වයක් ලබා දුන් අලෙවි නියෝජිත ආයතන ඇගයීමට ලක්විය. වසරේ හොඳම අලෙවි නියෝජිත ආයතනය ලෙස AVP Motors ගලෙන්බිඳුනුවැව පත්වෙමින් රුපියල් මිලියනයක් දිනා ගත් අතර දෙවැනි ස්ථානය Blue Springs වවුනියාව හිමිකර ගනිමින් රුපියල් 750,000 දිනාගත් අතර කිළිනොච්චියේ One -dan traders තෙවන ස්ථානය හිමිකර ගනිමින් රුපියල් 500,000 හේ ජයග්‍රාහකයා බවට පත්විය.


























SLIIT ACADEMY

In partnership with LIVERPOOL JOHN MOORES UNIVERSITY | University of Bedfordshire

ලොවක් දිනන ඔබේ ඉදිරි පියවර

අ.පො.ස. උසස් පෙළින් පසු SLIIT Academy සමග විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පිළිගත් පුළුල් ඉගෙනුම් පරාසයක පැතිරුනු අධ්‍යාපන වැඩසටහන් අතරින් මහා බ්‍රිතාන්‍යයේ බෙඩ්ෆෝර්ඩ්ෂයර් හෝ ලිවර්පූල් ජෝන් මුවර්ස් විශ්ව විද්‍යාලයන්ට අනුබද්ධ උපාධි පාඨමාලා හැදෑරීමට ඔබට අවස්ථාවක්.

2022 මාර්තු බඳවා ගැනීම් ආරම්භකර ඇත!

මෙවර අ.පො.ස උසස් පෙළ විභාගයෙන් පසු ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින සිසුන්ටද අයදුම් කල හැක.



අ.පො.ස උ.පෙළ සාමාර්ථ 1 හෝ 2 සහිත සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ, ව්‍යාපාර අංශයෙන් විදේශීය උපාධියක් ලබා ගත හැක.

උපාධි පාඨමාලා වසර 3

- විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යාව සහ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව
- විද්‍යාවේදී (ගෞරව) පරිගණක ජාලගතකරණය
- ශාස්ත්‍රවේදී (ගෞරව) ව්‍යාපාර පරිපාලනය
- විද්‍යාවේදී (ගෞරව) මානව සම්පත් කළමනාකරණය UOB
- BEng (ගෞරව) ඉලෙක්ට්‍රොනික් සහ විදුලි ඉංජිනේරු විද්‍යාව LJMU

අවම සුදුසුකම්

තොරතුරු තාක්ෂණය / ව්‍යාපාර කළමනාකරණය
අ.පො.ස. උසස් පෙළ ඕනෑම විෂය ධාරාවකින් එක් විෂයක් පමණක් සමත් වීම.

ඉංජිනේරු විද්‍යාව
උසස් පෙළ ගණිතය, තාක්ෂණවේදය හෝ ජීව විද්‍යාව විෂයය ධාරාවෙන් අවම වශයෙන් විෂයන් 3ක් සමත් වීම.
උසස් පෙළ විෂයන් තුනකට අඩු සිසුන්ටද ඇතුළත් විය හැක.
ඔවුන් ඒ සඳහා විශේෂිත වූ තේරීම් පරීක්ෂණයකින් සමත්විය යුතුය.

අභියෝග්‍යතා පරීක්ෂණය

2022 මාර්තු 19
පෙ.ව. 10.00 - 11.00
13th Floor, BOC Merchant Tower, 28 , St. Michael's Road, Colombo 03.

වැඩි විස්තර සඳහා 0772 66 55 55

www.sliitacademy.lk @ sliitacademy@sliit.lk

onlinegraphic.lk




කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී